2026 ජනවාරි - අප්‍රේල්
08 වෙළුම 02 කලාපය
ISSN 2279 - 1027
මිල රු.200/=

අරගලයට අවි තනන

# Left

# අරමුණු තරණය



අරගලයට
අවි තනන
# Left
න්‍යායික දේශපාලන සඟරාව

2026 ජනවාරි - අප්‍රේල්
08 වෙළුම
02 කලාපය
ISSN 2279 - 1027

**ප්‍රධාන සංස්කාරක**
මංජුල වික්‍රමසිංහ



**කර්තෘ මණ්ඩලය**
චන්ද්‍රික අධිකාරී
රමිදු පෙරේරා
වෛද්‍ය සුසිල් රණසිංහ
සුජීව දිසානායක
බිමල් රත්නායක
විශාකා අබේරත්න
ප්‍රියදර්ශන දයාරත්න



**පරිගණක පිටු සැකසුම**
නයනී එරන්දිකා

**මුද්‍රණය**
ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස්
43/43, වලව්වත්ත පාර,
ගංගොඩවිල, නුගේගොඩ.



**විමසීම්**

0777 802 707
magazineleft@gmail.com


## පෙළගැස්ම


| | |
|---|---|
| අරගලය අත්දැකීම් | 04 |
| සමාජ පරිවර්තනයක සැබෑ අභියෝග | 15 |
| අලුත් රට සහ පරණ මාධ්‍ය | 20 |
| වෙනස අවැසි නම් | 29 |
| කැඩෙන බිඳෙන හැදෙන ලෝකය | 35 |
| ජීවිතයට ප්‍රහර්ෂය සොයා | 44 |
| දැනුමෙන් ඔබ්බට | 50 |
| කවි | 55 |
| පාර දිගේ | 58 |




## ඉදිරියට යන මිනිසා



වතිකානු කෞතුකාගාරයේ දහසක් නිර්මාණ අතර Stanza della Segnatura නමින් හැඳින්වෙන කාමරයේ ඉතාලි පුනරුදයේ විශිෂ්ට කලාකරුවකු වූ රෆායෙල් (Raphael)ගේ චිත්‍රයක් වේ. එහි නම 'The School of Athens' (1509 - 1511) ය. එහි වම්පසින් මහලු ප්ලේටෝද, ඔහුට දකුණුපසින් තරුණ ඇරිස්ටෝටල්ද වේ. ප්ලේටෝ තම දකුණතින් ඉහළ (දෙව්ලොව) පෙන්වන අතර, ඇරිස්ටෝටල් තම දකුණු අතින් පහළ (පොළොව) පෙන්වයි. දෙදෙනාගේම වම් අත්වල පොත් දෙකක්ද වන අතර, ප්ලේටෝ අත ඇති පොත 'Timaeus'ද, ඇරිස්ටෝටල් අත ඇති පොත 'Nicomachean Ethics'ද වේ. ප්ලේටෝ සැබෑ යථාර්ථය ඇත්තේ, සැබෑ සත්‍යය ඇත්තේ, මිනිස් සමාජයෙන් වෙනස් වූ පරමාදර්ශී වේදයිත තුළය යන මතයද, ඇරිස්ටෝටල් සැබෑ යථාර්ථය සහ සත්‍යය ඇත්තේ, මිනිස් සමාජය තුළ භෞතික ජීවිතය තුළ යන මතයද සහිතව තර්ක කරති. ප්ලේටෝ විශිෂ්ට බුද්ධිමතකු ලෙස ලෝකය තුළ තහවුරු වූ අතර, ඇරිස්ටෝටල් ඔහුගෙන් පසු එළැඹි ඊළඟ වසර 2,000 තුළම රාජ්‍ය පාලනයේ සිට භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව දක්වා සියලු විද්‍යාවල පුරෝගාමියා විය. ඇරිස්ටෝටල්ගේ මරණින් වසර 1,800කට පසු මහලු ප්ලේටෝට එදිරිව 1509දී රෆායෙල් විසින් ඇරිස්ටෝටල් තරුණයාව, ප්‍රබලව ඉදිරිපත් කරන්නේ දෙව්ලොව පරදා පෘථිවියද, මනඃකල්පිත දෙවියන් පරදා මිනිසාද ජය ගත් බවයි. වසර දහස් ගණනක් තිස්සේ ගත වන සෑම දිනයක්ම තරුණ ඇරිස්ටෝටල් මඟින් නිරූපිත ආකාරයට නව මිනිසා අභියෝග දිනමින් ඉදිරියට යයි. ඒ අනුව ගත් විට මෙම චිත්‍රය සදාකාලික අරගලයත්, එහි ඉදිරි ගමනත් නිරූපණය කරයි.

මෙවර Left තේමාව ලෙස ශ්‍රී ලංකාවේ ජනතා අරගලය සහ ලෝකයේ ජනතා

අරගලයන්හි ස්වභාවය පිළිබඳව සකස් කෙරුණද, සඟරාවේ ලිපි සංස්කරණය වන අවධියේදී අප රට දැවැන්ත ස්වාභාවික ව්‍යසනයකට ගොදුරු විය. එනිසාම සඟරාවේ සංස්කරණ සහ මුද්‍රණ කටයුතු මාස කිහිපයකින් කල් දැමීමට සිදු වූ අතරම, කතුවැකිය ලියන අවස්ථාව වන විට ලෝක යුද තත්ත්වයක් නිර්මාණය වී එහි සෘජු සහ වක්‍ර බලපෑමට අප රටද ලක් වන තත්ත්වයකට පත් වී තිබේ. එම නිසා සඟරා තුනකින් පමණ සාකච්ඡා කළ යුතු - විශ්ලේෂණය කළ යුතු - තරම් ප්‍රබල අනුභූතීන් ගණනාවක් මෙම කලාපය එළිදක්වන මොහොත වන විට පාඨකයා බලාපොරොත්තු වන බව පැහැදිලිය. එහෙත්, ඉහත සඳහන් අනුභූතීන් තුනම - ලංකාවේ ජනතා අරගලය, ස්වාභාවික ව්‍යසනය සහ ලෝක යුද තත්ත්වය - යන තුනම ‘ඇතැන්ස් පාසලේ චිත්‍රය’ මඟින් ප්‍රකාශ කරන්නා සේ ශ්‍රී ලංකාවේ ජනතාව මෙම ‘තමාට පාලනය කළ නොහැකි ඉහළ බලවේග’ සමඟ කරනු ලබන මෙම අරගලය පිළිබඳ චිත්‍රයකි.

2024 සැප්තැම්බර් මස 21 වැනි දින පැවැති ජනාධිපතිවරණය පිළිබඳව සැලකුවහොත්, ශ්‍රී ලංකාව වසර 450ක සෘජු යටත්විජිත පාලනයට (ඉහළ බලවේග) එරෙහිව හා 1948 සිට ‘ප්‍රභූන්’ යනුවෙන් තමන්ම හිරිකිතයකින් තොරව හඳුන්වා ගන්නා ශ්‍රී ලංකාවේ පාලකයන් (ඉහළ බලවේග) සමඟ කරන ලද සටනින් ‘මහපොළොව - නිර්ප්‍රභූන්’ ජය ගැනීම සංකේතවත් කරන ප්‍රබල අවස්ථාවකි. එමෙන් ම එම ජයග්‍රහණයෙන් මාස 18ක් ගෙවෙන මේ මොහොත වන විට නිර්ප්‍රභූ ජනතා අරගලය රට ආර්ථික, දේශපාලන, සමාජයීය සහ ජාත්‍යන්තර යන සෑම තලයකින් ම ‘ඉහළ බලවේගවල’ පාලනයට වඩා නිර්ප්‍රභූ, පහළ පාන්තික පාලනය සෑම අතින්ම විශිෂ්ට බව ඔප්පු කරමින් තිබේ. එම ‘ඉහළ බලවේග’ විසින්ම නිර්මිත ආර්ථික වර්ධනයේ, ප්‍රජාතන්ත්‍රවාදයේ, යහපාලනයේ, දූෂණ විරෝධයේ, මූල්‍ය විනය ආදී සියලුම අගැයීම් කඩඉම් එය විසින් ඉක්මවා තිබේ.

2025 වසරේ ඇති වූ ‘දිට්වා’ සුළි කුණාටුව පසුගිය දශක ගණනාව තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් ප්‍රබලම ස්වාභාවික ව්‍යසනය විය. දිස්ත්‍රික්ක 25න් 23කටම බලපෑ එය ජීවිත 900කට ආසන්න ප්‍රමාණයක් සහ ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1ක් සහ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 4කට ද වැඩි විනාශයක් සිදු කරන ලද්දකි. ‘දිට්වා’ ව්‍යසනයේ බලපෑම තවම අවසන් නැතත්, එහි මුදා ගැනීම් කටයුතු, එහි තාවකාලික ප්‍රතිසංස්කරණ අදියර මාස දෙකක් යාමට මත්තෙන් අවසන් කර දැන් එය ස්ථිර නිවාස අහිමි වූවන්ට නිවාස ඉදි කිරීම පවා ආරම්භ කරමින්, ස්ථිර ගොඩනැඟීම්වල අදියරට පැමිණෙමින් තිබේ. ආර්ථික අර්බුදයකින් යාන්තමින් ගොඩ එමින් තිබෙන රටකට සියයට 4ක දළ දේශීය නිෂ්පාදිතයේ විනාශයක් සහිත ස්වාභාවික ව්‍යසනයක් යනු පහළ බලවේගවල සටන් කිරීමේ ශක්තිය නොවන්නට තවත් හයිටියක් (ඉහළ බලවේගවල මැදිහත් වීම මත - Humantarian Imperialism) වීමෙන් අවසන් වීමට තිබූවකි. හයිටියටද වඩා ලෝක භූ දේශපාලන අරගලයේ ඉතා ම වැදගත් රටක් වන ශ්‍රී ලංකාව හයිටියක් නොවී තිබෙන්නේද ‘පොළොවේ ශක්තිය’ නිසා මිස ‘ඉහළ බලවේගවල’ ශක්තිය මත නොවේ.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදී වුවමනාව මත ඉරානයට එල්ල කරන ලද එක්සත් ජනපද - ඊශ්‍රායල් ප්‍රහාරය මඟින් ඇති වී තිබෙන ලෝක යුද සහ අස්ථාවර තත්ත්වය ශ්‍රී ලංකාවට විශේෂයෙන් බලපායි. ලංකාවට විදේශ විනිමය ලැබෙන රැකියාවල නියුතු විශාල පිරිසක් මැදපෙරදිග කලාපයේ සිටින අතර, ඔවුනගේ ආරක්ෂාවට සහ ප්‍රේෂණවලට මෙම යුද්ධය සෘජුව බලපා තිබේ. ලංකාවට සංචාරකයන් පැමිණෙන ප්‍රධානම ගුවන්තොටුපොළවල් මැදපෙරදිග ගුවන්තොටුපොළවල් වන බැවින්, ඒවායේ අස්ථිර බව ලංකාවේ සංචාරක කර්මාන්තයට බලපා තිබේ. එමෙන්ම ලොව ප්‍රධාන ම ඛනිජ තෙල් නිෂ්පාදන කලාපය තුළ ඇති වී තිබෙන මෙම අස්ථාවරභාවය නිසා ඛනිජ තෙල් මිල සහ ගෑස් මිල ඉහළ යාමේ අර්බුදයකටද ලංකාව පත්වෙමින් ඉඩ තිබේ. මීට අමතරව ඉන්දියාවේ යුද අභ්‍යාසයක් සඳහා පැමිණි ඉරාන නාවික හමුදා යාත්‍රාවකට ජාත්‍යන්තර මුහුදේ ශ්‍රී ලංකාව විසින් මුදාගත යුතු කලාපය තුළ දී පහර දීම නිසා එම නාවිකයන් මුදා ගැනීමත්, දෙවැනි ඉරාන යාත්‍රාවේ නිලධාරීන් 208ක් කොළඹ වරායට රැගෙන ඒමත් නිසා මෙම යුද්ධය අප රටට සෘජු සහ දැඩි බලපෑමක් කර ඇත. කතුවැකිය ලියා අවසන් කරන මොහොත වන විට 'ඉහළ බලවේග' විසින් ඇති කරන ලද වියවුල නිර්ප්‍රභූ බලවේගවල මැදිහත් වීම මත ශිෂ්ටසම්පන්න, මානුෂීය සහ ජාත්‍යන්තර සම්මුති මත පිහිටා කටයුතු කිරීම තුළින් සැලකිය යුතු විනාශයක් සිදු වීම වළක්වා තිබේ.

ලොව තුළ ධනවාදය, අධිරාජ්‍යවාදය පවතින තාක් කල් 'ඉහළ බලවේග' විසින් ඇති කරනු ලබන වියවුල් ජාතිකවත්, ජාත්‍යන්තරවත් පැවතීම නියතයක් වේ. එම 'ඉහළ බලවේගවල' දුෂ්ට ක්‍රියා, ප්‍රහාර සහ විවේචන මහපොළොවේ සාමාන්‍ය ජනතාවගේ කල්ක්‍රියාවන් මත තීරණය වන්නේ අවම වශයෙනි. වෙනිසියුලාවේ, කියුබාවේ අත්දැකීම්වලින්ද සනාථ කෙරෙන්නේ සූර්ය කුණාටු ඇති කරන්නේ පෘථිවියේ නරක හැසිරීම නිසා නොවන පරිදි මෙනි. එය සූර්යයාගේම අභ්‍යන්තර නියත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් මෙන්ම යුද්ධ, අස්ථාවරත්ව, ආක්‍රමණ, ව්‍යසන, අසාධාරණ වෙළෙඳ ගිවිසුම්, පරිසර විනාශ ආදියද අධිරාජ්‍යවාදයේම නිසැක නිපදවීම්ය. එම නිසා සූර්ය කුණාටුවලින් ආරක්ෂා වී ඒවා පරාජයට පත් කරමින්, ජනයා පොරොන්දු දේශයට ගෙන යා හැක්කේද ජනතාවටමය. වඩාත් නිවැරැදිව කියන්නේ නම්, සංවිධානය වූ සවිඥානක ජනතාවටමය.

මෙවර Left අපරාජිත පෘථිවියේ බලය වෙනුවෙනි!

අපරාජිත නිර්ප්‍රභූ ජන බලය වෙනුවෙනි!!

අපරාජිත සංවිධානාත්මක ජනතා ව්‍යාපාරය වෙනුවෙනි!!!



# අරගල! ලංකාවේ සහ ලෝකයේ අත්දැකීම්...

***වෛද්‍ය නජිත් ඉන්දික***

'අරගලය' යන වචනය මේ වනවිට ලංකාවේ බාලමහලු සියලු දෙනාගේ හදවතට කිඳා බැස ඇති වචනයකි. ඒ 2022 වසරේ ලංකාව ආර්ථිකව කඩාවැටුණු රාජ්‍යයක් බවට පත්වූ පසු පැනනැගුණු විශාල සහ ඓතිහාසික ජනතා අරගලය හේතුවෙනි. දශක ගණනක් රට පාලනය කළ, එතෙක් පැවති ප්‍රධාන දේශපාලන කඳවුරු දෙකේ අසමත් හා අතිශය දූෂිත පාලනය අවසානයේ කාලයක් තිස්සේ සිදුකළ වැරදි මූල්‍ය පාලනයේ හා ආර්ථිකයට දරාගත නොහැකි මට්ටමේ දූෂණයේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසර ආරම්භ වනවිට ලංකාව විදෙස් සංචිත බිඳවැටුණු, අත්‍යවශ්‍ය සේවාවන් නිසි පරිදි ලබාදිය නොහැකි, දිනකට

පැය ගණනක් විදුලිය විසන්ධි කෙරෙන, ඉන්ධන පෝළිම්වල දින ගණන් රැඳීමට සිදුවුණ, උද්ධමනය පිම් පනිමින් ඉහළ ගිය තත්ත්වයක් ගොඩනැගුණි. අනතුරුව කුපිත වූ ජනතාව දහස් ගණනින් වීදිවලට එකතු වී ගෝඨාභය රාජපක්ෂ පාලනයට විරෝධය දැක්වීමත්, අඛණ්ඩ සහ නොනවතින අරගලයක් වෙනුවෙන් ගෝල්ෆේස් භූමියේ කඳවුරු ලා ගැනීමත්, ඊට සමගාමීව රට පුරා ගම් සහ නගරවල නොනවතින උද්ඝෝෂණ මාලාවන් සංවිධානය කිරීමත් සිදුවිය. විශේෂයෙන්ම පසුගිය දශක දෙකක කාලයෙන් වැඩි ප්‍රමාණයක් රට පාලනය කළ හා එවකටත් ජනාධිපති හා අගමැති ඇතුළු රජයේ මූලික වගකීම් දරමින් සිටි 'රාජපක්ෂ රෙජීමයට' එරෙහි විරෝධය මේ තුළ ගොනු වූ අතර ජනාධිපති හා අගමැති තම ධුරයන්ගෙන් ඉල්ලා අස්වන ලෙසට බල කළ ජනතාව, එම ඉල්ලීම් ජයග්‍රහණය කරන තෙක් අඛණ්ඩව මාස කිහිපයක් විරෝධතාවල නිරත විය. මෙහිදී රාජපක්ෂ රෙජීමයට එරෙහිව විරෝධතාවයට අනෙකුත් සියලුම පාහේ විපක්ෂ දේශපාලන පක්ෂවලද නොමද සහය හිමිවිය. උදාහරණයකට එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගෙන් අනතුරුව, රාජපක්ෂලාගේ පක්ෂයේ සහයෙන් අනුප්‍රාප්තික ජනාධිපති බවට පත්වූ රනිල් වික්‍රමසිංහගේ එජාපය පවා රනිල් ජනාධිපති වනතෙක් මෙහි සක්‍රිය ක්‍රියාකරුවන් විය. (අනතුරුව ඉන් ඉවත්වී අරගලයට එරෙහිව කටයුතු කරනු ලැබුවේද ඔවුන්ය)

කෙසේ නමුත් මාස කිහිපයකට පසු රනිල් වික්‍රමසිංහ ජනතාව විසින් පලවා හරින ලද රාජපක්ෂලාගේම අනුග්‍රහයෙන් පාර්ලිමේන්තුව හරහා ජනාධිපති වී ආණ්ඩුවක් පිහිට වූ පසු ජනතාව සහ තරුණ ක්‍රියාකාරීන් මූලිකව සිදුකළ වීදි අරගලයද අවසන් කෙරිණි. ඒ, ඊට මසකට දෙකකට පෙර අරගලයේ පාර්ශ්වකරුවන්ව සිටි රනිල් හිතවාදීන් ඇතුළු පිරිසගේ අනුග්‍රහයෙන් දෙවන වරටත් සිදුකෙරුණු සාහසික ප්‍රහාරයකින් අනතුරුවයි. අරගලයට පළමු ප්‍රහාරය මහින්ද රාජපක්ෂගේ සෘජු අනුග්‍රහයෙන් ඔහුගේ මූලිකත්වයෙන් අගමැති නිල නිවසට එකතු කළ පාක්ෂික පිරිස් ඇතුළු මැර කණ්ඩායම් විසින් 2022 මැයි 09 වනදා සිදුකෙරිණි. රාජපක්ෂවරුන්ට බලය අතහැරීමට සිදුවූයේ එම සිදුවීමෙන් පසුවය.

ඉන්පසු ඉතිහාසය අපි සියලුදෙනා දනිමු. රනිල් වික්‍රමසිංහ විසින් අර්බුදයේ සියලු බර ජනතාව පිට පැටවීමත්, පෙර සිටි දූෂිත වළල්ලම ඇමති තනතුරුවලට පත්කිරීමත්, අනතුරුව ජනතා ව්‍යාපාරයක් ලෙස වර්ධනය වෙමින් පැමිණි ජාතික ජනබලවේගය විසින් ජනාධිපතිවරණය සහ සෙසු මැතිවරණ වසර දෙකකට පසු ජයග්‍රහණය කර පැවති දූෂිත පාලනය අවසන් කර, මෙතෙක් රට පාලනය කළ බහුතරයක් දේශපාලඥයන්ට පාර්ලිමේන්තු අසුන පවා අහිමි වන තත්ත්වයක් නිර්මාණය කිරීමත් පසුකරමින් අපි අද දවස කරා පැමිණ සිටිමු.

ලංකාවේ සිදුවූ මෑත කාලීන අරගලයේ සාරාංශය මෙයය.

මේ අරගලය ඇතුළු මෑත කාලීනව ගෝලීයව පැනනැගුණු මෙවන් අරගලවල විශේෂත්වය වන්නේ ඒවා එක් දේශපාලන පක්ෂයක් හෝ සන්ධානයක් මූලිකව කැඳවනු ලැබුණු ක්‍රියාමාර්ගයක් නොවීමය. මෙම අරගල මූලිකවම තරුණ කොටස් ප්‍රමුඛ කරගත් පොදු ජනතාවගේ මූලිකත්වයෙන් ඇරඹී ක්‍රියාත්මකවීම දැකගත හැකියි. ඒ නිසාම වෙනදා සිදුවන දේශපාලන පක්ෂ මූලික කරගත් විරෝධතා ව්‍යාපාරවලට එකතු කරගත නොහැකි ආකාරයට සාම්ප්‍රදායික සීමාවලින් ඔබ්බට ගොස් පුළුල් සමාජ තීරු ඒ වටා ඒකරාශි කරගැනීමට මෙන්ම අන් කිසිදා සක්‍රිය දේශපාලන

> මේ අරගලය ඇතුළු මෑත කාලීනව ගෝලීයව පැනනැගුණු මෙවන් අරගලවල විශේෂත්වය තමයි ඒවා එක් දේශපාලන පක්ෂයක් හෝ සන්ධානයක් මූලිකව කැඳවනු ලැබුණු ක්‍රියාමාර්ග යක් නොවීමය. මෙම අරගල මූලිකවම තරුණ කොටස් ප්‍රමුඛ කරගත් පොදු ජනතාවගේ මූලිකත්වයෙන් ඇරඹී ක්‍රියාත්මකවීම දැකගත හැකියි. ඒ නිසාම වෙනදා සිදුවන දේශපාලන පක්ෂ මූලික කරගත් විරෝධතා ව්‍යාපාරවලට එකතු කරගත නොහැකි ආකාරයට සාම්ප්‍රදායික සීමාවලින් ඔබ්බට ගොස් පුළුල් සමාජ තීරු ඒ වටා ඒකරාශි කරගැනීමට මෙන්ම අන් කිසිදා සක්‍රිය දේශපාලන ක්‍රියාකාරීත්වයකට නොපැමිණි සමාජ කොටස් ඒ වටා එකතුවීම මෙහිදී දැකගත හැකියි.




ක්‍රියාකාරීත්වයකට නොපැමිණි සමාජ කොටස් ඒ වටා එකතුවීම මෙහිදී දැකගත හැකිය. ඒ නිසාම මහා ජනගංගා ඒකරාශි කරන, විශාල සහ බලසම්පන්න බලවේගයක් බවට පැතිර යන ස්වභාවයක් මෙම ජනතා අරගල තුළ ගැබ්ව තිබේ. පිරිස් ඒකරාශි කිරීමේදී මෙන්ම සටන්කාමී අදහස පැතිර යැවීමේදී සමාජ මාධ්‍ය බහුලව යොදාගැනීම නිසා විසිරී සිටින ජනකොටස් එක් සරල සටන් පාඨයක් හෝ කිහිපයක් වටා ඒකරාශි කිරීම පහසු වී ඇත. සෘජුව පක්ෂයක් හෝ සංවිධානයක් මූලික නොවී ඇවිල යන මෙවැනි මාදිලියේ ජනතා අරගල දෙදහසෙන් පසුව, සමාජ මාධ්‍යයන්ගේ හා අන්තර්ජාලයේ පුළුල් වීම හා සමගාමීව දැක ගැනීමට ලැබීමෙන්ම මේ ජනතා අරගල සඳහා සමාජ මාධ්‍යන්ගේ බලපෑම කෙතරම්දැයි මැනගත හැකිය.

මේ සියල්ල සමඟින්ම අරගල පිළිබඳව ලංකාවේ අත්දැකීම අප තුළ අධිනිශ්චය වී තිබෙන යුගයක මෙම ලිපියේ අරමුණ වන්නේ ලංකාවේ අත්දැකීම මෙන්ම ගෝලීයව මෙවන් අරගලවල අත්දැකීමද සවිස්තරාත්මකව සාකච්ඡාවට බඳුන් කිරීම මගින් මේ අරගල මාදිලිය පිළිබඳව විද්‍යාත්මක විශ්ලේෂණයක් සිදුකර ගැනීමයි.

එම නිසා නැවතත් මෙම ලිපිය අවසානයේ ලංකාවේ අත්දැකීම සාකච්ඡාවට ගැනීමේ බලාපොරොත්තුවෙන් අපි 'අරගල' පිළිබඳ ලෝකයේ මෑත කාලීන අත්දැකීම් සමුදාය පිළිබඳව විමසා බලමු.

### තරුණ පොදු ජන අරගලයන්ගේ ගෝලීය සම්ප්‍රාප්තිය

දශක කිහිපයකට පසුව 2008 වර්ෂය වන විට ගෝලීය මූල්‍ය අර්බුදයක් පුපුරා යනවා. විශේෂයෙන්ම 1970 දශකයේ ලෝක ආර්ථික අර්බුදයට පසුව බරපතළම ගෝලීය මූල්‍ය අර්බුදය ලෙස හැඳින්වූ මේ අර්බුදය මුල් වටයේ සහ මූලිකවම බලපාන්නේ ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු බටහිර ලෝකයටයි. විශේෂයෙන්ම මූල්‍ය ප්‍රාග්ධනය මත පමණට වඩා බර තැබීමක් කර තිබූ තත්ත්වයක් තුළ දැවැන්ත බැංකු පද්ධති සහ මූල්‍ය ආයතන පළමු වටයේ ප්‍රහාරයට ලක්විය. අනතුරුව එය විශාල සමාගම් දක්වාද කල්නොයා පැතිර ගියා. 1990 දී සෝවියට් රුසියාව ඇතුළු නැගෙනහිර යුරෝපීය සමාජවාදී රාජ්‍ය පද්ධතිය බිඳ වැටීමෙන් අනතුරුව ප්‍රාග ්ධනයට ලෝක ගෝලයේ එතෙක් අවහිරව තිබූ ඉතිරි අර්ධයත් විවර වීම මගින් අත්පත් කරගත් වර්ධනීය ගමනේ තීරණාත්මක කඩඉමක් මෙම අර්බුදය හරහා සලකුණු කෙරිණි. එහිදී විශාල

වශයෙන් බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ගැටගැසී තිබූ පහළ සහ මධ්‍යම පාන්තික ජනතාවගේ නිවාස, කුඩා ව්‍යාපාර වැනි දේපළ අහිමිවීම සිදුවිය. එමෙන්ම අර්බුදය කළමනාකරණය කිරීමට එම රාජ්‍යයන් විසින් මහා පරිමාණ සමාගම්වලට රාජ්‍ය මුදල් විශාල වශයෙන් පොම්ප කිරීමට කටයුතු කළේය. එම තත්ත්වය තුළ සිදු වූයේ පැනනැඟුනු ජනතා අසහනය විශාල වීදි අරගලයන් ලෙස පුපුරා යාමය.

### ඇමෙරිකා එක්සත් ජනපදය

2009 වසරෙන් ආරම්භ වී ඊළඟ වසර කිහිපයේදී දිගහැරුණු මෙම ජනතා අරගල පළමුවරට සමාජ මාධ්‍ය ඔස්සේ සංවිධානය වෙමින්, සෘජු දේශපාලන නායකත්වයක් රහිතව සමාජ ක්‍රියාකාරීන්ගෙ න් සහ විශාල වශයෙන් සාමාන්‍ය ජනතාවගෙන් යුක්ත වූ අරගල මාදිලියක නව ආරම්භයක් විය. එසේ වර්ධනය වූ අසහනයන් 2011 වසර වනවිට එක්සත් ජනපදයේදී Occupy Wall Street (වෝල් වීදිය අල්ලා ගනු) යන ප්‍රධාන සටන් පාඨය ඔස්සේ අරගලයක් ලෙස මතුපිටට පැවතියේය. 'වෝල් වීදිය' යනු ඓතිහාසිකවම එක්සත් ජනපදයේ නිව්යෝක් නගරයේ තිබෙන මූල්‍ය ආයතනවල මූලස්ථානයයි. මෙම අරගලයේ සටන් පාඨ මූලිකවම පහළ පාන්තික ජනතාවගේ පීඩනය සහ පවතින ක්‍රමයට විරෝධය ප්‍රකාශ කරන්නක් වුණා. නමුත් 'වෝල් වීදිය අල්ලා ගැනීම' සටන් පාඨය යටතේ මාස ගණනක් නගරයේ කඳවුරු බැඳගෙන ජනතාව සිදුකළ අරගලය වෝල් වීදිය අල්ලා නොගෙනම අවසන් විය. එසේ පැනනැඟුනු ජනතා ව්‍යාපාරයේ අභිලාෂයන් නියෝජනය කරන දේශපාලන ප්‍රවණතා ඩිමොක්‍රටික් පක්ෂයේ බර්නි සැන්ඩර්ස් වැනි නායකයන් යම් ප්‍රමාණයකට ඉහළට එසවීමෙන් සීමාවිය. එමෙන්ම එම අරගලයේ බලපෑම සහ ආර්ථික අර්බුදයේ බලපෑම විසින් යුරෝපය ඇතුළු රටවල් 80 කට වැඩි ප්‍රමාණයක ජනතා ක්‍රියාකාරීත්වයට මෙය බලපෑවා. සමාජ මාධ්‍යයන් ලෙස එවකට පැවති Twitter සහ 'ඔකියුපයි ගැලරිය' ජනතාව සංවිධානය කිරීමට බහුලව යොදාගනු ලැබිණි.

### යුරෝපය

2008 ආර්ථික අර්බුදය පුපුරායාම හමුවේ බලපෑමට ලක්වූ තවත් ප්‍රධානතම රටවල් කිහිපයක් වන්නේ යුරෝපයේ සාපේක්ෂව දුර්වල ආර්ථිකයක් පැවති ස්පාඤ්ඤය හා ග්‍රීසිය වැනි රටවල්ය.

විශේෂයෙන්ම අර්බුදය කළමනාකරණය කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, යුරෝපානු බැංකුව සහ යුරෝපා සංගමය සමඟ එක්ව කප්පාදු වැඩපිළිවෙළකට ඇතුළු වීමට මෙම රටවල තිබුණු සාම්ප්‍රදායික පක්ෂ විසින් මෙහෙයවූ ආණ්ඩුවලට බලකෙරිණි. එමෙන්ම තත්ත්වය පාලනය කිරීම සඳහා පහළ පාන්තික ජනතාව තව දුරටත් ආර්ථිකයෙන් විතැන් කෙරෙන ව්‍යුහාත්මක වෙනස්කම්ද ඔවුන් විසින් යෝජනා කරන ලදී. මේ තත්ත්වය හමුවේ ග්‍රීසිය, ස්පාඤ්ඤය, අයර්ලන්තය වැනි රටවලද විශාල ජනතා අරගල පැනනැග්ගේය. මාස ගණන් නොව අවුරුදු ගණන් වීදිවල ඇවිළ යන වාඩිලාගත් සටන් මෙම රටවල ඇතිවිය. පෙර පරිදිම සමාජ මාධ්‍යයන් මූලික කරගත් මෙම අරගලයන්ට යුරෝපයේ පොහොසත්ව පැවති වාමාංශික හා ප්‍රගතිශීලී පක්ෂ හා සංවිධානද සිය දායකත්වය සැපයීය. මෙහිදී හඳුනාගත හැකි විශේෂ කරුණක් වන්නේ අරගල ඇවිලගොස් පසුකාලීනව ඒ පසුබිම මත එම අරගලවල අභිලාෂයන් නියෝජනය කළ විකල්ප, එමෙන්ම වඩා පුළුල් දේශපාලන පක්ෂ යුරෝපයේ බිහිවීමයි. එක් අතකින් අර්බුද තත්ත්වය හමුවේ අර්බුදයට ජාතිවාදී විසඳුම් යෝජනා කළ, විශේෂයෙන්ම සංක්‍රමණික විරෝධී


“

2009 වසරෙන් ආරම්භ වී ඊළඟ වසර කිහිපයේදී දිගහැරුණු මෙම ජනතා අරගල පළමුවරට සමාජ මාධ්‍ය ඔස්සේ සංවිධානය වෙමින්, සෘජු දේශපාලන නායකත්වයක් රහිතව සමාජ ක්‍රියාකාරීන්ගෙන් සහ විශාල වශයෙන්වූ සාමාන්‍ය ජනතාවගෙන් යුක්තවූ අරගල මාදිලියක නව ආරම්භයක් විය. එසේ වර්ධනය වූ අසහනයන් 2011 වසර වනවිට එක්සත් ජනපදයේදී Occupy Wall Street (වෝල් වීදිය අල්ලා ගනු) යන ප්‍රධාන සටන් පාඨය ඔස්සේ අරගලයක් ලෙස මතුපිටට පැවතියේය.



නව ජාතිවාදී පක්ෂ හා සංවිධාන වර්ධනය වන යථාර්ථයක් තුළ මෙම නව වාමාංශික හා ප්‍රගතිශීලී එමෙන්ම ජනප්‍රිය පක්ෂවල ආගමනය කැපී පෙනුනි.

ස්පාඤ්ඤයේදී 2014 වර්ෂයේදී කුඩා වාමාංශික පක්ෂ සහ කණ්ඩායම් කිහිපයක මෙන්ම ස්වාධීන ප්‍රගතිශීලීන්ගේ මැදිහත්වීමෙන් 'පොදෙමෝස්' පක්ෂය ගොඩනැඟීම මීට එක් නිදසුනකි. ක්ෂණිකව විශාල වර්ධනයක් අත්පත් කරගත්, කප්පාදු වැඩසටහන්වලට විරුද්ධ එමෙන්ම අරගලයේ නියුතු පොදු ජනතාවගේ හඬ නියෝජනය කරන පක්ෂයක් ලෙස බිහිවූ මෙම නව පක්ෂය 2015 වසරේ මහමැතිවරණයෙන් 21%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන වැඩිම ඡන්ද හිමි පක්ෂය ලෙස පාර්ලිමේන්තුවට තේරී පත්විය. නමුත් ඡන්ද බෙදීමේ සංකීර්ණකම සහ ප්‍රතිපත්තිමය ප්‍රතිවිරෝධතා නිසාවෙන් ඔවුන්ගේ මූලිකත්වයෙන් ආණ්ඩුවක් පිහිටුවීමට හැකිවූයේ නැත. අනතුරුව ඔවුන්ගේ ජනප්‍රියතාවය ක්‍රමයෙන් අඩුවී ගිය අතර ස්පාඤ්ඤය පෙරදී පාලනය කළ දේශපාලන පක්ෂ විසින්ම මැතිවරණ ජයගනිමින් සිය බලය තහවුරු කරගනු ලැබීය.

ග්‍රීසියේදී මෙම තත්ත්වය වඩාත් දරුණු අතට හැරෙන අතර, ග්‍රීසිය දරුණු ආර්ථික කඩාවැටීමකටද ලක්විය. එහිදී පෙර කී ආයතන ත්‍රිත්වයේ වැඩපිළිවෙළ මත කප්පාදු වැඩසටහනක් ක්‍රියාත්මක විය. ඒ වනවිට යාන්තමින් පිහිටුවා තිබුණු වාමාංශික සන්ධානයක් වන 'සයිරිසා' පක්ෂය විශාල වශයෙන් ජනතා අනුග්‍රහය හිමි දැවැන්ත පක්ෂයක් බවට වර්ධනය වන්නේ ග්‍රීසිය තුළ ක්‍රියාත්මක වූ ජනතා අරගලයේ ප්‍රතිඵලයක් ලෙසය. අරගලයේ නියුතු ලක්ෂ ගණන් ග්‍රීක ජනතාවගේ පක්ෂය බවට කෙටි කලකින් පත්වූ 'සයිරිසා' පක්ෂය එක ළඟ පැවැත්වුණු මැතිවරණ ගණනාවකදී වේගවත් වර්ධනයක් අත්පත් කරගනිමින් පැමිණ, 2015 දී පැවැත්වුණු එරට මහමැතිවරණයෙන් ඓතිහාසික ජයක් ලැබීය. මෙය දෙවන ලෝක යුද්ධ සමයෙන් පසු යුරෝපයේ රටක රැඩිකල් වාමාංශික පක්ෂයක් ආණ්ඩුවක් පිහිටුවනු ලැබූ පළමු අවස්ථාවයි. නමුත් ආර්ථික අර්බුදය නිසියාකාරව කළමනාකරණය කිරීමට අපොහොසත්වීම සහ ජනතා වරමට වඩා වෙනස් තීරණ අනුගමනය කිරීමේ තීරණ නිසාවෙන් ඔවුහු 2019දී පරාජය ලැබූහ.

කෙසේ වුවද යුරෝපය තුළ 2010 න් පසු අරගල අත්දැකීම් නව දේශපාලන පාඩමක් ලොවට දායාද කරයි. ඒ අර්බුදයෙන් කෝපයට පත් ජනතාව සමඟ වීදිවල සිට ගැනීමෙන් ඔබ්බට ගොස් දේශපාලන බලය අත්පත් කරගැනීම ඉලක්ක කරගනිමින් මැතිවරණ ක්‍රමය තුළ ජයග්‍රහණ අත්පත් කරගෙන එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අරමුණු කරගත් ජනප්‍රියවාදී වාමාංශික හා ප්‍රගතිශීලී නව දේශපාලන ව්‍යාපාර ගොඩනැඟීමය. අවසානයේ බලාපොරොත්තු වූ මට්ටමේ ජයග්‍රහණයක් අත්පත් කරගැනීමට අපොහොසත් වුවත්, පළමු වතාවට පසමිතුරුතා සහ සංකීර්ණ මතවාදී වෙනස්කම් පසෙක තබා පොදු සතුරා පරාජය කර පහළ පාන්තික ජනතාව ගලවාගැනීම වෙනුවෙන්වූ

දේශපාලන වැඩපිළිවෙළක් බලයට ගෙන ඒම සඳහා වාමාංශිකයන්ගේ හා ප්‍රගතිශීලීන්ගේ පුළුල් හා ජනප්‍රියවාදී සංවිධාන ගොඩනැඟීම, එහිදී මුහුණ දීමට සිදුවන අභියෝග හා පරාජයන් පිළිබඳව වටිනා පාඩම සහ බලාපොරොත්තුව ඔවුන් විසින් අප හමුවේ තබා තිබේ.

### අරාබි වසන්තය

අරගල පිළිබඳව සාකච්ඡා කිරීමේදී අපිට මඟහැරිය නොහැකි සිදුවීමක් වන්නේ 'අරාබි වසන්තය'. මේ නමින් හැඳින්වූයේ 2010 වසරේදී ටියුනීසියාවෙන් ආරම්භ වී අරාබිකරයේ රටවල් කිහිපයක් කරා පැතිර ගිය, එම රටවල පාලකයන්ට එරෙහිව දියත් වුණු අරගල රැල්ලයි. පසුව පොදුවේ මහජන අරගල පිළිබඳව සිදුකරන හැඳින්වීමක් වීම දක්වා මෙම 'අරාබි වසන්තය' (Arab Spring) යන වචනය ලෝක දේශපාලනය තුළ ජනප්‍රිය වචනයක් බවට පත්විය. ඔබට මතකනම් 2022 වසරේදී ගෝල්ෆේස් පිටියේ වාඩිලාගැනීමට පෙර, විදුලි කප්පාදුවට හා ඉන්ධන පෝලිම්වලට එරෙහිව ශ්‍රී ලාංකික ජනතාව උද්ඝෝෂණ ව්‍යාපාරයක් ගෝඨාභය ජනාධිපතිවරයාගේ නිවස ආසන්නයේ මුල්වරට අරඹද්දී ආණ්ඩුව පාර්ශ්වයෙන් ඊට එරෙහිව එල්ල කළ චෝදනාවක් වූයේ ලංකාව තුළ 'අරාබි වසන්තයක්' ඇති කිරීමේ කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බවය. එසේ පැවසීමට තර්කයක් ගොඩනැගෙන්නේ ටියුනීසියාවෙන් ඇරඹී අරාබිකරය පුරා විහිදී ගිය මෙම ජනතා අරගලවල අත්දැකීම් සහ ඇතැම් ප්‍රතිඵල පිළිබඳව විමසීමේදීය. ලංකාවේ රාජපක්ෂ රෙජීමයට එවැනි කිසිදු ජනතාවාදී හෝ අධිරාජ්‍ය විරෝධී හෝ පදනමක් නොමැති තත්ත්වයක් තුළ එම චෝදනාව විහිළුවක් වුවත්, අරාබිකරයට මෙම අරගල අවසානයේ සිදුවූ දේශපාලනික වෙනස්කම් විහිළුවක් වූයේ නැත.

අරාබිකරය යනු දේශපාලනිකව ඉතාම තීරණාත්මක කලාපයකි. විශේෂයෙන්ම මීට දශක හතක පමණ පෙර සිට අද දක්වා සලකා බැලුවහොත් එහි වැදගත්කම අවිවාදිතය. එක් පසකින් ලෝක දේශපාලන බලයේ තීරණාත්මක සහ බලසම්පන්නම සාධකයක් වන බොරතෙල් බහුල වන නිසාම ආර්ථික ශක්තියෙන් සහ ජනතා සුබසාධන ඉහළ ලෙස සපයන රටවල් පද්ධතියක් ලෙස අරාබිකරය සකස් වී තිබේ. අනෙක් පසින් දශක ගණනක් තිස්සේ අඛණ්ඩව රටවල පාලන බලය හෙබවූ නායකයන් සහ පවුල්වලින් සමන්විත පාලනතන්ත්‍රයන් ගොඩනැඟී ඇත. තවත් පසෙකින් එක්සත් ජනපදය ඇතුළු බටහිරට හිතවත් රාජ්‍යයන් සහ ඔවුන්ට එරෙහි රාජ්‍යයන් වශයෙන් අරාබිකරය දේශපාලනිකව බෙදී තිබේ. ඊශ්‍රායලය වැනි රාජ්‍යයක් අරාබි ලෝකය මධ්‍යයේ පිහිටුවා තිබෙන තත්ත්වයක් තුළ මෙම තත්වය තවත් සංකීර්ණ වී ඇත. තවත් පසෙකින් 'මුස්ලිම් ලෝකය'ක් වූ රාජ්‍ය පද්ධතිය අතර ආගමික ඒකමිතියක් මෙන්ම නිකාය බෙදීම අතර ආතතියද ඇතැම් තැන්වල සන්නද්ධ කණ්ඩායම් ගොඩනැඟීම දක්වා විහිදී තිබේ. එමෙන්ම රටවල් තුනක කොටස් එක්කරග නිමින් වෙනම රාජ්‍යයක් ලෙස 'කුර්දිස්ථානයක්' ලබාගැනීම වෙනුවෙන් සටන් වැදී සිටින කුර්දි සටන්කාමීන් බඳු බලවේග ඒ වනවිටද සටන්වදිමින් සිටී. මේ සියල්ලම පවතින අතර බටහිර ලෝකයට අරාබිකරය සතුව ඇති මෙම සුවිසාල බොර තෙල් සම්පත වෙත වඩාත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි පහසු මාර්ග සහ ඔවුන්ට හිතවත් පාලන තන්ත්‍රයන් බිහිකරගැනීමේ අවශ්‍යතාවයද නොනිමී පවතී.

2010 වසරේ මේ සියලු තත්වයන් මැද උතුරු අප්‍රිකානු නමුත් අරාබි ලෝකයේ රටක් වශයෙන් සැලකිය හැකි ටියුනීසියාවේ අගනුවරදී මහජන අරගලයක්

> අරාබිකරය යනු දේශපාලනිකව ඉතාම තීරණාත්මක කලාපයක්. විශේෂයෙන්ම මීට දශක දෙකකට පමණ පෙර තත්ත්වය සලකා බැලුවහොත් එහි වැදගත්කම වටහාගත හැකියි. එක් පසකින් ලෝක දේශපාලන බලයේ තීරණාත්මක සහ බලසම්පන්නම සාධකයක් වන බොරතෙල් බහුලවන නිසාම ආර්ථික ශක්තියෙන් සහ ජනතා සුබසාධන ඉහළ ලෙස සපයන රටවල් පද්ධතියක් ලෙස අරාබිකරය සකස් වී තිබේ. අනෙක් පසින් දශක ගණනක් තිස්සේ අඛණ්ඩව රටවල පාලන බලය හෙබවූ නායකයන් සහ පවුල් වලින් සමන්විත පාලනතන්ත්‍රයන් ගොඩනැගී ඇත. තවත් පසෙකින් එක්සත් ජනපදය ඇතුළු බටහිරට හිතවත් රාජ්‍යයන් සහ ඔවුන්ට එරෙහි රාජ්‍යයන් වශයෙන් අරාබිකරය දේශපාලනිකව බෙදී තිබේ.



පුපුරා ගියා. ආර්ථික දුෂ්කරතා සහ බලධාරීන්ගෙන් දිගින් දිගටම එල්ලවන බාධාකිරීම් හමුවේ 26 හැවිරිදි තරුණ ටියුනීසියානු පදික වෙළෙන්දෙක් තම ශරීරයට ප්‍රසිද්ධියේ ගිනිතබාගෙන මිය යන්නේ 2010 වසරේ දෙසැම්බර් 17 වනදායි. මෙය ටියුනීසියාව පමණක් නොව මුළු කලාපයම කලඹවන ලද සිදුවීමක් බවට පත්විය. දශක ගණන් එකදිගට බලයේ සිටින පාලකයින් කෙරේ වන විරෝධයක් ලෙස ඇවිළ යන මෙම මහජන අරගලය අනතුරුව ඉතා ඉක්මණින්ම ප්‍රචණ්ඩකාරී අරගලයක් බවට පත්විය. මෙම මහජන අරගලය ටියුනීසියාවෙන් නොනැවතී ඊජිප්තුව, ලිබියාව, යේමනය, සිරියාව, ඇල්ජීරියාව, සුඩානය ඇතුළු රටවල් 18කට Twitter වැනි සමාජ මාධ්‍ය වේදිකා ඔස්සේ සංවිධානය වෙමින් පැතිර ගියේය. මහජන අරගල වල ප්‍රතිඵලයක් ලෙස මාස දෙකක් වැනි කාලයකදී වසර 23 ක් අඛණ්ඩව එරට ජනාධිපතිධුරය හෙබ වූ 'බෙන් අලි' තම ධුරය අත්හැර සෞදි අරාබියට පලා ගියේය. 2011 ජනවාරියේදී ටියුනීසියාවේ සිදුවූ මෙම පෙරළිය මේ ආකාරයේ මහජන අරගලයකින් සිදුකළ ප්‍රථම රාජ්‍ය නායක ඉවත්කිරීම ලෙස ඉතිහාස ගතවේ. නමුත් සැමරීමට වඩා අරාබිකරයට අනතුරුව එළඹෙන්නේ වඩාත් ලේ වැකි සහ වඩාත් අස්ථාවර කාල වකවානුවකි.

ඉන් අනතුරුව ඊජිප්තුවේ වර්ධනය වූ ප්‍රචණ්ඩකාරී අරගල හමුවේ 1981 වසරේ සිට අඛණ්ඩව වසර 30 ක් එරට ජනාධිපතිවරයා වූ 'හොස්නි මුබාරක්' තම ධුරයෙන් ඉවත්විය. අනතුරුව සන්නද්ධ හමුදාවල ඉහළ මණ්ඩලයකට රටේ පාලනය බාරවිය. එමෙන්ම දශක ගණනාවක් යට ගොස් තිබූ 'මුස්ලිම් බ්‍රදර්හුඩ්' වැනි ආගම්වාදී සංවිධානද සැලකිය යුතු ලෙස කරළියට පැමිණි අතර ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය ඉතාමත් සීමිත කෙරිණි. හොස්නි මුබාරක්ට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනුණු අතර වසර ගණනක් සිරගත වූ ඔහු මියයාමට ටික කාලයකට පෙර සිරභාරයෙන් නිදහස් කරනු ලැබිණි.

යේමනයේදී මහජන අරගල ප්‍රචණ්ඩ ලෙස විහිදී ගිය අතර වසර 33 ක් එරට ජනාධිපතිධුරය හෙබවූ 'අලි අබ්දුල්ලා සලේ' ට 2012 වසරේදී සිය ධුරය අත්හැරීමට සිදුවිය. අනතුරුව රට දරුණු සිවිල් යුද තත්ත්වයකට ඇදවැටෙන අතර අද වනවිටත් පාලන තන්ත්‍රයන් කිහිපයක් පවතින, සිවිල් යුද්ධයක් පවතින රාජ්‍යයක් ලෙස අස්ථාවර තත්ත්වයක යේමනය පවතී. විශේෂයෙන්ම එරට අගනුවර ඇතුළු උතුරු ප්‍රදේශයේ වැඩි කොටසක් 'හූති සටන්කරුවන්' ලෙස හැඳින්වෙන 'අන්සාර් අල්ලා' සංවිධානයෙන් පාලනය කෙරේ.

ඔවුන්ගේ පාලනයට ඉරානයේ සහයෝගය හිමිව තිබෙනවා. එමෙන්ම ජනාධිපතිවරයෙකු විසින් පාලනය කෙරෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගන්නා එරට නිල ආණ්ඩුව සෞදි අරාබියේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සහයෝගය සහිතව 'ඒඩින්' නගරය පදනම් කරගෙන පවතී. තුන්වැන්නක් සහ දකුණු යේමනයේ ප්‍රධාන බලවේගය ලෙස 'දකුණු සංක්‍රමණීය කවුන්සිලය' (Southern Transitional Council) පවතින අතර ඔවුන් හූති සංවිධානයට එරෙහිව ජනාධිපතිවරයාගේ ආණ්ඩුවට සහයෝගය දෙන නමුත් 'දකුණු යේමනය' ට වෙනම පාලනයක් ලබාගැනීම වෙනුවෙන් සටන් වැදී සිටී.

ලිබියාවේ මහජන අරගලය මේ අතුරින් වඩාත් ප්‍රචණ්ඩභාවයට පත්වූ අතර එය ආයුධ සන්නද්ධ කණ්ඩායම් මැදිහත්වූ සිවිල් යුද තත්ත්වයක් කරා වර්ධනය විය. මෙහිදී 1969 වසරේ සිට වසර 42ක් එරට පාලකයා වූ 'මුහම්මර් ගඩාෆි' 2011 වසරේදී මහමඟ තිරශ්චීන ලෙස ඝාතනය කරනු ලැබිණි. දැවැන්ත සුබසාධන ව්‍යාපාරයක් සහිතව ලිබියාව ගොඩනැඟූ ගඩාෆි පාලනයෙන් අනතුරුව බිඳවැටුණු, අඛණ්ඩව සිවිල් යුද්ධ ඇවිළී යන රාජ්‍යයක් බවට එම අරගලයෙන් වසර 15 ක් ගතවන අද දවස වනවිටත් පත්වී තිබේ. එමෙන්ම පාලන තන්ත්‍රයන් දෙකක් සහිත බෙදුණු රාජ්‍යයක් බවට අද වනවිට ලිබියාව පත්ව ඇත. මෙහි විශේෂය වන්නේ ටියුනීසියාවෙන් ඇරඹි මහජන විරෝධතා ලිබියාවේදී එක්සත් ජනපදය විසින් තම දේශපාලන වුවමනාවන් සඳහා මෙහෙයවා ගැනීමට පියවර ගැනීමය. ඒ හරහා එක්සත් ජනපද විරෝධී ලිබියාවේ ගඩාෆි පාලනය බිඳ දමනු ලැබිණි.

සිරියාවේ ජනාධිපති 'බෂාර් අල් අසාද්' බලයෙන් පහකිරීම ඉලක්ක කරගත් මහජන අරගලය පළමුවටයේ සාර්ථක නොවෙන අතර ඒ හරහා 2011න් පසු සිරියාව දරුණු සිවිල් යුද තත්ත්වයකට ඇද දැමීය. එක්සත් ජනපදය, රුසියාව ඇතුළු විදෙස් බලවතුන්ගේ සෘජු මැදිහත්වීමට ලක්වන එම සිවිල් යුද්ධයේදී විවිධ අන්තවාදී කණ්ඩායම් රටේ විවිධ ප්‍රදේශවල පාලන බලය අල්ලා ගැනීමත්, ඇතැම් ප්‍රදේශවල වෙනම රාජ්‍යයන් සඳහා යුද වැදීමත් දක්වා සිවිල් යුද්ධය දිගහැරිණි. වසර 15 කට පසු 2024 දී අල් අසාද් පාලන බලය අත්හැර රුසියාවට පලා යාමෙන් පසු රටේ සිවිල් යුද තත්ත්වය යම් ආකාරයකට මේ වනවිට පහව යමින් තිබේ.

මීට අමතරව ඇල්ජීරියාව සහ සුඩානයද දෙවන වටයේ නැවතත් මහජන අරගලවලට 2019 කාලයේදී මුහුණ දුන් අතර ඇල්ජීරියාවේදී තාවකාලික ආණ්ඩුවක් පත්කරගත් නමුත් 2023 කාලයේදී උත්සන්න වූ සිවිල් යුද තත්ත්වය හමුවේ රට තවමත් ගැඹුරු ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටී. සුඩානයේද අරගල හමුවේ ජනාධිපති ඉල්ලා අස්වූ නමුත් ජනතාවගේ ඉල්ලීම් බොහොමයක් ඉෂ්ට නොවීම මෙන්ම දේශපාලන අස්ථාවරත්වයෙන්ද එරට ජනතාව පීඩා විඳිමින් සිටියි.

අරාබිකරයේ 'අරාබි වසන්තයේ' මෙම උදාහරණ කිහිපය සලකා බැලූ විට සමාජ මාධ්‍ය මගින් සංවිධානය වෙමින් පාලකයන්ට එරෙහිව සිදුකරන මේ ආකාරයේ මහජන අරගලවල නව මානයක් හඳුනාගත හැකිය. එනම් එක්සත් ජනපදයේ දී හා යුරෝපයේදී හෝ ලංකාවේදී තරම් සෑම තැනකදීම, සෑම විටම මෙම මහජන 'අරගල' මාදිලිය සුන්දර, සාමකාමී හෝ ඉදිරිගාමී ප්‍රතිඵල අත්කර නොදෙන බවයි. මේ ආකාරයේ 'අරගල' තුළින් පැවතියාට වඩා නරක අන්තයන් කරා රටවල් මෙහෙයවීමටද හැකියාවක් ඇති බවට උදාහරණ ගණනාවක් අරාබියේදී අපට හමුවේ. එමෙන්ම දීර්ඝ කාලීනව රාජ්‍ය පාලනයේ සිටි පාලකයන්ට එරෙහිව සිදුවුණ මෙම මහජන අරගල විසින් බලයෙන් පහකළ නායකයන් සහ ඔවුන්ගේ වැඩපිළිවෙළවල් සලකා බැලූවිට මේ බොහෝ දෙනා දූෂණ, වංචා චෝදනාවලට ලක්වන අතරම ඔවුන් ප්‍රබල ලෙස

පාලකයන්ට එරෙහිව සිදුකරන මේ ආකාරයේ මහජන අරගලවල නව මානයක් හඳුනාගත හැකියි. එනම් එක්සත් ජනපදයේ දී හා යුරෝපයේදී හෝ ලංකාවේදී තරම් සෑම තැනකදීම, සෑම විටම මෙම මහජන 'අරගල' මාදිලිය සුන්දර, සාමකාමී හෝ ඉදිරිගාමී ප්‍රතිඵල අත්කර නොදෙන බවයි. මේ ආකාරයේ 'අරගල' තුළින් තිබුණාට වඩා නරක අන්තයන් කරා රටවල් මෙහෙයවීමටද හැකියාවක් ඇති බවට උදාහරණ ගණනාවක් අරාබියේදී අපට හමුවේ.



බටහිර විරෝධී දේශපාලනයක සිටීම හඳුනාගත හැකි කරුණකි. එය හුදු අහම්බයක්ද, නැතිනම් මෙසේ සමාජ මාධ්‍ය ඔස්සේ සංවිධානය වෙමින් දියත් කෙරෙන අරගලවලදී එයට සහභාගී වන හුදු පුරවැසියෙකුට එහා ගිය විශාල බල කඳවුරු තමන්ට අවශ්‍ය ආකාරයට මැදිහත්වෙමින් ඒවායේ දිශාව තීරණයට බලපෑම් කරන පාර්ශ්වයක් ලෙස කටයුතු කරනවාද යන්න ඕනෑ කෙනෙකුට සැක උපදවන සුළු කාරණයක් වී තිබේ. විශේෂයෙන්ම මෙම බොහොමයක් සමාජ මාධ්‍ය වේදිකාවල හිමිකාරීත්වය බටහිර සතුව පැවතීමත්, ඒවායේ 'ඇල්ගෝරිද්මයන්' පාලනය කිරීමේ ප්‍රවේශයන් තම දේශපාලන කඳවුරට හිතවත් සෙසු බලවත් රාජ්‍යයන් වෙත පමණක් විවෘත කර තිබීමත් මෙහිදී අමතක නොකළ යුතුය. ඒ නිසා දේශපාලනිකව බලවත් රාජ්‍යයන් සෙසු රටවල දියත්වන මෙම මාදිලියේ මහජන අරගල තමන්ට අවශ්‍ය දිශාවට මෙහෙයවීමට යම් ආකාරයකට මැදිහත්වන්නේය යන සැකය අතිශය සාධාරණ සහ සහේතුකය.

මීට අමතරව චිලිය, ඉක්වදෝරය සහ කොළොම්බියාව ඇතුළු දකුණු ඇමරිකානු රටවලද 2019 දී මේ ආකාරයේ සමාජ මාධ්‍යවලින් මූලිකව සංවිධානය වුණු අරගල රැල්ලක් ඇවිල ගියේය. විශේෂයෙන්ම මේවා දීර්ඝ කාලීනව සිටින පාලකයන්ට එරෙහි අරගල වෙනුවට ඒ වනවිට මතුවූ ආර්ථික අපහසුතා සහ අහිමි කිරීම් මුල්කර ගනිමින් ආරම්භ වූ අරගල ලෙස හැඳින්විය හැකියි. ප්‍රවාහන මිල ඉහළ නැංවීම, ඉන්ධන සහන අහිමි කිරීම සහ නව ආර්ථික ප්‍රතිසංස්කරණවලට එරෙහිව මෙම අරගල පැනනැඟිණි. චිලියේදී මෙය නව දේශපාලන වෙනසක් සිදුකරමින් එළඹුණු මැතිවරණයේදී නව ආණ්ඩුවක් පත්කිරීම දක්වා ඉදිරියට ගියත් ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය සම්බන්දයෙන් එල්ලවුණු අප්‍රසාදය ඇතුළු කරුණු කාරණා හේතුවෙන් ඊළඟ මැතිවරණයේදී ආණ්ඩු වෙනසක් සිදුවිය.

## දකුණු ආසියාව

2022 දී ලංකාවේ අරගලය ගැන අපි ආරම්භයේදී සාකච්ඡා කරනු ලැබිණි. එම අත්දැකීමෙන් පසුව අසල්වැසි බංග්ලාදේශයේ සිදුවූ මහජන අරගලයද අපිට මඟහැර යා නොහැකි සහ විශේෂයෙන්ම අධ්‍යනය කළ යුතු සිදුවීමක්.

2024 වසරේදී එවකට බංග්ලාදේශ අගමැතිනි 'ශෙයික් හසීනා' ගේ 'ආවාමි ලීගය' විසින් මෙහෙයවූ ආණ්ඩුව විසින් ගනු ලැබූ තීරණ කිහිපයක් සම්බන්දයෙන් බංග්ලාදේශයේ ශිෂ්‍ය බලවේගවල ප්‍රබල විරෝධයක් එල්ල විය. ශෙයික් හසීනා යනු බංග්ලාදේශය වැඩිම කාලයක් පාලනය කළ නායිකාවයි. 1996 සිට 2024 දක්වා කාලය

තුළ ඇයගේ පක්ෂයට පාලන බලය අහිමි වුයේ 2001 - 2006 කාලයේ පමණයි. එම කාලයේ එරට අනෙක් ප්‍රධාන පක්ෂය වන 'බංග්ලාදේශ ජාතිකවාදී පක්ෂය' (BNP) එහි නායිකා 'බේගම් කලීඩා' ගේ අගමැතිධුරය සහිතව බංග්ලාදේශය පාලනය කළාය. නමුත් එම ආණ්ඩුවට ප්‍රබල වශයෙන් දූෂණ චෝදනා එල්ල විය. රජයේ කොන්ත්‍රාත් සහ ව්‍යාපාරික ගනුදෙනුවලින් අධික ලෙස කොමිස් මුදල් ලබාගත් බවට චෝදනා එල්ල වුණු අතර ජාත්‍යන්තර වාර්තා අනුව ඇයගේ පාලන සමයේදී බංග්ලාදේශය අඛණ්ඩව වසර පහක් ලොව දූෂිතම රටවල් අතර පෙරමුණේ සිටින බවට වාර්තා පළවිය.

මේ තත්ත්වය තුළ 2009 වසරේදී 'ආවාමි ලීගය' පක්ෂයේ ෂෙයික් හසීනා බලයට පත්විය. 2024 දී මහජන අරගලයක් පුපුරා ගියේ ඇයගේ පාලනයට එරෙහිවයි. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අරගලයක් ලෙසින් මෙම අරගලය ආරම්භ වුණේ රැකියා විරහිතභාවය වර්ධනය වෙමින් තිබුණු මොහොතක, රජය විසින් රැකියා ලබාදීමේදී ඔවුන්ට ලබාදී තිබූ විශේෂ කෝටාවන් අහිමි කිරීමට විරුද්ධවයි. එමෙන්ම වැඩිවෙමින් තිබුණු උද්ධමනය මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ද සටන් පාඨද මෙම අරගලයට ඇතුළත් විය. කෙසේ නමුත් රජය විසින් මෙම අරගලය මර්දනයට විශාල ප්‍රහාරයක් එල්ල කිරීමත් සමග අරගලය ප්‍රචණ්ඩකාරී ලෙස වර්ධනය වෙමින් රජය පෙරළා දැමීමට සමත් විය. අවසානයේ ශෙයික් හසීනා ඉන්දියාවට පලාගිය අතර, අන්තර්වාර ආණ්ඩුවක් පිහිටුවමින් එහි අගමැති ලෙස 'මුහම්මද් යුසුෆ්' පත් කෙරිණි. අනතුරුව 2026 වසරේ පැවති මහමැතිවරණයෙන් නැවත BNP පක්ෂය ජයග්‍රහණය කළ අතර, පක්ෂයේ නායක, 2009 වසරේදී පරාජයට පත්වූ බේගම් කලීඩාගේ පුත් 'තාරික් රහ්මාන්' අගමැති වශයෙන් තේරී පත්විය. මෙහි තවත් විශේෂත්වයක් වන්නේ 2024 අරගලයෙන් අනතුරුව සුළු ජාතීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය බංග්ලාදේශය තුළ වර්ධනය වුණු අතර, 'අරගලකරුවන්' ලෙස තමන්ව හඳුන්වාගත් අරගලයට මුල්වුණු ශිෂ්‍ය නායකයන් ඇතුළු පිරිස අන්තවාදී සන්ධානයක් වන 'ජමාත්-ඊ-ඉස්ලාමි' නම් සංවිධානයෙන් මැතිවරණයට ඉදිරිපත් වීමය. අවසානයේ විශාල ජනතා අරගලයක ප්‍රතිඵලය ලෙස රෙජීම් වෙනසක් පමණක් සිදුවීම බංග්ලාදේශ මහජන අරගලයේ ප්‍රතිඵලය ලෙස දැකගත හැකියි.

2025 වසරේදී නේපාලයේදී තරුණ කොටස් මුල්වෙමින් ආණ්ඩුවට එරෙහි මහජන අරගලයක් දියත් කළ අතර එය 'ජෙන් ''අරගලයක් ලෙස හැඳින්විණි. ආණ්ඩුවේ දූෂණ වංචා මෙන්ම පවුල්වාදයට එරෙහිව මෙහිදී සටන් පාඨ දිගහැරිණි. සමාජ මාධ්‍ය මුල් කරගෙන සංවිධාන කටයුතු සිදුවූ මෙම මහජන අරගලයේදී එරට පැවති වාමාංශික සන්ධාන ආණ්ඩුවේ අගමැති වූ 'ශර්මා ඔලි' ඉල්ලා අස්වී අන්තර්වාර ආණ්ඩුවක් පත්කෙරිණි. එම අන්තර්වාර ආණ්ඩුව විසින් 2026 මාර්තුවේ පැවැත්වූ මැතිවරණයෙන් අරගල කණ්ඩායම් නියෝජනය කළ නව පක්ෂයක් වූ රාෂ්ට්‍රීය ස්වටන්ට්‍රා (Rastriya Swatantra) පක්ෂය ආසන 275න් 182ක විශාල ජයග්‍රහණයක් ලබා ගත්තේය. පෙර පාර්ලිමේන්තුවේ ඔවුන්ට පැවතියේ මන්ත්‍රී ධුර 20ක් පමණි. ඒ අනුව බෙලෙන් ෂා (Balen Shah) අගමැති ලෙස පත්විය. නේපාලයේ සාම්ප්‍රදායික පක්ෂ සියල්ල පරාජය කරමින් වාර්තා කළ එය නේපාල මැතිවරණ ඉතිහාසයේ වාර්තාගත ප්‍රතිඵලයක්ද විය.

ඉහතින් සංක්ෂිප්තව දැක්වූයේ සමාජ මාධ්‍ය මූලික කරගනිමින් සංවිධානය වන, දේශපාලන පක්ෂ හෝ සංවිධාන පෙරමුණේ කාර්යභාරයක නිරත නොවෙන මෙම විශේෂ 'මහජන අරගල' මාදිලිය ඇතිවූ පසු පසුගිය වසර 20 කට ආසන්න කාලයේ අපට ඒ පිළිබඳව ලෝක මට්ටමෙන් දැකගත හැකිවූ ප්‍රධාන අත්දැකීම් සමුදායයි.

මේ සමස්තය දෙසත් ලංකාවේ

"මෙහි තවත් විශේෂත්වයක් වන්නේ 2024 අරගලයෙන් අනතුරුව සුළු ජාතීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය බංග්ලාදේශය තුළ වර්ධනය වුණු අතර, 'අරගලකරුවන්' ලෙස තමන්ව හඳුන්වාගත් අරගලයට මුල්වුණු ශිෂ්‍ය නායකයන් ඇතුළු පිරිස අන්තවාදී සන්ධානයක් වන 'ජමාත්-ඊ-ඉස්ලාමි' නම් සංවිධානයෙන් මැතිවරණයට ඉදිරිපත් වීමයි. අවසානයේ විශාල ජනතා අරගලයක ප්‍රතිඵලය ලෙස රෙජීම් වෙනසක් පමණක් සිදුවීම බංග්ලාදේශ මහජන අරගලයේ ප්‍රතිඵලය ලෙස දැකගත හැකියි.

අපගේ අත්දැකීම දෙසත් විචාරශීලීව බලා මේ සංකීර්ණ තත්ත්වය විග්‍රහ කරගැනීමට උත්සාහ කළ යුතුයි. ලංකාවේ අත්දැකීම සහ ප්‍රතිඵලය වෙනස් වූයේ කෙසේද? අරගලයෙන් රාජපක්ෂ රෙජීමය පළවා හැරිය මුත්, නැවත පාර්ලිමේන්තුව තුළ ඔවුන්ගේ සහයෝගයෙන්ම රනිල් වික්‍රමසිංහ ජනාධිපති බවට පත්වී, රාජපක්ෂ රෙජීමයේ පිරිස්ම ඇමතිධුරයන්ට පත්කරග නිමින්, දූෂණ වංචා ඒ ආකාරයටම සිදුකරමින් ගෙනගිය පාලනයක් ගොඩනැගුණි. ඒ අන්තර්වාර ආණ්ඩුව විසින් ආර්ථික අර්බුදයේ පීඩනය ජනතාව මතම පටවමින්, බදුපිට බදු ගසමින් පීඩාකාරී පාලනයක් ගෙනගියේය. ලංකාව තුළදී ඒ තත්ත්වය අනතුරුව වෙනස් වූයේ කෙසේද? අරගලයෙන් වසර දෙකකට පසු පැවති මැතිවරණවලින් මෙතෙක් රට පාලනය කළ කඳවුරු පරාජය කරමින් මහජන ව්‍යාපාරයක් ලෙස වර්ධනය වුණු ජාතික ජන බලවේගය බලයට පත්වූයේ කෙසේද? ලෝකයේ අනෙක් රටවලට වඩා ලංකාවේ තත්ත්වය සුබදායී ලෙස වෙනස් වන්නට මෙහිදී බලපෑ කාරණා මොනවාද?

පිළිතුර ඇත්තේ ජනතාව සමග බද්ධ වෙමින්, ජනතාව අතර ගොඩනැගුණු, සමාජයේ පහළටම මුල් කිඳා බැසගත්, එමෙන්ම සියලු ආකාරයේ ජනකොටස් සහ ප්‍රජාවන් තුළ විශ්වාසය තහවුරු කළ දේශපාලන බලවේගයක් ලෙස ජාතික ජනබලවේගය මේ මුළු කාලය පුරාම වර්ධනය වෙමින් තිබූ තත්වය තුළයි. විශේෂයෙන්ම අරගලයට පෙර සිටම පැවති පාලනයන්ට එරෙහිව දුෂ්කර, නමුත් ප්‍රතිපත්තිගරුක දේශපාලනයක නිරත වෙමින් සිටි ව්‍යාපාරයක් ලෙස ගොඩනැගී තිබීම මෙන්ම අරගලයට හේතුවූ කරුණු සහ එම මූලධාර්මික සටන්පාඨ නියෝජනය කළ ව්‍යාපාරයක් ලෙස ගොඩනැගී තිබීම මෙහිදී සුවිශේෂ වේ. එතෙක් පැවති පාලනයන්ගේ වැරදි ආර්ථික ප්‍රතිපත්තිවලට එරෙහිව මෙන්ම දූෂණ වංචාවලට, ප්‍රජාතන්ත්‍රවිරෝධී භාවිතයන්ට එරෙහිව දිගින් දිගටම සටන් වැදී සිටි ව්‍යාපාරයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණත්, පසුව ජාතික ජන බලවේගයත් ගොඩනැගී තිබීම නිසාවෙන් තීරණාත්මක මොහොතේ බහුතරයක් වූ මහජන අවකාශයේ විශ්වාසය දිනාගැනීමට හැකියාව ලැබිණි. එමෙන්ම අරගලය තුළදී ජනතාව සමග එක්ව සහ යම් නායකත්වයක් සපයමින් සටන් කිරීම, අරගලයේ නිරත ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටීමත්, ඊට සමගාමීව දේශපාලන බලහුවමාරුව සිදුකෙරෙන ඉදිරි මැතිවරණ ජයග්‍රහණයක් ඉලක්ක කරගනිමින් 'කොට්ඨාස සභා' වැනි සාර්ථක ජනමූල ව්‍යුහයන් ගොඩනගමින් සහ පක්ෂය පුළුල් කරමින් වර්ධනය කිරීම මෙම ජයග්‍රහණය ලබාගැනීමට මූලික හේතුවක් විය. අරගලයෙන් පසු වසර දෙක තුළදීත් ජනතාව සමග සහ ඊට ඉදිරියෙන් සිටිමින් උද්ඝෝෂණ ව්‍යාපාරවල නිරත වීම මෙන්ම මැතිවරණ ජයග්‍රහණයන් ඉලක්ක කරගනිමින් හැකි තරම් ප්‍රගතිශීලීන් සහ අවංක ක්‍රියාකාරීන් පක්ෂය වටා එකතු කරගනිමින්, ඉහළ - පහළ මැනවින් සම්බන්ද කළ පුළුල්තම මහජන ව්‍යාපාරයක් මනා සංවිධානයකින් යුතුව ගොඩනැගීම මේ ආකාරයෙන් ජනතා ජයග්‍රහණයක් තහවුරු කරගැනීමට අවශ්‍ය මූලික පදනම සකස් කළේය.

පාලකයන් කෙරේ කෝපාග්නියෙන් දැවෙමින් වීදියට බැස සිටින ජනතාවගේ දැවැන්ත විරෝධයන් මගින් පසුගිය දශක දෙක තුළ රටවල් ගණනාවක ආණ්ඩු සහ පාලකයන් පලවා හැරීමේ අත්දැකීම් ඕනෑතරම් දැකගත හැකිය. නමුත් එම පලවා හැරීමෙන් පසුව රටකට සහ සමාජයකට ඊටත් වඩා අඳුරු කාලපරිච්ඡේදයක් උදාවීම, නැතිනම් දැවැන්ත මහජන කැපකිරීම් සහ ජීවිත පරිත්‍යාගයන් අපතේ යවමින් රෙජීම් වෙනසක් පමණක් සිදුවීම, නැතිනම් දැවැන්ත විදේශ බලවතුන්ගේ දේශපාලන අවශ්‍යතාවය පරිදි එම කැළඹිලි සහගත මොහොත සියුම්ව කළමනාකරණය සිදුකර නැවතත් ජනතාවගේ අපේක්ෂා ඉටුනොකරන ආණ්ඩුවක් බලයට පත්වීම වැනි දෑ දැකගත හැකිය. එහෙත් එවැනි තත්ත්වයන් වළක්වමින් පැවති මහජන අරගලයේ අපේක්ෂාවන් ඉදිරියට ගෙනයන නැවුම් සහ වෙනස් පාලනයක් ගොඩනැගීමේ රහස ඇත්තේ දූරදර්ශී, සමාජයේ නිර්ප්‍රභූ අපේක්ෂාවන් මත පදනම්ව දේශපාලනය කරන, කැපකිරීම් කිරීමට මෙන්ම ඉවසා දරාගැනීමට සූදානම්, එමෙන්ම නවීකරණයට සහ පුළුල්වීමට විවෘත, දැවැන්ත සංවිධාන හැකියාවකින් යුක්ත ශක්තිමත් දේශපාලන ව්‍යාපාරයක් භූමියේ පැවතීම බව පැහැදිලිය. එසේ නොමැති සියලු අවස්ථාවන්හි දැවැන්ත මහජන අරගල මගින් පාලකයන් වෙනස් කිරීම ඉහත ආකාරයේ ඛේදවාචකයන්ගෙන් හෝ විශාල අපතේ යාම් ලෙස කෙළවරවීමට නියමිත බව මෑත කාලීන ඉතිහාසය සාක්ෂි දරනු ලබයි.



# සමාජ පරිවර්තනයක සැබෑ අභියෝග!

***චන්ද්‍රික අධිකාරී***

ශ්‍රී ලාංකේය වත්මන් සමාජය ‘වෙනසක්’ අපේක්ෂා කරමින් සිටී. වත්මන් පාලනය, සමාජයේ ගැඹුරු වෙනසක්, සමාජ පරිවර්තනයක් සඳහා කටයුතු කරමින් සිටී. එහෙත් සමාජයේ ගැඹුරු පුළුල් වෙනසක් කිරීම සරල කටයුත්තක් නොවන බව ඉතා පැහැදිලිය. සමාජයේ ගැඹුරු විසල් පරිවර්තනයක් අපේක්ෂා කරන අය එවැනි පරිවර්තනයකදී, වෙනසකදී මුහුණ දීමට සිදුවන අභියෝග පිළිබඳ දුෂ්කරතා හා බාධා පිළිබඳ අවබෝධයක සිටීම ඉතා වැදගත්ය. විශේෂයෙන්ම වෙනසක් අපේක්ෂා කරන ජනයා තුළ, සමාජය තුළ ඒ පිළිබඳ සාකච්ඡාවක් සංවාදයක් ඇතිවීම හා තමන් ඉදිරිපිට වන සැබෑ අභියෝග වටහා ගැනීමට හැකිවීම ඉතාම වැදගත්ය.

විද්‍යාත්මක හා දාර්ශනික අර්ථයෙන් ගත් විට ලෝකයේ සියල්ල වෙනස්වන බව, පරම සත්‍යයක් ලෙස පිළිගැනේ. "වෙනස් වන ලෝකයේ වෙනස් නොවන එකම දෙය වෙනස්වීමය" යනුවෙන් පැවසෙන්නේද මෙම කරුණමය. අප ජීවත්වන ලෝකයත් එහි ඇති සියලු භෞතික වස්තූන් මෙන්ම මිනිසුන්ද වෙනස් වන බව පරම සත්‍යය සේ පිළිගනු ලැබුවත් සමාජයක් වෙනස් වීම හෝ වෙනස් කිරීම පෙනෙන තරම් සරල හා පහසු නැත. සමාජයක වෙනස සිදුවන්නේ අලුත් දේට, නව දේට එරෙහිව පැරණි හා යල්පැන යන දේ විසින් සිදු කරන බාධා හා ප්‍රතිවිරෝධයන් මධ්‍යයේය. එය වටහා ගැනීම වෙනස්කම් කිරීම සඳහා ඉතාමත් අත්‍යවශ්‍යය.

**සියල්ල වෙනස් වන බව සත්‍ය වුවත්...**

භෞතික ලෝකය මෙන්ම මානව සමාජයද පවතින්නේ වර්ධනය තුළය. (නැතිනම් චලිතයේය) එනම් වෙනස් වෙමින් වර්ධනය වෙමින්ය. එහෙත් එය සිදුවන්නේ සරල රේඛීය ගමන් මඟක නොව, වර්ධනයන් මෙන්ම පසුබැසීම්ද සහිත ජයග්‍රහණ මෙන්ම පරාජයන්ද සහිත සංකීර්ණ ගමන් මගකය. එය සර්පිලාකාර මාර්ගයක් ලෙසද දර්ශනයේදී හඳුන්වයි. එහිදී හැමවිටකම හැම භෞතික වස්තුවක මෙන්ම මානව සමාජය තුළද මෙම වර්ධනය සිදුවන්නේ ප්‍රතිවිරෝධයන්ට මුහුණ දෙමිනි. හැම විටකම අලුතින් පැවැත්මට එන නව දෙයට එරෙහිව පැරණි දෙය බාධා කරන අතර එම නව දෙයට පැරණි දෙය ප්‍රතිවිරෝධයක් දක්වන්නේය. එවිට නව දෙය හා පැරණි දෙය අතර ගැටුමක් සටනක් ඇතිවන අතර අවසානයේ පැරණි දෙය පරාජය වී නව ප්‍රගතිශීලී දෙය පැවැත්මට එයි. එහෙත් එය එසේ වන්නේ දීර්ඝ, දුෂ්කර ක්‍රියාවලියකින් පසුව මිස, ප්‍රතිවිරෝධයක් සහිතව මිස කිසිදු බාධාවක් රහිතව නොවේ. සමාජයක් වෙනස් කිරීමේදී මේ සත්‍යය මෙසේම සිදුවේ. සමාජ වෙනසකදී, අලුත බිහිවූ නව සමාජීය බලවේගයන්ට එරෙහිව පැරණි සමාජීය බලවේග ගැටෙන්නට පටන් ගනී. බාධා කිරීමට පටන් ගනී. එනම් අලුත බිහිවූ නැතිනම් ජයග්‍රහණය කළ එහෙත් තවමත් දුර්වල නව සමාජයීය බලවේග හා පරාජයට පත්වූ එහෙත් තවමත් ශක්තිමත් පැරණි බලවේග අතර සටනක් පවතී. විටෙක පැරණි බලවේග තාවකාලිකව ශක්තිමත් වන නව බලවේග පසුබසින අවස්ථාද මතුවනු ඇත. කෙසේ වෙතත් අවසානයේ පැරණි බලවේග පරදා නව බලවේග ජය ගැනීමෙන් සටන අවසන් වේ. මෙම විද්‍යාත්මක හා දාර්ශනික සත්‍යය වටහා ගැනීම සමාජයේ ප්‍රගතිශීලී පරිවර්තනයක් වෙනුවෙන් සටන් කරන අයට ඉතාම වැදගත් වේ.



**බලය පිළිබඳ ප්‍රශ්නයේදී....**

මෙම න්‍යායික දේශපාලනික සත්‍යය ප්‍රායෝගිකව සිදුවන ආකාරය අපට තේරුම් ගැනීම අපහසු නැත. සමාජයේ පරිවර්තනයකදී, එක් පාලක කණ්ඩායමක් අතින් ඊට වෙනස් කණ්ඩායමකට, නැතිනම් එක් පංතියක් නියෝජනය කරන කණ්ඩායමක් අතින් වෙනත් පංතියක් නියෝජනය කරන කණ්ඩායමකට බලය මාරුවීම සිදුවිය යුතුය. ලංකාවේද දැන් පැරණි දූෂිත ප්‍රභූ කල්ලියක් අත තිබූ ආණ්ඩු බලය වාමාංශික ප්‍රගතිශීලී මහජන ව්‍යාපාරයක් නියෝජනය කරන කණ්ඩායමකට මාරු වී තිබේ. එවිට පරාජයට පත් පැරණි ප්‍රභූ කල්ලිය තමන් පරාජය බාරගෙන ජයග්‍රාහකයාට ඉඩදී ඉතිහාසයේ වේදිකාවෙන් බැස යන්නේ නැත. ඒ වෙනුවට යළි බලයට ඒමට, මෙතෙක් වරප්‍රසාද ලැබූ තම පැරණි ජීවිතය යළි අත්පත් කර ගැනීමට වඩාත් වැඩි උනන්දුවකින් කටයුතු කරන්නේය. වරක් ලෙනින් පැවසූ පරිදි "පරාජයට පත් පැරණි පාලක කල්ලිය තමන්ට අහිමි වූ 'ස්වර්ගය' යළි දිනා ගැනීමට වඩාත් වැඩි අනුරාගයකින් වඩාත් වැඩි ධෛර්යයකින් කටයුතු කරන්නේය". එහිදී පරාජයට පත් පැරණි පාලක කල්ලිය තමන් බලයේ සිටියදී ගොඩනඟාගත් සමාජ සබඳතාවන්ද, උපයාගත් ධනයද, සමාජය තුළ සිටින තමන්ට අවනත පිරිසද උපයෝගී කර ගනිමින් නව පාලනයට එරෙහිව විවිධ කුමන්ත්‍රණද කරමින්, විවිධ අසත්‍ය පුවත් ප්‍රචාරය කරමින්, බොරු කියමින්, අවලාද නගමින්, කඩාකප්පල්කාරී ක්‍රියාකරමින් ජනතාව විටෙක නොමග යවමින් හා විටෙක බිය වද්දමින් කටයුතු කරන්නේය. එය නව පාලනය සමාජය වෙනස් කිරීමට දරන ප්‍රයත්නයට විශාල බාධාවක් වේ. නව සමාජ වෙනසක් කිරීමට

> **සමාජයේ පරිවර්තනයකදී, එක් පාලක කණ්ඩායමක් අතින් ඊට වෙනස් කණ්ඩායමකට, නැතිනම් එක් පංතියක් නියෝජනය කරන කණ්ඩායමක් අතින් වෙනත් පංතියක් නියෝජනය කරන කණ්ඩායමකට බලය මාරුවීම සිදුවිය යුතුය. ලංකාවේද දැන් පැරණි දූෂිත ප්‍රභූ කල්ලියක් අත තිබූ ආණ්ඩු බලය වාමාංශික ප්‍රගතිශීලී මහජන ව්‍යාපාරයක් නියෝජනය කරන කණ්ඩායමකට මාරු වී තිබේ. එවිට පරාජයට පත් පැරණි ප්‍රභූ කල්ලිය තමන් පරාජය බාරගෙන ජයග්‍රාහකයාට ඉඩදී ඉතිහාසයේ වේදිකාවෙන් බැස යන්නේ නැත. ඒ වෙනුවට යළි බලයට ඒමට, මෙතෙක් වරප්‍රසාද ලැබූ තම පැරණි ජීවිතය යළි අත්පත් කර ගැනීමට වඩාත් වැඩි උනන්දුවකින් කටයුතු කරන්නේය.**

සිදුවන්නේ එම බාධා මධ්‍යයේ ය නිසා එය දුෂ්කර වේ.

අනෙක් අතට ලංකාවේදී, තවමත් රාජ්‍යය, රාජ්‍ය යාන්ත්‍රණය පැරණි පැවතුණු එකම වන නිසාත්, එය කලක් තිස්සේ කටයුතු කර ඇති පැරණි සම්ප්‍රදායික ආකාරයන් වහාම වෙනස්කර ගැනීමට අසමත් නිසාත් එය නව තත්වයන්ට හැඩග ස්වා ගැනීම අභියෝගයක්ව පවතී.

**ජනතාව වෙනස් කළ නොහැකිද?**

සමාජයක් වෙනස් කිරීමේදී වඩාත්ම තීරණාත්මක පිරිස වන්නේ ජනතාවය. වෙනස් කළ නොහැකි වෙනස් නොවෙන කිසිවෙක් නොමැති බවත්, ජනතාවද වෙනස් කළ හැකි බවත්, ජනතාව වෙනස් වන බවත් සත්‍යයක් වුවද එය සිදුවන්නේ පහසු සරල ආකාරයෙන් නොවේ. සාමාන්‍යයෙන් පොදුවේ ජනතාව කලක් තිස්සේ යම් ජීවන ආකාරයකට හුරුවූ විට ඉන් වහාම මිදීමට කැමති නැත. තමන්ට හුරු පුරුදු පරිසරය වෙනස් වනවාට කැමති නැත. අලුත් පරිසරය කොතරම් හොඳ වුවත් පැරණි තත්ත්වය තුළ ජීවත්වීම පහසු යයිද, අලුත් තත්ත්වයක් තමන්ට අමතර කරදර දෙනු ඇතැයිද සිතීම බොහෝ දෙනාගේ ස්වභාවය වේ. සියල්ලෝම වෙනසකට කැමති වුවත් වෙනස තමන් කරා පැමිණි විට ඊට දක්වන්නේ අකමැත්තකි. මෙය පුරුද්දේ බලය ලෙසද තේරුම් ගත හැක. මැක්සිම් ගෝර්කිගේ 'අම්මා' නවකතාවේ සඳහන් කරන පරිදි මිනිස්සු "තමන්ගේ අම්හිරි, දුක්බර එහෙත් නිසොල්මන් දිවි පෙවෙත" වෙනස් වේ යැයි බිය වෙති. ඊට අකමැති වෙති. පැල්පත්වල ජීවත්වන ජනයාට ඊට වඩා පහසුකම් සහිත නිවාස සංකීර්ණයක් ලබා දුන්නද පුරුදු පැල්පත් පරිසරයෙන් ඉවත්වීමට මැලිකමක් දක්වති. මිනිස් ස්වභාවය එයයි. රථවාහන අනතුරු, වැළැක්වීමට කැමති අයම 'ආසන පටි' පැළඳීමට මැලිවෙති. පරිසරයේ පිරිසිදුකම ගැන සිතන

අයම තමන්ගේ කසළ, පුරුද්දට මාර්ග අයින් දමා යාමට පෙළඹෙති. එවැනි ස්වභාවයක් සහිත මිනිස් කැලක් නව තත්ත්වයට හුරුකිරීම පහසු නැත. ඉන් අදහස් වන්නේ මිනිසුන් වෙනස් කළ නොහැකි බව නොවේ; ඒ වෙනුවට ජනතාවගේ පුරුද්දේ බලය, චින්තනයේ සම්ප්‍රදායික බව හා පැරණි ආකල්පවල බලපෑම තිබෙන විට වෙනසක් කිරීම අභියෝගයක් වන බවය.

මානව ඉතිහාසය දෙස බලන විටද එහි අත්දැකීම වන්නේ සමාජයේ වෙනස්කම් සිදුවන්නේ අපට අවශ්‍ය ආකාරයටම නොවන බවය. සමාජයක් එක තැන පවතින්නේ නැත. එය වෙනස් වෙමින් ඉදිරියට යයි. සමාජය වෙනස් නොවී පැවතියේ නම් මානව වර්ගයා තවම සිටින්නේ ප්‍රාථමික සාමූහික සමාජයේ ගණ හා ගෝත්‍ර තුළය. මානව සමාජය, සමාජ ක්‍රම රැසක් පසුකරමින් නූතන සමාජය දක්වා පැමිණ තිබේ. එහෙත් ඒ ගමන් මග වැටී ඇත්තේ විවිධ බාධා හැලහැප්පිලි මැදය.

සමාජයක් වෙනස් කිරීමේදී මුහුණ දෙන අභියෝගයන් පිළිබඳ ලෙනින් වරක් මෙසේ පවසා තිබේ.

*"සුපුරුදු ධනපති සම්බන්ධකම් පිළිබඳ පැරණි රජ දහන තුළ සිට කටයුතු කිරීම පහසුය. සරලය. නමුත් අලුත් මාවතක යාමට අපට වුවමනා වී තිබේ. එම මාර්ග යේ යාම සඳහා අප හා සියලුම ජනතාව කෙරෙහි උසස් මට්ටමක දේශපාලන විඥානයක් සහ සංවිධානයක් අවශ්‍යය. ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍ය වන අතර එහිදී වඩාත් බරපතළ වැරදි සිදුවේ. නමුත් වැරදි නොකරන්නේ ප්‍රායෝගික වශයෙන් යමක් කිරීමට ප්‍රයත්න නොදරන අය පමණක් බව අපි කියමු"*

(ලෙනින් තෝරාගත් කෘති වෙළුම 8, 149-150 පිටු)

**ඉතිහාසයේ අත්දැකීම්**

**චින්තනයේ සම්ප්‍රදායික බව හා පැරණි ආකල්පවල බලපෑම තිබෙන විට වෙනසක් කිරීම අභියෝග යක් වේ.**

**මානව ඉතිහාසය දෙස බලන විටද එහි අත්දැකීම වන්නේ සමාජයේ වෙනස්කම් සිදුවන්නේ අපට අවශ්‍ය ආකාරයටම නොවන බවය. සමාජයක් එක තැන පවතින්නේ නැත. එය වෙනස් වෙමින් ඉදියට යයි. සමාජය වෙනස් නොවී පැවතියේ නම් මානව වර්ගයා තවම සිටින්නේ ප්‍රාථමික සාමූහික සමාජයේ ඝන හා ගෝත්‍ර තුළය. මානව සමාජය, සමාජ ක්‍රම රැසක් පසුකරමින් නූතන සමාජය දක්වා පැමිණ තිබේ. එහෙත් ඒ ගමන් මග සිදුව ඇත්තේ විවිධ බාධා හැලහැප්පිලි මැදය.**

අලුත් යමක් පැවැත්මට ඒමේදී අලුත් වෙනසක් කිරීමේදී පැරණි දේවල බාධාව ඇතිවන්නේ දේශපාලනයට පමණක් නොවේ. විද්‍යාව, කලාව, ආගම්, දර්ශනය වැනි සියලුම ක්ෂේත්‍රවලදීද මෙය දැකිය හැකිය.

ලෝකය පැතලි වස්තුවක් යැයි විශ්වාස කළ අතීතයේදී, ඒ මත ආගමික ඉගැන්වීම් හා විශ්වාසයන් ගොඩනැගී තිබූ කාලයේදී ලෝකය ගෝලාකාරය යන විද්‍යාත්මක සත්‍යය පළමු වරට ඉදිරිපත් කළ විට සමාජය එම සත්‍යය වහාම පිළිගත්තේ නැත. නව මතය නිසා පැරණි වැරදි මත බිඳ වැටෙනු දුටු පැරණි මත දැරූ බලවේග නව මතය හා එය ඉදිරිපත් කළ අය සමග ගැටුමට පැමිණි අතර එහි ප්‍රතිඵලය වූයේ ලෝකය ගෝලාකාර යයි මුලින්ම පැවසූ බෲනෝ නම් දාර්ශනිකයා පුළුස්සා මැරීමය. පසුව එම මතය ඉදිරිපත් කළ ගැලීලියෝ ගැලීලිට එම මතය ඉල්ලා අස්කර ගැනීමට බල කරන ලදී. එහෙත් වසර ගණනාවකට පසු ලෝකය ගෝලාකාරය යන සත්‍යය පිළිගැනීමට ලෝකයට සිදුවිය. ඒ, එය සත්‍ය නිසාවෙනි.

ආගමික මතවලදීද මෙය අපි දැක ඇත්තෙමු. ක්‍රි.පූ. 6වෙන සියවසේදී බුදුන් (සිද්ධාර්ථ ගෞතම) බුදුදහම නමැති ආගමික දර්ශනය ඉදිරිපත් කළ විට එය පැරණි බමුණු ආගම්වලට අභියෝගයක් වූ විට බමුණු ආගම් මත දැරුවෝ බුදු දහමට මෙන්ම බුදුන්ට විරුද්ධ වූහ. බුදුන් මැරීමට තැත්කළ ඔවුහු කාන්තාවන් සම්බන්ධ කොට බුදුන්ට අපහාසද කළහ.

රෝම අධිරාජ්‍ය සමයේ ජේසුස් විසින් නව දහමක් ප්‍රකාශ කළ විට පැරණි ආගමික කණ්ඩායම්වලට එය අභියෝගයක් විය. එවිට ඔවුහු පාලකයන් සමග එක්ව ජේසුස්ට කස පහරදී අපහාස කොට කුරුසියේ ඇණ ගසා මරා දැමීමටද කටයුතු කළහ. මෙවැනි උදාහරණ රැසක් අපට ඉතිහාසයෙන් සොයා ගත හැක.

මේ සියල්ලෙන් පෙන්වන්නේ යමක් වෙනස් කිරීම කළ හැකි දෙයක් වුවත්, එය කිරීමට සිදුවන්නේ විශාල බාධා හා අභියෝග මැද බවය. ඒ තත්වය තුළ වඩාත්

සංකීර්ණ සමාජයක් වෙනස් කිරීම, අලුත් සමාජයක් නිර්මාණය කිරීම වඩාත් සංකීර්ණ කටයුත්තක් වේ. සමාජ වෙනස සිදුවන්නේ බාධා රැසක් මැද කාලයද ගනිමිනි. එබැවින් සමාජ වෙනසක් ප්‍රාර්ථනා කරන අය බාධා හමුවේ කලබල වීම හෝ බලාපොරොත්තු සිඳ ගැනීම කළ යුතු නැත. වෙනසක් කිරීමේදී නිර්මාණය වන බාධා හා අභියෝග හඳුනා ගනිමින් ප්‍රවේසමෙන්, සංයමයෙන්, ඉවසීමෙන් එහෙත් සටන අත්නොහැර කටයුතු කිරීම වෙනසක් සඳහා අත්‍යවශ්‍ය සාධක වේ. බාධා හා අභියෝග යනු සමාජ පරිවර්තනයක අනිවාරණීය "වියදම්" වේ. ඉතිහාසය ආපසු ගමන් නොකරන බවත් එය විවිධ බාධක, දුෂ්කරතා මැද පෙරටම යන බවත්, සැබෑ මිනිසුන්ගේ කාර්යය වන්නේ එකී ගමනට දායක වීම බවත් අවසාන වශයෙන් සඳහන් කළ යුතුය.

*"සුපුරුදු ධනපති සම්බන්ධකම් පිළිබඳ පැරණි රජ දහන තුළ සිට කටයුතු කිරීම පහසුය. සරලය. නමුත් අලුත් මාවතක යාමට අපට වුවමනා වී තිබේ. එම මාර්ගයේ යාම සඳහා අප හා සියලුම ජනතාව කෙරෙහි උසස් මට්ටමක දේශපාලන විඥානයක් සහ සංවිධානයක් අවශ්‍යය. ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍ය වන අතර එහිදී වඩාත් බරපතළ වැරදි සිදුවේ. නමුත් වැරදි නොකරන්නේ ප්‍රායෝගික වශයෙන් යමක් කිරීමට ප්‍රයත්න නොදරන අය පමණක් බව අපි කියමු"*

**(ලෙනින් - තෝරාගත් කෘති, වෙළුම 8, 149-150 පිටු)**





# අලුත් රට සහ පරණ මාධ්‍යය

***චින්තක ගල්කන්ද***

**ලිපියේ මාතෘකාව එක් අතකින් සරදම්කාරීය. අනෙක් අතින් කණගාටුදායකය. රට සෑම ක්ෂේත්‍රයකින්ම අලුත්වීම සඳහා වූ ප්‍රයත්නයකය. එහෙත් රටේ මතවාද නිර්මාණය කරන ප්‍රධානම ධාරාව වූ ජනමාධ්‍ය තවමත් පරණ පාරේය. එක්කෝ ප්‍රගතිශීලී සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරියේ පසුගාමීත්වය නියෝජනය කරයි; නැතහොත් ජනතාවට පසුපසින් ගාටමින් සිටියි. අතළොස්සක් හැරෙන්නට බහුතර ජනමාධ්‍යයන්හි අඩු වැඩි වශයෙන් මෙම තත්ත්වය දැකිය හැකිය. මේ ලිපිය උත්සාහ කරන්නේ ජනමාධ්‍ය එසේ වීමට බලපෑ සාධක ඓතිහාසිකව හා විෂය මූලිකව විමසා බැලීමටත් නූතන ජනමාධ්‍යයේ 'පරණ' හැසිරීම විග්‍රහ කරගැනීමටත්ය.**



ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නොනිල වශයෙන් ජනමාධ්‍ය හැඳින්වෙන්නේ 'හතරවැනි ආණ්ඩුව' ලෙසය.[01] ඒ, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණයට පසු රාජ්‍යය ඔසවා ගෙන සිටින කුලුන ලෙසය. ජනමාධ්‍ය භූමිකාව විසින් රාජ්‍යයේ නිරෝගී පැවැත්ම වෙනුවෙන් කරනු ලබන මෙහෙවර සලකා එසේ ව්‍යවහාර කරනු ලැබේ. කෙසේ වුවද ජනමාධ්‍ය එහි ස්වභාවය විසින්ම අති මහත් ප්‍රාග්ධනයක් මත ක්‍රියාත්මක ව්‍යුහයක් වන බැවින්ද සමාජය හැසිරවීමේලා එය සතු දැවැන්ත මතවාදී ශක්‍යතාව විසින්ද ඒවායේ හිමිකාරිත්වයේ අඛණ්ඩ බලපෑමට ලක්වෙයි. වත්මන් යුගය තුළ නිසැක ලෙසම එම හිමිකාරිත්වය ධනේශ්වරය සමග ගැටගැසී ඇති බැවින් (වෙළඳපොළ හෝ වෙනත් සුවිශේෂී හේතු නිසා කෙටිකාලීන ව්‍යාතිරේකයන් තිබිය හැකි වුවද) එහි වාණිජ සහ දේශපාලන වුවමනා එපාකම් නියෝජනය කරයි.

2024 නොවැම්බර් මාසයේ ශ්‍රී ලාංකේය දේශපාලනයේ සිදු වූ දැවැන්ත වෙනස්කම වන්නේ යටත්විජිත යුගයෙන් පසු ශ්‍රී ලාංකේය බල දේශපාලනය තුළ ඒ දක්වා බලය හෙබවූ දූෂිත ප්‍රභූ තන්ත්‍රය බල දේශපාලන කවයෙන් ඉවතට විසි වීමය. (මෙම කැපී පෙනෙන වෙනස හමුවේ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය භූමිකාව කවරේදැයි මෙම ලිපියේ පසු තැනක කියැවෙන බැවින් මෙහිදී විස්තර නොවේ) මෙම නව දේශපාලනයක් කරා රට ගෙනයන්නට පෙරමුණ ගත්තේ පොදු ජනතාවය; වසර 76ක දූෂිත ප්‍රභූ දේශපාලනයෙන් බැට කෑ ජනතාවය; රට බංකොලොත් වීම හමුවේ පීඩාවට හා දරිද්‍රතාවයට ඇද වැටුණු ජනතාවය. පිට පිට පැවති මැතිවරණ තුනකදීම ජනතාව තමන් දේශපාලනිකව වෙනස්වීමට සහ නව ආරම්භයක් ගැනීමට සූදානම් බව පෙන්වා දී ඇත. එම නිර්භීත තීරණය හමුවේ (සාම්ප්‍රදායික දේශපාලන මඩ ගොහොරුවක ගිල්වනු ලැබ සිටි ජනතාව විසින් ගන්නා ලද සැබැවින්ම නිර්භීත තීන්දුවකි) රට නව වෙනසකට සූදානම් වෙමින් සිටී. ආණ්ඩු තුළ පැවති ජරාජීර්ණ ප්‍රභූ වන්දනාව සහිත දේශපාලන සංස්කෘතිය වෙනස් වී ඇත; තමන්ගේ සුඛ විහරණය අරමුණු කරගත් නාස්තිකාර දේශපාලනය පිටු දකිනු ලැබ ඇත; තමන්ගේ ඥාති පරම්පරාවට දොරටු විවර කළ දේශපාලනය අවසන් වී ඇත.

කෙසේ වුවද මෙම තත්ත්වයට සාපේක්ෂව ජනතාවට මග පෙන්විය යුතු ජනමාධ්‍ය සිටින්නේ පසුපසිනි. රට නව වෙනසක් කරා එළඹුමක් ගනිද්දී බොහොමයක් ජනමාධ්‍ය ක්‍රියාකරමින් සිටින්නේ එයට බාධාකාරීව කකුලෙන් ඇදීමටය; පසුගාමීත්වය කරගසා ගෙනය; නව වෙනස වෙනුවෙන් පෙළගැසෙන ජනතාව බිය වැද්දීමටය. තමන්ගේ මාධ්‍යවලට ජනතාව විසින් පරාජයට පත්කරන ලද එහෙත් තවමත් නොනැසී පවතින බලවේග නියෝජනය කරන 'මළගිය ප්‍රාණකාරයින්' කැඳවීමටය; ඔවුන්ගේ වොයිස්කට්වලින් මාධ්‍ය

අවකාශය පිරවීමටය. මෙම මාධ්‍ය හිමිකරුවන්ගේ ප්‍රාර්ථනය මේ මියගිය ප්‍රාණකරුවන්ට හා භූත බලවේගවලට නැවත පණ පෙවීමය. තමන්ගේ මාධ්‍ය 'අධිරාජ්‍යයන්' භාවිත කොට එයට බැඳුණු දූෂිත ව්‍යාපාර ජාලයට ඇති අවදානම අවම කර ගැනීමත් එය දිගුකාලීනව තහවුරු කර ගත හැකි පරාජිත දේශපාලන බලවේග නැවත කරළියට කැඳවීමත් ඔවුන්ගේ අභිලාෂය වී තිබේ. මෙය මෙම මාධ්‍ය අධිරාජ්‍යයන්ගේ අලුත් හැසිරීමක් නොවේ. කාලානුරූපව ජනමාධ්‍ය කර්මාන්තයට අදාළ ප්‍රාග්ධන හිමිකාරිත්වයන් වෙනස් වුවද යටත්විජිත යුගයෙන් පසු ඔවුන්ගේ පොදු හැසිරීම සහ ඔවුන් සතු ජනමාධ්‍ය මෑනවීම ප්‍රගතිශීලීත්වයට එරෙහිවය; සමාජ සාධාරණත්වයට එරෙහිවය; ගතානුගතිකත්වය ආරක්ෂා කිරීමටය; ජාතික සමගියට එරෙහිවය; දූෂිත ප්‍රභූ දේශපාලනයේ ආරක්ෂාවටය.

## ප්‍රතිගාමිත්වයේ ඓතිහාසික මග

බ්‍රිතාන්‍ය යටත්විජිතයක්ව තිබී ලංකාව නිදහස ලබන අවස්ථාව වන විට (න්‍යායික හා ප්‍රායෝගික අඩුපාඩුකම් සහිතව වුවද) ලංකාවේ පැරණි වමේ ව්‍යාපාරය ශක්තිමත්ව ඉදිරියට එමින් තිබිණි. එය 1947 මහ මැතිවරණයේදී එජාපයට පමණක් දෙවැනි වන ආසන 10ක සංඛ්‍යාවක් දිනා ගත්තේය.[02] එජාපයට බහුතර ආසන නොලැබුණු තත්ත්වයක් තුළ ස්වාධීන මන්ත්‍රීවරුන්ද ඇතුළු ඉතිරි 53දෙනා එකතු කරගනිමින් ආණ්ඩුවක් පිහිටුවීමේ හැකියාවක් තිබූ බවටද එකල මත පළ වී තිබිණි. මේ මැතිවරණ ප්‍රතිඵලය ලැබෙන්නේ රජයේ ගුවන්විදුලිය හැරුණු විට ඒ වන විට එකම ජනමාධ්‍ය ඒකාධිකාරය ලෙස පැවති ලේක්හවුස් ඇතුළු පෞද්ගලික පුවත්පත් විසින් වාමාංශික පක්ෂවලට එරෙහිව ආගම්වාදී දෘෂ්ටියෙන් ගෙන ගිය දැඩි ප්‍රහාරය මධ්‍යයේය. 'මාක්ස්වාදයෙන් බුදු දහම බේරා ගනිමු' එහි මූලික තේමාව වූ අතර වාමාංශිකයින් බලයට පැමිණියහොත් වෙහෙර විහාරස්ථාන බිඳ දමා ඒවායේ ගඩොල්වලින් වෙනත් ඉදිකිරීම් කරනු ඇති බවට මතයක් සමාජයට කාන්දු කරවීය. එයින් වසර 77කට පසුව 2024දී ජාතික ජන බලවේගය ජනාධිපතිවරණයට තරග කරන අවස්ථාව වන විටද ඒ හා සමාන තේමාවකින් නමුත් අසාර්ථක ජනමාධ්‍ය මෙහෙයුමක් දියත් වී තිබීමද මෙහිලා මතකයට නගා ගත යුතුය. ඊට අමතරව ජනතාවගේ දේපළ පවරා ගනු ඇති බවටත් කම්කරු වර්ජන ව්‍යාප්ත වීම හේතුවෙන් රට අස්ථාවර වී කඩා වැටෙනු ඇති බවටත් වන අතිශය සාවද්‍ය ප්‍රචාර සමාජගත කිරීමේලා මාධ්‍ය ප්‍රමුඛ වැඩකොටසක් කළේය.

යටත්විජිත යුගයේ සිට සමාජයේ ආධිපත්‍යය හිමිකර ගෙන සිටි ප්‍රභූ සමාජ කණ්ඩායම්වලට එරෙහිව ජනප්‍රියවාදී ලෙස මතු වූ ග්‍රාමීය හා පහළ මධ්‍යම පාන්තික ජන කණ්ඩායම්වල හඬට සහ වාමාංශික ව්‍යාපාරයන්ට 1950 ගණන්වලදී පුළුල් වූ සිංහල භාෂික පුවත්පත් කර්මාන්තය ප්‍රමාණවත් ඉඩක් ලබා දුන්නේ නැත. ඒ වෙනුවට ඒවා වැඩි ඉඩක් වෙන් කළේ ජාතිවාදී හා ස්වෝත්තමවාදී ප්‍රකාශනයන්ටය. ඩී.ආර්. විජේවර්ධනගේ ලේක්හවුස් (Associated Newspapers of Ceylon Limited -ANCL) පුවත්පත් අධිරාජ්‍යය වාමාංශික ව්‍යාපාරයට එරෙහිව සූක්ෂමව මෙහෙය වූ ආකාරය එවකට දිනමිණ කර්තෘව සිටි මාර්ටින් වික්‍රමසිංහ සූරීන් තමන්ගේ 'උපන් දා සිට' ජීවිත කතාවේ මෙසේ කියයි.

"තමාගේ දුව දූෂණය කරන ලදැයි පියෙකුට විරුද්ධව නගන ලද චෝදනාවක් වරක් අවිස්සාවේල්ලේ උසාවියෙහි විබාග කරනු ලැබීය. සමසමාජ පක්ෂයත් මාක්ස්වාදයත් කෙරෙහි මිනිසුන් කලකිරවනු පිණිස මේ නඩුව වහල්කොට ගත හැකිය යි. විජේවර්ධන සිතුවේය. "ඒ නඩුව ගැන කතුවැකියක් ලියන එක හොඳ නෙවද" යි විජේවර්ධන මගෙන් ඇසුවේය.

"දිනමිණ කතුවැකියකින් ඒක විවේචනය කිරීම හොඳයයි මට

**මේ මැතිවරණ ප්‍රතිඵලය ලැබෙන්නේ රජයේ ගුවන්විදුලිය හැරුණු විට ඒ වන විට එකම ජනමාධ්‍ය ඒකාධිකාරය ලෙස පැවති ලේක්හවුස් ඇතුළු පෞද්ගලික පුවත්පත් විසින් වාමාංශික පක්ෂවලට එරෙහිව ආගම්වාදී දෘෂ්ටියෙන් ගෙන ගිය දැඩි ප්‍රහාරය මධ්‍යයේය. 'මාක්ස්වාදයෙන් බුදු දහම බේරා ගනිමු' එහි මූලික තේමාව වූ අතර වාමාංශිකයින් බලයට පැමිණියහොත් වෙහෙර විහාරස්ථාන බිඳ දමා ඒවායේ ගඩොල්වලින් වෙනත් ඉදිකිරීම් කරනු ඇති බවට මතයක් සමාජයට කාන්දු කරවීය.**




වැටහෙන්නේ නෑ" යි මම කීවෙමි.

මෙයින් මසකට පමණ පසු මම දෙසතියක නිවාඩුවක් ගත කරනු සඳහා උඩරට පෙදෙසකට ගියෙමි. නිවාඩුව අවසානයේ මම වැඩට ආවෙමි. දෙතුන් දවසකට පසු කිසියම් වුවමනාවක් සඳහා විජේවර්ධන මා කැඳවූයේය. ඇතැම් දේශපාලන පුවතක් පළමුවන පිටුවෙහි පළකරවන්ට වුවමනා වූ විට ඉංගිරිසි සිංහල පත්වල කතුවරුන් කැඳවා ඒ ගැන සාකච්ඡා කිරීම විජේවර්ධනගේ සිරිත විය. එදා එවැනි පුවතක් ගැන ඔහුගේ උවදෙස් අසා යන්ට හදන විට ඔහු සිනාසෙමින් මෙසේ කීවේය.

"අවිස්සාවේල්ලේ නඩුව දිනමිණ කතුවැකියකින් විවේචනය කරන්න වික්‍රමසිංහ බැරිය කිවුවා. වික්‍රමසිංහ නිවාඩුපිට ගියාට පස්සේ මම ඒ ගැන කතුවැකියක් ලියෙවුවා.

උඩරට ගත කළ කාලයේ මම පත්‍රය නොකියුවෙමි. මම පොත්ගුලට ගොස් දිනමිණ පෙරළා බැලුවෙමි. පියා දුව දූෂණය කරන ලදැයි යන පුවත මුල්කොට ගෙන දෙවන වරටත් ලියවුණු ඒ කතුවැකිය සම සමාජ පක්ෂය කෙරෙහි මිනිසුන් කලකිරවන්නකි. එය ලියන ලද්දේ දිනමිණ කතුකමින් අස්වී රෝගියකු ලෙස ජීවත් වූ ඇලැක්සැන්ඩර් වැලිවිට විසිනියි සහකාර කතුවරයකුගෙන් මම දැනගත්තෙමි."[03]

නිදහසින් පසු ලංකා ඉතිහාසයේ පළමු ජනතා නැගිටීම වූ 71 අරගලයට පූර්වයෙන් ප්‍රධාන ධාරාවේ පුවත්පත්වල හැසිරීම මුළුමනින්ම ප්‍රතිගාමී විය. ඔවුහු මෙම වෙනස දෙස සැකයෙන් බැලුවෝ පමණක් නොව එය විනාශ කර දැමිය යුත්තක් ලෙසට පූර්ව නිගමනයකද සිටියහ. පහත පුවත්පත් ශීර්ෂයන් පළවන්නේ අහම්බයෙන් නොවේ.

1969 වර්ෂයේ අග වන විටම ඇත්ත පුවත්පත ජනතාවට අනතුරු ඇඟවීමට ඉක්මන් වූයේ "තරුණයින් බිලි බා ගන්නා සීඅයිඒ කෙමණක්" යන ශීර්ෂ පාඨයෙනි.

"70 අගෝස්තු 11 සිලෝන් ඩේලි මිරර් පත්‍රය "චේ ගෙවාරා ව්‍යාපාරය යටපත් කිරීමේහිලා තම උත්සාහයන් උත්සන්න කිරීමට පොලීසිය තීරණය කරයි."

70 අගෝස්තු 08 වැනිදා පොලිස් අධිකාරිවරුන්ගේ සාකච්ඡාව පිළිබඳ 70 අගෝස්තු 20 සන් පුවත්පත "පොලිස්පති ජ.වි.පෙ. වංහුං සෙවීමට ඇති සැලසුම් විස්තර කරයි."

70 අගෝස්තු 20 සිලෝන් ඩේලි නිවුස් "පොලිස්පති ජ.වි.පෙ. ගැන - කැරලිකරුවන් මර්දනය කිරීමට නව නීතිරීති '

70 සැප්තැම්බර් 05 සන් පත්‍රය, "ඔත්තු සේවා ඒකක 61 ඇති කරයි"

70 සැප්තැම්බර් 19 සිලෝන් ඩේලි මිරර් "රහස් පොලිසියේ විශේෂ පරීක්ෂණ අංශය පුළුල් කිරීමට යයි"

70 ඔක්තෝබර් 05 සිලෝන් ඩේලි නිවුස් " "පොලිස් හමුදාව පන්දාහකින් තර කිරීමට යයි"

71 පෙබරවාරි 22 සන් පත්‍රය " සන්නද්ධ හමුදා සීරුවෙන් තබයි. භීෂණය පැතිරවීමේ උත්සාහයක් ගැන රජය කියයි. ජාතික ආරක්ෂක මණ්ඩලය රැස්වීමෙන් පසු පියවර ගනී."

71 මාර්තු 02 සිලෝන් ඩේලි නිවුස්; "කැරලිකාරී තත්ත්වය සමග සටන් වැදීමට විශේෂ නීති"(04)

මේ සියලු පුවත්පත් ශීර්ෂයන් 1971 අප්‍රේල් 05 අරගලයට පෙර නිකුත් වූ පුවත්පත්වල පළ වූ ඒවාය. මේ බොහෝ ඒවායේ ජ.වි.පෙ.ට 'කැරලිකරුවන්' යන වචනය යොදා තිබිණි. ඒ, කිසිදු කැරැල්ලක් සිදුවී නැතිව තිබියෙදීය. නිදසුනක් ලෙස 70 අගෝස්තු වන විටත් ලේක්හවුස් පුවත්පත් (මේ වන විට ලේක්හවුස් ආයතනය රජයට පවරා ගෙන තිබුණේ නැත) ජ.වි.පෙ. 'කැරැලිකරුවන්' ලෙස හඳුන්වා දී තිබූ අතර එය මර්දනය කළ යුත්තක් බවට අනියමින් ආණ්ඩුවට කියාපාන්නක් විය.

1970-73 කාලයේ විජේවර්ධනගේ ලේක්හවුස් ආයතනය විසින් සමගි පෙරමුණු ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති දැඩිව විවේචනය කිරීමත් සමග එය රජයට පවරා ගැනීමට ආණ්ඩුව 1973දී පනතක් සම්මත කළේය. එම පියවර ගන්නා විට ලේක්හවුස් පුවත්පත් හා සෙසු පෞද්ගලික පුවත්පත් එය පුවත්පත් නිදහසට එරෙහි රාජ්‍ය මර්දනයක් ලෙස හුවා දැක්වූවා මිස ඒ දක්වා පැවති පෞද්ගලික ඒකාධිකාරය පවා අපක්ෂපාතී නොවූ බවට සහ පුවත්පත් නිදහස ආරක්ෂා නොකළ බවට සංවාදයක් මතු කළේ නැත.

ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමෙන් පසුව එය රජයේ හොරණෑවක් බවට පත් කරගත් බවට එවකට විපක්ෂයේ එජාපය හඬ නැගූ නමුදු 1977 මැතිවරණ ජයග්‍රහණයෙන් පසු එහි රජයේ අයිතිය අත්හැරීමට කටයුතු නොකළේය. ඒ වෙනුවට විධායක ජනාධිපති ක්‍රමය යටතේ සහ විවෘත ආර්ථිකය යටතේ රජයේ හා පෞද්ගලික ජනමාධ්‍ය, ධනවාදී හා බටහිරවාදී නැඹුරුවකට ලක්කරවීය. මෙම ක්‍රියාමාර්ග අලුතින් රූපවාහිනී සංස්ථාවක් පිහිටුවීම වැනි 'නවීකරණයන්ගෙන්' ආටෝප කරවන ලද නමුත් වෘත්තීය සමිති සහ ජනතා විමුක්ති පෙරමුණ වැනි දේශපාලන ව්‍යාපාර රටේ දියුණු වීමට බාධා බවට හංවඩු ගැසීමට ඒවා බහුලව පාවිච්චි කෙරිණි. විශේෂයෙන් 1983 කළු ජූලිය එවකට එජාප ආණ්ඩුවේම නිර්මාණයක් වූ නමුදු පුවත්පත් ඇතුළු ජනමාධ්‍ය මෙහෙය වූයේ ජවිපෙ නායකත්වය ඊට වගකිවයුතු බවට තහවුරු කිරීමටය; ජවිපෙ නායකයින් 'දුටු තැන අල්ලනු' වර්ගයේ පුවත් පළ කර හැරීමටය; ජවිපෙ නායකයින්ගේ ඡායාරූප පළ කොට ඔවුන් අල්ලා දෙන කෙනෙකුට රු.50,000 ක් දෙන බව ප්‍රචාරය කිරීමටය; ජවිපෙ උතුරේ බෙදුම්වාදයට සම්බන්ධ බවට අවලාද පළ කිරීමටය. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තුළ තම හඬ ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොවූයෙන් ජවිපෙට සිදු ව තිබුණේ අතින් ලියූ පෝස්ටර් තාප්ප මත ප්‍රචාරය කිරීමටය. 80 දශකයේ අග ජවිපෙද සහිත දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය සහ ආණ්ඩුව අතර ද්විත්ව බලයක් ක්‍රියාත්මක වෙද්දී ආණ්ඩුව ජනමාධ්‍ය පාලනයේ උපරිම වාසිය ලබා ගත්තේය. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය සම්බන්ධව සහ ජවිපෙ නායකයින් අරභයා ආණ්ඩුවේ ව්‍යාජ ප්‍රචාරයන් නිල නිවේදන ලෙසම ජනමාධ්‍යයන්හි ඉඩකඩ වසා ගත් අතර අවසානයේ අත්අඩංගුවට ගත් ජවිපෙ නායක රෝහණ විජේවීර ඇතුළු නායකයින් මරා දැමීමේ සිදුවීම පවා ජනමාධ්‍ය මගින් ජනතාව දුටුවේ ආණ්ඩුව විසින් ගොතන ලද තිර පිටපතට අනුවය.

## මෑත කාලීන මුහුණුවර

නැවත අපට දූෂිත ප්‍රභූ දේශපාලනය බලයට පත්කිරීම වෙනුවෙන් කැපීපෙනෙන ජනමාධ්‍ය මෙහෙයුමක් හඳුනාගත හැකි වන්නේ 2019 ජනාධිපතිවරණය සමගය. ගෝඨාභය ජනාධිපතිවරයා බලයට ගෙන ඒමේ ව්‍යාපෘතිය තීව්‍ර වන්නේ එම වසරේ අප්‍රේල් පාස්කු දින ප්‍රහාරයත් සමගය. ජාතිකත්වයන් අතර අසමගිය, භීතිය වැපිරවීම මගින් ජාතික ආරක්ෂාව බිඳ වැටී ඇති බවටත් එය නැවත ස්ථාවර කිරීම වෙනුවෙන් ශක්තිමත් නායකයෙකු අවශ්‍ය බවටත් කෘත්‍රිම ලෙස ජනතාවට සිතවන්නට කටයුතු කෙරිණි. ආගමික පරිශ්‍රයන්ගෙන් කඩු හමුවීම, ඇතැම් සාප්පුවල ඇඳුම් හේතුවෙන් කාන්තාවන් වඳභාවයට පත්වීම, වෛද්‍යවරුන් විසින් මව්වරුන් වඳ කිරීම වැනි 'ප්‍රවෘත්තිවලින්' පුවත්පත්වල ප්‍රධාන ශීර්ෂපාඨවල සිට මුල පිටුවල ඉඩ අත්පත් කරගන්නටත් රූපවාහිනී නාලිකා ප්‍රවෘත්ති අවකාශ පිරවෙන්නටත් පටන් ගැනෙන්නේ ඒ අනුවය. මැතිවරණය පැවැත්වෙන මොහොත වන විට කැලණි ගඟ පලාගෙන නාගලෝකයේ සිට මතු වූ නාගයෙකු මහජනතාවට ප්‍රදර්ශනය කෙරුණු අතර ඒ වෙනුවෙන් දැවැන්ත මාධ්‍ය ප්‍රචාරයක්ද සිදු විය. 21වැනි සියවසේ දෙවැනි දශකයේ අග පවා මෙවැනි දේ විශ්වාස කරන ප්‍රතිගාමීත්වයකට හා පසුගාමීත්වයකට ජනතාව ඇදගෙන යාමට ජනමාධ්‍ය සමත් වී තිබිණි.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා සහ ආණ්ඩුව පලවා හැරීමෙන් අවසන් වූ ජනතා අරගලය සම්බන්ධයෙන්

පවා ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය දැක්වූයේ ඇල්මැරෙන පිළිවෙතකි. එහිම දිගුවක් ලෙස ඔවුන් එය විදෙස් අනුබලය මත දියත්වන කිසියම් කුමන්ත්‍රණයක කොටසක් ලෙස චිත්‍රණය කළහ. ආණ්ඩුවේ පොදු දූෂණයට හා දූෂිත පවුල් පාලනයට එරෙහිව සමාජය ආපසු නොහැරෙන වෙනසකට යමින් ඇති බවට පුරෝකථනයක් ජනමාධ්‍යයට තිබුණේ නැත. ඒ නිසාම අරගලයට අදාළ පුරවැසි මාධ්‍ය කටයුතුවල වැඩි දායකත්වය සමාජමාධ්‍ය වෙත බාර වීම සහේතුකය. මෙම සන්නිවේදනයන් තුළ ජාතිකත්ව සීමා නොමැති වීමට, තරුණ දායකත්වය ඉහළ යාමට හා සෘජුව දූෂිත ප්‍රභූ පාලන ක්‍රමය ප්‍රශ්න කිරීමට ඉඩ සැලසෙන්නේ ඒවා ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය නොවීම තුළය.

2024 සැප්තැම්බරයේ ජනාධිපතිවරණය කාලය පුරාවටම ප්‍රධාන ධාරාවේ බොහෝ මාධ්‍යයන්ට ජාතික ජන බලවේගයේ අනුර කුමාර දිසානායක ජයග්‍රහණය කරනු ඇති බවට මතයක් ගෙන යාමට අවශ්‍ය වූයේ නැත. ඔවුන්ගේ තෝරා ගැනීම වූයේ එවකට ජනාධිපති රනිල් වික්‍රමසිංහ හෝ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසය. පාර්ලිමේන්තුවේ තිදෙනෙකු පමණක් නියෝජනය කළ පක්ෂයක නායකයා ජනාධිපති වනු ඇතැයි ඔවුන් පුරෝකථනය නොකළා පමණක් නොව එය ඔවුන්ගේ ප්‍රාර්ථනය වූයේද නැත. අනෙක් අතින් ඔවුන්ට එය නපුරු හීනයක් විය. ප්‍රතිශතයක් ලෙස 3% ක් පමණක් ඇති පක්ෂයක් 51% ක බලයක් ලබා ගැනීමට නම් එය 1700%කින් වැඩි විය යුතු බවටත් එය ප්‍රායෝගික කටයුත්තක් නොවන බවටත් වන පුවත්, තර්ක, විග්‍රහ සහ විශ්ලේෂණ ජනමාධ්‍යයන්හි කාලය හා අවකාශය කා දමමින් තිබිණි. මේ සියල්ල පෙන්වූයේ සමාජය වෙනසකට සූදානම් වෙමින් ඇති බවට වන යථාර්ථය පිළිගැනීම ජනමාධ්‍ය බොහොමයක් විසින් ප්‍රතික්ෂේප කිරීමය.

ඒ වෙනුවට ජනමාධ්‍ය සිය අවකාශයන් භාවිත කළේ ජාතික ජනබලවේගයට එරෙහි සාවද්‍ය හා සාහසික ප්‍රචාරයන් ජන ගත කරන්නටය. නැවතත් 'නිරාගමිකයන්ගෙන් බුදු දහම බේරා ගනිමු' වැනි සටන්පාඨ කරළියට එන්නට විය. පෙරහැර නැවත්වීම, පොහොය නිවාඩුව අහෝසි කිරීම, විහාරස්ථාන සතු දේපළ අහිමි කිරීම වැනි සංවේදී ආගමික කාරණාවලට අදාළ බියවැද්දීම්වල සිට පොදුවේ ජනතාවගේ අතිරික්ත දේපළ රජයට පවරා ගැනීම, පෞද්ගලික ව්‍යාපාර පවරා ගැනීම, ඩොලරයේ වටිනාකම රු.400/= ඉක්මවීම, අයි.එම්.එෆ් රට හැර යාම වැනි ආර්ථිකයට අදාළ කාරණා සම්බන්ධයෙන්ද දේශපාලන නිදහස අහිමි කිරීම, පළිගැනීම, රට ලෝකයෙන් හුදකලා වීම වැනි දේශපාලනයට අදාළ කරුණු ගැනද ව්‍යාජ ප්‍රචාර සමාජගත කරනු ලැබිණි. මේ සියල්ල 2022 අරගලය විසින් සමාජයෙන් අපේක්ෂා කළ දූෂිත ප්‍රභූ දේශපාලනයට එරෙහි වෙනසට එරෙහිවය; පැවති දූෂිත, නාස්තිකාරී හා පවුල්වාදී දේශපාලන සංස්කෘතිය එලෙසම පවත්වා ගැනීමටය; ඉතිහාසය පුරා ඔවුන් කළ පරිදිම දූෂිත වළල්ලේ ආරක්ෂාවටය.

## නව වෙනස හා පැරණි හැසිරීම

ජාතික ජන බලවේග ආණ්ඩුව, දේශපාලන සංස්කෘතිය තුළ පැවති පැරණි භාවිතයන් මුළුමන්ම පාහේ වෙනස් කර ජනතා හිතවාදී සංස්කෘතියක් ස්ථාපිත කර ඇති අතර ආර්ථික හා සමාජීය ක්ෂේත්‍රයන් තුළ එම වෙනස්කම්



තහවුරු කර ගැනීම සඳහා පොරබදමින් සිටියි. අපේක්ෂා කළ හැකි ලෙසම එය දිගු කාලීන, නොනැවතී පොරබැදිය යුතු වෙහෙසකර ක්‍රියාවලියක් වනු ඇති බව නොඅනුමානය.

කෙසේ වුවද මෙම දුෂ්කර ක්‍රියාවලිය හුදු ආණ්ඩුවකට පමණක් සම්පූර්ණ කළ හැක්කක් නොවේ; එය සමාජයක් ලෙස එක්ව පොරබැදිය යුතු කටයුත්තකි. සමාජයන් සෙමෙන් නමුත් වෙනස් වන්නේ එවිටය. ඒ සඳහා ආණ්ඩුවේ 'සිව්වැනි කුලුනේ' දායකත්වය කවරාකාදැයි විමසා බැලුවහොත් කණගාටුදායකය. එය සිටින්නේ වෙනස වෙනුවෙන් පෙළගැසෙන ජනතාවටද පිටුපසිනි; එය වෙනසට බිය වෙයි. ජනතාව තුළද බිල්ලන් මැවීමට උත්සාහ කරයි. සමාජමාධ්‍ය යම් තරමකට මෙම ප්‍රවණතාව හඳුනාගෙන සිටියද ප්‍රධාන ධාරාවේ මාධ්‍ය බොහොමයක චර්යාව මෙබඳුය. ඔවුන්ගේ අභිලාෂය මැතිවරණ තුනකින් පරාජයට පත්, තවමත් නොනැසී පවතින දූෂිත බලවේගවල ප්‍රකාශකයා වීමටය. ආණ්ඩුව වසරකට පෙර බිඳ වැටෙනු ඇති බව කියමින් දූෂිත බලවේගවලට ප්‍රාණය පිඹි ඔවුහු දැන් එම අසාර්ථකභාවය හමුවේ 2028 වර්ෂයේ ණය වාරික ගෙවීමට සිදු වන විට ආර්ථිකය කඩා වැටෙනු ඇති බවට හීන දකිති; ඒ බව තමන්ගේ මාධ්‍යයන්ට ගෙන්වන ආර්ථික ඔස්තාද්ලා ලවා පුනරුච්චාරණය කරවති.

ඒ හැරෙන්නට ඔවුහු තමන්ගේ සියලු මාධ්‍ය ආචාරධර්ම කෙළෙසා ගනිමින් මඩටම බසිති; සත්‍යයක අංශු මාත්‍රයක් නැති 'ඕපදූප' ප්‍රවෘත්ති බවට හරවති. තමන් ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයින් ලෙස පෙන්වීම සඳහා එක් කලක තමන් විසින් පවත්වා ගත් අවම ප්‍රමිතීන් පවා ජනතාවාදී ආණ්ඩුවේ විනාශය ප්‍රාර්ථනා කරමින් අමු අමුවේ උල්ලංඝනය කරති. එදා ලේක්හවුස් හිමිකරු විජේවර්ධන මාර්ටින් වික්‍රමසිංහ විටින් විට තම කාමරයට කැඳවා පරිස්සමට කළ දෙය අද ජනමාධ්‍ය හිමිකරුවෝ සහ ඔවුන්ගේ සිතිවිලිවලින් හිතන මාධ්‍ය විධායකයෝ දිනපතා උපදෙස් දෙමින් මෙම ක්‍රියාවලිය නිර්ලජ්ජිතව පවත්වා ගනිති. ඔවුන්ගේ පුවත් හැසිරවීම (Manipulation) විධිමත් ආකාරයකින් මෙසේ විමසා බැලිය හැකිය.

01. අසත්‍ය පරාවර්තනය (False Reflection)

සත්‍ය නොවන තොරතුරු හෝ සිදුවීම් යථාර්ථය ලෙස ප්‍රකාශ කරන මෙම මාධ්‍ය කෙනකුගේ මතය අසත්‍ය ලෙස ප්‍රචාරය කරති; නෛතික වශයෙන් බොරු ප්‍රකාශ කරති; ඡායාරූප හෝ වීඩියෝ සංස්කරණය කිරීම මඟින් සිදුවීම් වෙනස් කරති; ව්‍යාජ මූලාශ්‍ර භාවිත කරති.

මේ අසත්‍ය පරාවර්තනය පිළිබඳව කියුබානු නායක ෆිදෙල් කැස්ත්‍රෝ මෙසේ කියා තිබිණි.

"ජනසන්නිවේදනය ලොව පහළ වූ විට ඔවුන් ජනතාවගේ මතය තමන්ගේ අත්අඩංගුවට ගත්තා. ඔවුන් ජනතාවගේ මනස පාලනය කළේ හුදෙක් බොරුව පදනම් කරගෙන නොව එහෙත් සාවද්‍ය පරාවර්තනද උපයෝගී කරගෙනයි. ජනමාධ්‍යවලින් කරන්නේ බොරු කීම පමණක් නොව සාවද්‍ය පරාවර්තනයක් ඇතිකිරීමයි. බොරුව දැනුම මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. සාවද්‍ය පරාවර්තනය මගින් සිතීමට ඇති හැකියාව මත සෘණාත්මකව බලපානු ලබනවා."(05)

02. තේරීමේ විකෘතිකරණය (Selective Distortion)

තොරතුරු හෝ සිදුවීම්වලින් තමන්ට කීමට අවශ්‍ය දේ තහවුරු කිරීම සඳහා තෝරා ගත් කොටස් පමණක් ගන්නා ඔවුහු අනෙකුත් අංශ අතුරුදන් කරති නැතහොත් නොවැදගත්භාවයට පත්කරති. ඇතැම් දත්ත පමණක් පෙන්වා දී සමස්ත තොරතුරු අතුරුදන් කරති; සන්දර්භයෙන් ඉවත් කළ උධෘත භාවිත කරති; එක් පාර්ශ්වයක හඬ පමණක් ඉස්මතු කරමින්, ප්‍රතිවිරුද්ධ හඬ නොසලකා හරිති. එක් කලෙක මාධ්‍යයේ සදාචාරය වූයේ යම් පුවතකට කෙනෙකු හෝ ආයතනයක් ඉලක්ක වන්නේ නම් ඔවුන්ගේ අදහස් ලබා ගැනීමකින් තොරව පුවත පළ නොකර සිටීමය. අවම වශයෙන් විමසීමට උත්සාහ කළද ප්‍රතිචාරයක් ලබා ගැනීමට නොහැකි වූ බව සටහන් කිරීමය. දැන් එසේ නොවේ. වගකීම් විරහිතව පුවතේ වින්දිතයා කෙළින්ම පොල්ලෙන් ගසා එමතුද නොව එල්ලුම් ගස්ද යවති.

03. අතිශයෝක්තිය (Exaggeration)

ඔවුහු සිදුවීම් හෝ තොරතුරු තමන්ගේ අවශ්‍යතාව පරිදි තීව්‍රතාව වැඩිකොට පෙන්වති; එකම සිදුවීම නැවත නැවතත් දින ගණනාවක් තිස්සේ ඉස්මතු කරති; සමාජය භීතියට පත්වන අන්දමේ කරුණු මතුකරති; මහජනතාව අතිශය සංවේදී වන ලෙස හා අතිශයෝක්තියෙන් යුතුව වාර්තා කරති.

04. සන්දර්භය මාරු කිරීම (Context Manipulation)

යම් සිදුවීමකට අදාළ කිසිදු ප්‍රවෘත්තිමය සන්දර්භයක් නොතිබුණද ඒ වෙනුවට වෙනත් කරුණු සම්බන්ධ කරමින් ඒවායේ සන්දර්භය වෙනස් කරන ඔවුහු

එමගින් මුළුමනින්ම වෙනස් විකෘති අදහසක් එන පරිදි අර්ථකථනය කිරීමට දක්ෂ වෙති.

05. සන්දර්භයෙන් ඉවත් කිරීම (Decontextualization) හා සන්දර්භයේ කාලය සැඟවීම

ප්‍රකාශයක් හෝ සිදුවීමක් එහි සම්පූර්ණ පසුබිමෙන් ඉවත්කර 'ප්‍රවෘත්තියක්' නිර්මාණය කරන ඔවුහු එමඟින් එයට වෙනස්ම අර්ථයක් ලබා දෙති. පැරණි සිදුවීම් හා ප්‍රකාශ වර්තමාන සන්දර්භයක යොදා ප්‍රසිද්ධ කරති; යම් ස්ථානයකදී කරන ලද ප්‍රකාශයක් වෙනත් ස්ථානයකට අදාළ පුවතකට බද්ධ කරති.

06. අතුරුදහන් කිරීම (Omission)


සිදුවීම තේරුම් ගැනීමට අදාළ වැදගත් තොරතුරු හෝ සිදුවීම් එයින් ඉවත් කරන හෝ ඇතුළත් නොකරන ඔවුහු එමගින් තමන්ගේ ග්‍රාහකයා නොමග යවති. දේශපාලන, පවුල් හා ඥාති සබඳතා සැඟවති; සිදුවීමට අදාළ ස්ථානය සඟවති.

07. භාෂාත්මක විකෘති කිරීම (Linguistic Distortion)

වාර්තාකරණයේදී හැඟීම්බර හෝ අවමන් සහගත වචන පාවිච්චි කරන ඔවුහු භාවාත්මක (Loaded Language) වචන හෝ අවමන් සහගත වචන භාවිතය මගින් තමන්ගේ පාඨකයා, ප්‍රේක්ෂකයා හෝ ශ්‍රාවකයා සංවේදී කිරීමට උත්සාහ කරති; අපහාසයට ලක් කිරීම වෙනුවෙන් අවමන් සහගත වචන භාවිත කරති; උද්ධෘත වෙනස් කිරීම මගින් හෝ අර්ථ විකෘති කිරීම මගින් නොමග යවති. ඔවුන් ජනතාවගේ මොළ සෝදන්නට හදන අයුරු මෙබඳුය.

**පුනරාගමනයේ ප්‍රහසනය**

මේ සියලු ආකාරයේ විකෘති කිරීම් මගින් දූෂිත දේශපාලකයින් නැවත වරක් විශ්වාස කරන ජනතාවක් නිර්මාණය කරගත හැකි වෙතැයිද දූෂිත වළල්ලේ පැවැත්ම



තවත් කාලයකට පවත්වා ගත හැකි වෙතැයිද ඔවුහු අපේක්ෂා කරති. රටට දැවැන්ත වෙනස්කම් අපේක්ෂා කළද තමන්ගේ කලාපයට අයත් දේ නොවෙනස්ව පැවතිය යුතු බවට වන මහජනතාවගේ පොදු වෙනස්වීමට අකමැති මනෝභාවය සන්තර්පනය කරමින්ද විවිධ හේතු පදනම් කරගනිමින් අතෘප්තියට පත් කුඩා කුඩා කණ්ඩායම් ඒකරාශි කර සමස්ත දේශපාලන වෙනසට එරෙහිව පෙළගැස්විය හැකියැයි ඔවුහු මනෝරාජිකව ගණන් බලති.

ඔවුන්ගේ ගණන් බැලීමට තර්කයක් ඇත. ඒ, ඔවුන් ඉතිහාසයක් පුරා මතවාදී ආධිපත්‍යය දැරීමෙහිලා ඉටු කළ කාර්යභාරයයි; ඔවුන් එහිලා අත්කරගත් සාර්ථකත්වයයි. 1947 වර්ෂයේ සිට ඔවුහු එය හොඳින් අත්හදා බැලූහ. ඔවුන් දශක හතක කාලයක් භාවිතයේ යෙදුවේ 'ඔවුන්ගේ' පුවත්පත් (ජනමාධ්‍ය) නිදහසයි. ලෙනින් මෙම යාන්ත්‍රණය පිළිබඳව මෙසේ කියයි.

"ධනවාදී ව්‍යවහාරය අනුව පුවත්පත් නිදහස යනු පුවත්පත අල්ලසට ගැනීම සඳහා පොහොසතුන්ගේ නිදහසයි. ඊනියා මහජන මතය හැඩගස්වන්නටත් ගොතන්නටත් ඔවුන්ගේ වස්තුව පාවිච්චි කිරීම සඳහා වන නිදහසයි."(06)

"කඩදාසි තොගත්, මුද්‍රණ යන්ත්‍රත් ධනපති පංතිය අතේ තිබෙනතුරු පුවත්පත් නිදහස යන්න මහත් බොරුවකි. ලෝකය පුරාම ධනපතීන් සිටින ඕනෑම තැනක පුවත් නිදහස යන්නෙන් අදහස් කෙරෙන්නේ පුවත්පත් ආයතන මිලට ගැනීමේ නිදහසයි. ලියන්නන් මිලට ගැනීමේ නිදහසයි. ධනපති පංතියේ වාසිය සඳහා අල්ලස් දී මිලට ගෙන මහජන මතය වෙනුවෙන් රැවටිල්ලක් ඉදිරිපත් කිරීමේ නිදහසයි."(07)

මේ 'පුවත්පත්' යනුවෙන් නාමකරණය වන සෑම තැනකටම 'ජනමාධ්‍ය' යන වචනය යොදා ගත් විට මෙම ප්‍රකාශ වත්මන් ජනමාධ්‍යකරණය වටහා ගැනීමට උපයෝගී කර ගත හැකිය. එසේම ගෝලීය වෙළඳපොළ ඔස්සේ පුළුල් වූ සමාජ මාධ්‍ය අවකාශය විසින් ප්‍රධාන ධාරාවේ මාධ්‍යයන්හි වැදගත්කම පහළට කැඳවද්දී එම ප්‍රධාන ධාරාවේ මාධ්‍යවලට පවා තම ප්‍රාග්ධන බලය යොදමින් සමාජ මාධ්‍ය වෙත අවතීර්ණ වීමට සිදුව තිබේ.

කෙසේ වුවද මේ ජනතාව වෙනස් ජනතාවකි. මතවාදී තලයේ අඩු වැඩිකම් තිබියෙදී වුවද ඔවුන් ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මෙහෙයුමට එරෙහිව උඩුගම් බලා පිහිනමින් තම ජීවිත කාලයේ නිර්භීතම තීන්දුව ගෙන ජාතික ජන බලවේගය බලයට රැගෙනවිත් ඇත. ඉදින් පැරණි අර්ථයෙන් අල්ලස් දී තමන්ගේ වුවමනා එපාකම් වෙනුවෙන් ජනමතය මිලට ගත හැකි යැයි මාධ්‍ය හිමිකරුවන් සිතා සිටී නම් එය වැරදීමක් වනු ඇත. බෲමර් 18 කෘතියේ කාල් මාක්ස් ඉතිහාසයේ සිදුවීමක් පළමුව ඛේදාන්තයක් ලෙසද දෙවෙනුව ප්‍රහසනයක් ලෙසද සිදුවන බව කියයි. ඒ අනුව රට විසින් ඉල්ලා සිටින, නව දේශපාලන අධිකාරිය විසින් යෝජනා කෙරෙන වෙනසට එරෙහිව කඳවුරු බැඳීමට 'පැරණි' ජනමාධ්‍ය ඒකාධිකාරයන් විසින් ගන්නා විකට උත්සාහයද ඉතිහාසයේ ප්‍රහසනයක් ලෙසට සනිටුහන් වනු නොඅනුමානය.

ඉදින් ජනමාධ්‍යද තමන්ගේ පැරණි හැව ගලවා රූපාන්තරණය විය යුතුව ඇත. දැන් තෝරාගැනීම් බොහොමයක් නැත. ඇත්තේ ජනතාව, ජනමාධ්‍ය බසින් තමන්ගේ ග්‍රාහකයින් වෙනස් වී ඇති බව තේරුම් ගනිමින් රට ඉල්ලා සිටින වෙනස සමග පෙළගැසීමය. තමන්ගේ කැමැත්ත හෝ අභිලාෂයන් ග්‍රාහකයන් මත පැටවීමේ පැරණි භාවිතයට නොගොස් ඔවුන් වඩා දියුණු මාධ්‍ය භාවිතයක් හා මාධ්‍ය සංස්කෘතියක් වෙත කැඳවීමය. තම ජනමාධ්‍ය තුළ ආචාරධාර්මිකභාවය උපරිමයෙන් පවත්වා ගැනීමය. මාධ්‍යවේදීන් ඕපාදූප ප්‍රවෘත්ති බවට පත් කරන තැනට ඇද නොදමා තම ආයතයන්හි මාධ්‍යවේදීන්ගේ වෘත්තීමයභාවය ඉහළ නංවා ගැනීමය. ග්‍රාහකයින්ගෙන් ප්‍රතික්ෂේප නොවීමේ එකම මග එයය.


මූලාශ්‍ර:

(01) https://en.wikipedia.org/wiki/Fourth_branch_of_government

(02) https://en.wikipedia.org/wiki/1947_Ceylonese_parliamentary_election

(03) උපන් දා සිට - මාර්ටින් වික්‍රමසිංහ, 1961, 299-300 පිටු

(04) පක්ෂයේ ඉතිහාසය 1965-1994 - ජනතා විමුක්ති පෙරමුණ, 2012, 45-46 පිටු

(05) මගේ ජීවිතය - ෆිදෙල් කස්ත්‍රෝ, 2008, 835-836 පිටු

(06) පුවත්පතේ නිදහස ගැන - ලෙනින් හා ට්‍රොස්කි, වී. කරාලසිංහම්, 1973 (එකතු කළ කෘති, 28 වෙළුම, 460-461 පිටු)

(07) පුවත්පතේ නිදහස ගැන - ලෙනින් හා ට්‍රොස්කි, වී. කරාලසිංහම්, 1973 (එකතු කළ කෘති, 32 වෙළුම, 504-509 පිටු)



# වෙනස අවැසි නම් මැද කණ්ඩායම කියවමු!

***වෛද්‍ය සුසිල් රණසිංහ***

2024 නොවැම්බර් මාසයේ අපේ රටේ ජනතාව වාමාංශික පදනමක් සහිත ජාතික ජන බලවේගයට පාලන බලය ලබාදෙමින් කාරණා කීපයක් අපේක්ෂා කළහ. යහපත් ආණ්ඩුකරණය, රට ආර්ථික වශයෙන් ඇද වැටී තිබුණු තැනින් ගොඩගැනීම මෙන්ම ප්‍රධානතම ජනතා අපේක්ෂාව වුයේ අපේ රටේ ගැඹුරු සමාජ වෙනසක් ඇති කිරීමය.

ටොෆි කොළයක්වත් බිම නොදමන තරමට පරිසරයට ආදරය කරන පුරවැසියන්, සුහදව සහ  කාර්යක්ෂමව කටයුතු කරන  රාජ්‍ය සේවකයින්ගෙන් සමන්විත රාජ්‍ය ආයතන, වාහන පැදවීමේදී ශීලාචාර මෙන්ම මාර්ග විනය පිළිපදින රියදුරන්, සාධාරණ මෙන්ම පාරිභෝගිකයන් නොරවටන වෙළඳාම් සිදුවෙන වෙළඳසල් වැනි මතුපිටට පෙනෙන වෙනස්කම්වල සිට විභාග පාදක අධ්‍යාපනයෙන් පීඩාවට පත්ව සිටින දරුවන්ට ඒ වෙනුවට ලෝකයේ දියුණුතම අධ්‍යාපන ක්‍රමයක්, ලෝකයේ දියුණු රටවල්වලට නොදෙවෙනි වන ඩිජිටල්කරණයක් ආදී ගැඹුරු ප්‍රතිසංස්කරණයන් දක්වා පුළුල් පරාසයක වෙනසක් ජනතාව අපේක්ෂා කළහ.


මෙසේ අපේක්ෂා කරන පරිවර්තන කර්තව්‍ය සරල හෝ සුගම නැති බව අප සැවොම අවබෝධ කරගත යුතුය. එකී පරිවර්තන කටයුත්තට බාධා, අභියෝග කවරාකාර වනු ඇතිද යන්න පිළිබඳ හොඳ අවබෝධයක් ද අපට තිබිය යුතුය.

විශේෂම කාරණය වන්නේ පූර්ණ සමාජ පරිවර්තනයකට අදාළ බලහුවමාරුවක් වෙනුවට මේ මොහොතේ සිදුව ඇත්තේ පවතින ධනේශ්වර සමාජ ආර්ථික ක්‍රමය තුළම ආණ්ඩු බලය පමණක් වාමාංශික පදනමක් සහිත බලවේග යක් වෙත මාරුවීමකි. එමෙන්ම ආර්ථික වශයෙන් බංකොලොත් කරන ලද පසුගාමී ධනේශ්වර සමාජ දේහයක සිට දියුණු සමාජ හර පද්ධතීන් දක්වා එක් රැයකින් පරිවර්තනය වියයුතු යැයි සිතන විශාල ජනතා අපේක්ෂාවකි.

කෙසේ වෙතත් ඉහත සඳහන් කළ සන්දර්භයට යටත්ව අපේ රටේ යම්දුරක් දක්වා වූ සමාජ වෙනසකට ඉඩකඩ මේ පාලන බලය වෙනස්කිරීම තුළ අඩංගුව තිබේ.

සමාජයේ යම් යම් වෙනස්කම් අරමුණු කරගනිමින් සමහර නීති, අණපනත් මෙන්ම රාජ්‍ය නියෝග කෙටිකලකින් සිදු කළහැකිය. සමහර ක්‍රියාමාර්ග එක රැයකින් ගතහැක. එහෙත් සමාජයක් වෙනස්  කිරීම නීති, අණපනත්, නියෝගවලින් පමණක් කළ හැකි නොවන අතර ඒ සඳහා 'අලුත් මිනිසෙක්' බිහිකළ යුතුය. අපේක්ෂිත සමාජ වෙනසෙහි ප්‍රධාන අභියෝගය වන්නේ මෙයයි.

සමාජයේ සිදුවිය යුතු වෙනස පිළිබඳව සැලකිල්ලට ගත්කල සමාජ කණ්ඩායම් කිහිපයක් අපට නිරීක්ෂණය කළ හැක. ඒ ප්‍රධාන කණ්ඩායම් ත්‍රිත්වයකි. වෙනස ඉහළින්ම අපේක්ෂාකරන, ඒ වෙනසට යාමට තමන්ද වෙනස්විය යුතු බව අවබෝධ කරගත්, ඒ සමාජ වෙනස වෙත වෙනස්වෙන්නට සූදානම්, ස්ථාවර පිරිසක් සිටී. ඔවුන් හුදෙක්ම බලය හොබවන ජාතික ජනබලවේගයේ සාමාජිකත්වයම යැයි අර්ථ දැක්වීමට ඉක්මන් නොවිය යුතුය. එකී සාමාජිකත්වය වටා



> **අපේ රටේ සමාජ වෙනසකට අකමැති, ඊට බාධා කරන කණ්ඩායම ආමන්ත්‍රණය කරන්නේ මෙකී "මැද කන්ඩායමට"ය. සමාජ වෙනස සාර්ථක කරගැනීම වෙනුවෙන් දිනාගත යුත්තේද මෙකී "මැද කන්ඩායම"යි.**
> **එහෙයින් සමාජය වෙනස්වීමට නම් තමන්ද වෙනස්විය යුතු බවට ඔවුන් හොඳ අවබෝධයක සිටීද? වෙනස් වන්නට ඔවුන් බිය ඇයි? වෙනස්වන්නට ඔවුන්ගේම අභ්‍යන්තරය තුළ ඇති බාධා මොනවාද යන්න ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙන්ම ඒ සඳහා වන ක්‍රියාමාර්ග හරහා එකී "මැද කණ්ඩායම" වහ වහා දිනා ගැනීම අනිවාර්යය.**

පෙළගැසුණු පොදු ජනතාවද සහිත බලවේගය මේ සමාජ වෙනස සිදුකිරීමෙහිලා ගාමක බලවේගයයි.

දෙවන කණ්ඩායම වන්නේ වෙනස අපේක්ෂා නොකරන, ඊට එරෙහි, වෙනසක් සිදුවුව හොත් තමන්ගේ පැවැත්ම තර්ජනයට ලක්වන හෙවත් පවතින ඔද්දල් ක්‍රමයෙන්ම යැපෙන්නන් සහ ජීවත්වන්නන් ගෙන් සැදුම්ලත් වෙනසට බාධාකරමින්, සෝෂා කරන කණ්ඩායමයි.

අපේ අවධානය යොමු විය යුත්තේ මෙකී කණ්ඩායම් දෙක අතර සිටින වෙනස දෙස සුබවාදීව දකින, එහෙත් ඔවුන් දැන හෝ නොදැන වෙනස වෙත යාමේදී තමන් වෙනස්වන්නට මැලි හෝ දෙගිඩියාවෙන් පසුවන අතරමැද පසුවන කණ්ඩායම හෙවත් තුන්වන කණ්ඩායමයි.

ලිපියේ මුලින්ම කී පරිදි පවතින පසුගාමී ධනේශ්වර සමාජ සන්ධර්භයට හා බලය හුවමාරුවේ ස්වාභාවයට අනුව මෙම මැද කණ්ඩායම සාපේක්ෂව තරමක් ප්‍රමාණයෙන් විශාල බව නිරීක්ෂණය කළ යුතුය.

අපේ රටේ සමාජ වෙනසකට අකමැති, ඊට බාධා කරන කණ්ඩායම ආමන්ත්‍රණය කරන්නේ මෙකී "මැද කණ්ඩායමට"ය. සමාජ වෙනස සාර්ථක කරගැනීම වෙනුවෙන් දිනාගත යුත්තේද මෙකී "මැද කණ්ඩායම"යි.

එහෙයින් සමාජය වෙනස්වීමට නම් තමන්ද වෙනස් විය යුතු බවට ඔවුන් හොඳ අවබෝධයක සිටීද? වෙනස් වන්නට ඔවුන් බිය ඇයි? වෙනස් වන්නට ඔවුන්ගේම අභ්‍යන්තරය තුළ ඇති බාධා මොනවාද? යන්න ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙන්ම ඒ සඳහා වන ක්‍රියාමාර්ග හරහා එකී "මැද කණ්ඩායම" වහ වහා දිනා ගැනීම අනිවාර්යය.

මෙසේ අප ඉලක්ක කරගත යුතු මැද කණ්ඩායම මේ සමාජය වෙනස් කිරීම අරබයා සිතන-පතන, හැසිරෙන සහ ඒ සම්බන්ධයෙන් ඔවුන් දක්වන ආකල්ප කෙබඳු දැයි පසුගිය වසරක ආණ්ඩුකරණයේ දී පහත අත්දැකීම්වලින් හොඳින් විද්‍යාමාන වේ.

අපේ රටේ රථවාහන අනතුරු නිසා දිනකට දළ වශයෙන් අට දෙනෙක් මියයති. බරපතල තුවාල ලබන, සුලු තුවාල ලබන, තුවාල නොලබා සිදුවන රථවාහන අනතුරු ආදී සියල්ලේ එකතුව වසරකට ලක්ෂ ගණනකි. පාරවල්වල වාහන ධාවනයේදී නීතියට අනුගතව රථවාහන පදවන පුද්ගලයින් ගණන අතළොස්සකි. අනෙකුත් සියලු දෙනා අනතුරු සිදු නොකර ගනිමින් යහමින් රථවාහන නීති මෙන්ම රීතීන්ද උල්ලංඝනය කරති. එසේ කරන ගමන්ම "තමන් හැර අනෙක් සියල්ලෝම වැරදි කරුවන්", "නිසි විනයක් නැති මිනිසුන්" ලෙස අර්ථ දක්වමින් එළිපිට හෝ සිත යටින් දෙස් තබති. එහෙයින් ඉතා කෙටි ගමනක් යාමට පවා මහමගට පිවිසීම, විනයක් නොමැති රියැදුරන්ගේ නොමනා ක්‍රියාකලාපයන් නිසා කනස්සල්ලට හෝ කෝපයට පත්ව පීඩනයකට ගොදුරුවීමේ සංසිද්ධියක සිට මාරාන්තික අනතුරකට මුහුණදීම දක්වා අවදානමක් සහිත දෙයකි.

මේ තත්ත්වයෙන් විඳින පීඩාව නිසාම අලුත් ආණ්ඩුව මේ දේවල් වෙනස් කරනු ඇතැයි බොහෝ දෙනා අපේක්ෂා කළහ. ඇත්ත වශයෙන්ම ඒ වෙනස ආරම්භ කළ යුත්තේ කොතැනකින්ද? එවැනි එක් ස්ථානයක් නම් අධිවේගී මාර්ගවල දී රථවාහන නීති රීති අනුගමනය කිරීම විධිමත් කිරීමයි.

අධිවේගී මාර්ගවල සිදුවුණ අනතුරු පාදක කරගෙන ප්‍රවාහන අමාත්‍යාංශය අධිවේගී මාර්ගවල ගමන් ගන්නා වාහනවල සීට් බෙල්ට් අනිවාර්ය කරන ලදී. ක්‍රමිකව බස්රථවල රියැදුරන්ද, ඊළඟට පසුපස සීට්වල ගමන්ගන්නා අයවලුන් මෙන්ම බස්රථවල මගීන්ද, සීට් බෙල්ට් පැළඳීම අනිවාර්ය කරනු ලැබීය.



මාර්ග අනතුරු, මාර්ගවල ගමන් ගනිද්දී සිදුවන මානසික පීඩාවන් ගෙන් හෙම්බත්ව ඒවා වෙනස් කරන ලෙස විශාල අපේක්ෂාවකින් සිටින සමාජයක් එක පයින් මේ සිදු කරනු ලැබූ වෙනස්කම් වැළඳගත යුතු නොවේද? එහෙත් ඒ සඳහා බස්රථ රියැදුරන්, බස්රථ හිමිකරුවන් සහ මගීන් දක්වන ලද ප්‍රතිචාරය කුමක්ද?

"බස් රථවල සීට් බෙල්ට් නැත". "සීට් බෙල්ට් සවිකිරීමට මුදලක් වැයවේ. එවිට කර්මාන්තය පාඩු ලබයි". "සීට් බෙල්ට් සවිකිරීමට කාලයක් ගතවේ" යැයි කරුණු දක්වමින් බස් සංගම් විරෝධතාවලට පවා කැසකවනු ලැබිණි. පොලිසිය විසින් සීට් බෙල්ට් පරීක්ෂා කරන නිසා සීට් බෙල්ට් පැළඳ ඇති බව හැඟවීමට සමහරු සීට් බෙල්ට් ඇඟ හරහා ව්‍යාජ ලෙස තබාගෙන ගමන් කරති.

අපේ රටේ රැකියා ලබාදීම් විශේෂයෙන් බොහොමයක් රජයේ රැකියා ලබාදීම් එවක තිබූ ආණ්ඩුවල දේශපාලන හිතවත්කම් මත සිදුවිය. සෞඛ්‍ය සහායකයින් සෞඛ්‍ය ඇමතිගේ දිස්ත්‍රික්කයෙනි. ලංගමට සේවකයින් ප්‍රවාහන ඇමතිගේ ලිස්ට්වලිනි. ලංවීම, තෙල් සංස්ථාව, වරාය, මහවැලි අධිකාරිය ආදී සංස්ථා, මණ්ඩල, අධිකාරී ආදී වශයෙන් අර්ධ රාජ්‍ය ආයතනවල මෙය යහමින් සිදුවිය. දෙපාර්තමේන්තුවලට කොන්ත්‍රාත් හා අනියම් ලෙස බඳවා ගැනුණි. ප්‍රධාන පුටුවලට උසස්වීම්ද, බොහෝ තනතුරුවල මාරුවීම්ද සිදුවුණේ දේශපාලන වුවමනාවන් හා හිතවත්කම් මතය. අපේ රටේ රාජ්‍ය සේවය බිඳවැටෙන්නට මෙය විශාල වශයෙන් ඉවහල් වූ අතර රැකියාවකට බැඳෙන්නට සුදුසුකම් තිබෙන, දේශපාලන සබඳකම් නොමැති  හා විශේෂයෙන්ම පැවති ආණ්ඩුවල දේශපාලනයට විරුද්ධ අයට රැකියාවකට බැඳීමේ දී විශාල අසාධාරණයක් බවට මෙකී තත්වය පත්ව තිබිණි. පැවති දේශපාලනයට එරෙහිව අරගලයක් සිදුවූයේ සහ ආණ්ඩු මාරුකරන ලද්දේ මේ මජර දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමටය.

නව ආණ්ඩුව රජයේ රැකියා අසූදාහකට ආසන්න සංඛ්‍යාවක් සඳහා බඳවාගැනීමට තීරණයකර ඇති අතර ඒ සියල්ල අනුමත, පිළිගත් ක්‍රමවේදයන්ට අනුව අයදුම්පත් කැඳවමින්, තරග විභාග, සම්මුඛ පරීක්ෂණ ආදිය පවත්වා සුදුසුකම් මත, කිසිදු දේශපාලන මැදිහත්වීමකින් තොරව බඳවාගැනීමට කටයුතු සැලසුවේය.

කිසිදු ස්ථාන මාරුවක් හෝ උසස්වීමක් මැති ඇමතිවරු දේශපාලකයින්ගේ වූවමනාවට සිදු නොකර අදාළ ක්‍රියාපටිපාටීන්වලටම සිදුකිරීමට පියවර ගත්තේය. එහෙත් එය සමාජය කොතරම් දුරකට වැළඳගත්තේද? කොතරම් දුරකට ඊට අනුගත වුණේද? යන්න ගැටලුවකි. රැකියාවක් ලබාදෙන ලෙස උපාධිධාරීන් පවා තොග පිටින් මැති ඇමතිවරුන්ගේ මහජන සම්බන්ධීකරණ කාර්යාලවලට ද, නිවෙස් වෙතද පැමිණෙන්නට වූහ.

හිතවත්කමක්, නෑදෑකමක් මාර්ගයෙන් හෝ හිතවතෙකුගේ හිතවත්කමක් හරහා මැති ඇමතිවරුන් ගේ පුද්ගලික කාර්යමණ්ඩලයේ කෙනෙක්ගේ

හිතවත්කමක් හෝ සොයන්නට වූහ. තම දුර නෑදෑයෙකු ඉතිහාසයේ දී ජවිපෙ දේශපාලනයට සම්බන්ධ වී සිටි බවට සාක්ෂි මෙන්ම පීඩා විඳි බව උලුප්පමින් රැකියාවක් ලබාදෙන ලෙස ලිපියක් සකසාගෙන මැතිඇමති වරුන් හමුවන්නට පැමිණෙන්නට වූහ.

එමෙන්ම රාජ්‍ය ආයතනයකින් යම් කටයුත්තක් කරගැනීමට අවශ්‍ය වූ විටද හිතවතෙක් හෝ දේශපාලන මැදිහත්වීමක් සොයායාම අපේ රටට මහත් හිසරදයක් වී තිබිණ. ඒ දේශපාලන සංස්කෘතිය වෙනස්කිරීමේ වුවමනාවෙන් මේ නව ආණ්ඩුව පත්කර ගැණුනි. එහෙයින් ඒ සඳහා ආශිර්වාද කරනවා වෙනුවට මේ නව පාලනය තුළදීත් ඇතැම් අයගේ අපේක්ෂාව රාජ්‍ය ආයතනයකට යාමට පෙර හිතවතෙක් හෝ දුරින් වන හිතවත්කමක් සොයාගැනීමය. එසේත් නොමැතිනම් අසීරු පියවර ගණනාවක් හරහා හෝ මන්ත්‍රීවරුන් ඇමතිවරුන් වෙත ළඟාවී දේශපාලන මැදිහත්වීමක් ලබාගැනීමයි.

රාජ්‍ය සේවාව විධිමත් කිරීමට නම් රාජ්‍ය සේවකයෝ තම කාර්යාලවල රැඳෙමින් නිසි පරිදි ඔවුන්ගේ සේවාව ජනතාව වෙත සපයනවාදැයි අධීක්ෂණය කළ යුතු යැයි  සමහර රාජ්‍ය සේවක කණ්ඩායම් විසින්ම යෝජනා කරති. එහෙත් එසේ යෝජනා කරන ඔවුන්ගේ සේවාව අධීක්ෂණයට ක්‍රමවේද හඳුන්වා දෙනවිට ඊට උරණ වෙති. මෙසේ සමහර කණ්ඩායම් අනෙක් අයගේ වෙනස්වීම අගය කරති. එමෙන්ම ඒ සඳහා බලපෑම් ද කරති. එහෙත් වෙනස්වීම තමන් ළඟට ආ විට එය ප්‍රතික්ෂේප කරන, ඊට එරෙහි වන අවස්ථා ඕනෑ තරම් ගෙවුන වසර තුළ දක්නට ලැබුණි.

බදු ගෙවිය යුතු අයට බදු ගෙවීම සඳහා ක්‍රමවේද ඉදිරිපත්කළ විටද, පැමිණීමේ වේලාව සටහන් කිරීමට ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකිරීමටද, සමහර සේවාවන්වල ස්ථාන මාරු ක්‍රියාත්මක කරන විටදීද, වාහනවල නීති විරෝධී කොටස් ඉවත්කරන විටදීද එම ක්‍රියාමාර්ගවලට එරෙහිව උද්ඝෝෂණ, වැඩවර්ජන සිදුකෙරුණා ඔබට මතක ඇත.

පොදු නීති පද්ධතියක හෝ පොදු ක්‍රමවේදයන්ට යටත් නොවී තම වෘත්තියේ හෝ කුලකයේ පැවැත්ම සහ වටිනාකම් විහිදා පෑමට මෙන්ම විශේෂ වරප්‍රසාද ආරක්ෂා කර ගැනීමට විවිධ කණ්ඩායම් තම තමන්ගේ "රාජ්‍යයන්" එසේත් නැත්නම් "ආධිපත්‍යයන්" ගොඩනගාගෙන තිබේ. ආර්ථික මධ්‍යස්ථානවල වෙළෙන්දන්, බන්ධනාගාර නිලධාරීන්, පෞද්ගලික බස් ධාවකයින් ආදී ලෙස සෑම ක්ෂේත්‍රයකම පාහේ මෙසේ ඔවුන්ගේම වූ ප්‍රාදේශීය රාජ්‍යයන් ගොඩනගාගෙන සිටින අතර ඒවා වෙනස් කිරීම සඳහා අත පෙවීමටවත් ඉඩදෙන්නේ නැත.

පවතින සමහර ක්‍රමවේදයන් වෙනස් කිරීම සංස්කෘතියට පිටුපෑමක් හෝ සම්ප්‍රදායට පයින් ගැසීමක් යැයි සමහරු අර්ථගන්වා ගනිති. අලුත් ලෝකයේ දෑ, අශීලාචාර සහ අතීත උරුමයේ අක්මුල්, පදනම් විනාශ කරන දෑ ලෙස සමහරු හඟිති.

සමහර නවීන දේවල් පිළිගැනීම බටහිර සංස්කෘතියට නතුවීමක් යැයිද, අපේ සංස්කෘතිය වලපල්ලට යැවීමක් යැයි අර්ථ දක්වාගැනීම්ද තිබේ.

තවත් සමහර වෙනස්කම් යම් යම් පුද්ගලයින්ට හා කණ්ඩායම්වලට පෙනෙන්නේ අපි වෙනත් විදේශ රටවලට යටත්වීමක් හෝ ගොදුරු වීමක් ලෙසිනි.

අපි රටක් ලෙස අගනා උරුමයකටත්, මහඟු සංස්කෘතියකටත් අපේම වූ අනන්‍යතාවයකටත් හිමිකම් පාන බව සැබවි. ඒ උරුමය, සංස්කෘතිය සහ අනන්‍යතාවය නොහොත් අපේකම අප ඉහළින්ම ආරක්ෂා කරගතයුතු සේම ලෝකයටම විදහා දැක්විය යුතුය. එහි විවාදයක් නැත.

එහෙත් අප සමාජයක්, රටක් ලෙස අපේ නොදියුණුකම්,

**"රාජ්‍ය සේවාව විධිමත් කිරීමට නම් රාජ්‍ය සේවකයෝ තම කාර්යාලවල රැඳෙමින් නිසිපරිදි ඔවුන්ගේ සේවාව ජනතාව වෙත සපයනවාදැයි අධීක්ෂණය කළ යුතු යැයි  සමහර රාජ්‍ය සේවක කණ්ඩායම් විසින්ම යෝජනා කරති. එහෙත් එසේ යෝජනා කරන ඔවුන්ගේ සේවාව අධීක්ෂණයට ක්‍රමවේද හඳුන්වා දෙනවිට ඊට උරණ වෙති. මෙසේ සමහර කණ්ඩායම් අනෙක් අයගේ වෙනස්වීම අගය කරති. එමෙන්ම ඒ සඳහා බලපෑම්ද කරති. එහෙත් වෙනස්වීම තමන් ළඟට ආ විට එය ප්‍රතික්ෂේප කරන, ඊට එරෙහිවන අවස්ථා ඕනෑ තරම් ගෙවුන වසර තුළ දක්නට ලැබුණි."**

නවීනත්වයට ළඟා නොවූ ලක්ෂණ මෙන්ම ඉදිරියට යාමට අපට බාධාකරන දේ නිසිපරිදි හඳුනා ගත යුතුය. අපේ උරුමයන් අනන්‍යතාවයන් සහිතව ලෝකයේ නවීනතම හා දියුණුම රටක්, සමාජයක් කරා යා යුතුය.

මෙලෙස වෙනස් වීමට අකමැති, වෙනස් වීමට බිය හෝ වෙනස් වීමට පැකිලෙන මෙන්ම තමා නොව පළමුව තමාහැර අනෙක් අය වෙනස් විය යුතු යැයි සිතන සිද්ධීන් මෙන්ම උදාහරණයන් තොග ගණනක් ගෙනහැර පෑ හැකි අතර පාඨකයින් ලෙස ඔබ සතුවද එවැනි අත්දැකීම් බොහොමයක් තිබෙනවා ඇත.

මේ තත්ත්වය ඉබේ, නිරායාසයෙන් හෝ ස්වාභාවිකව වෙනස් නොවේ. ඒ සඳහා අරගලයක් කළ යුතුය. දේශපාලන ආදර්ශයන්, පුද්ගල ආදර්ශයන්, මතවාදී අරගලයන් තුළින් ඒ ගමන යා යුතු බව අවිවාදිතය. පැවතුණ ක්‍රමය මත යැපෙන, ඒමත තම පැවැත්ම තිබෙන, එකී ක්‍රමය ඇණහිටීම මත අභාවයට යන කණ්ඩායම මේ නව වෙනසට උපරිම වෛර යොදා පහරදෙනු ඇත. ඔවුන්ගේ මාදිලිය වන්නේද පුද්ගල ආදර්ශයන් දේශපාලන ආදර්ශයන් හා වාසි හරහා පොදු ජනතාව පැරණි ක්‍රමය තුළ රඳවා ගැනීමයි. ඔවුන් වෙනස් කිරීමට අප උත්සාහ ගත යුතු නැත.

පැරණි ක්‍රමය කරපින්නාගත් එකී විරුද්ධවාදීන් විසින් වෙනස්වීම අපේක්ෂා කළ, එහෙත් වෙනස්වීමට බිය හා වෙනස්වීමට අකමැති මෙන්ම වෙනස්වීම මත තමන්ට තාවකාලික වාසි අහිමිවේ යැයි සිතන ජන කණ්ඩායම් රැවටීමට භාජනය කිරීමට ඉඩනොදී අලුත් වෙනස දෙසට ඔවුන් දිනාගත යුතුය. සමාජය වෙනස්කිරීමට මේ කණ්ඩායම සමග කරනු ලබන තීරණාත්මක අරගලය මේ මොහොතේ සමාජයේ මතුපිට සරල වෙනස්කම්වල සිට ගැඹුරු පූර්ණ සමාජ පරිවර්තනයක් දක්වා යාමට අවශ්‍ය මග හසර විවරකර දෙනු ඇත.

■■■

> **පැරණි ක්‍රමය කරපින්නාගත් එකී විරුද්ධවාදීන් විසින් වෙනස්වීම අපේක්ෂා කළ, එහෙත් වෙනස්වීමට බිය හා වෙනස්වීමට අකමැති මෙන්ම වෙනස්වීම මත තමන්ට තාවකාලික වාසි අහිමිවේ යැයි සිතන ජන කණ්ඩායම් රැවටීමට භාජනය කිරීමට ඉඩනොදී අලුත් වෙනස දෙසට ඔවුන් දිනාගත යුතුය.**





# කැඩෙන, බිඳෙන හැදෙන ලෝකය!

**_බිමල් රත්නායක_**

**හැඳින්වීම**

*යකඩ තිරය සෝවියට් දේශයෙන්, එක්සත් ජනපදයට:*

සීතල යුද වකවානුව ලෙස හැඳින්වූ 1945 - 1991 කාලය තුළ ධනවාදී කඳවුරේ රටවල් සෝවියට් දේශය ප්‍රමුඛ නැගෙනහිර යුරෝපා සමාජවාදී රාජ්‍ය පද්ධතිය හඳුන්වන ලද්දේ ඒවා 'යකඩ තිරයකින්' වසා ගත් රටවල් ලෙස ය. එම රටවල පැවති සංස්කෘතික හා සමාජයීය සාධාරණත්වය හා පොදු ආර්ථික දියුණුව පිළිබඳ සැබෑ තත්ත්වය සැබැවින්ම බොහෝ ධනවාදී රටවලට වඩා යහපත් වූ බවට විවාදයක් නැත. එසේ වුවත්, ලෝකයේ ප්‍රාග්ධනයට 'නිදහසේ' මේ රටවලට කඩාවැදීමටත්, එම රටවල වෙළෙඳපොළවල්, දේශීය කර්මාන්ත කඩාදමමින්, අතිදැවැන්ත ගෝලීය සමාගම්වල අවශ්‍යතාවලට අනුව ඒවා ආක්‍රමණය කර, ඔවුන්ගේ වෙළෙඳපොළවල් සකස් කර ගැනීමට බාධා වන පරිදි සමාජවාදී කඳවුර මඟින් 'ආර්ථික යකඩ තිරයක්' පවත්වාගෙන යනු ලැබූ බව පැහැදිලිය.  එම නිසාම 1991දී නැගෙනහිර යුරෝපා සමාජවාදී කඳවුර බිඳවැටීමෙන් හා බිඳදැමීමෙන්




පසු 1994 දී පමණ එක්සත් ජනපද පාර්ලිමේන්තුව The Silk Road Stratergy Act නමින් පනතක්ද සම්මත කර යකඩ තිරය නිසා එතෙක් නොහැකි වූ ආර්ථික හා දේශපාලන මැදිහත්වීම් කිරීමට මූලික උපායමාර්ගයක්ද ස්ථාපිත කරන ලදී. එහෙත්, අද සිදුවී ඇත්තේ කුමක්ද? 2013 සැප්තැම්බර් 7 වැනිදා චීන ජනාධිපති Xijing Ping තම කසකස්ථාන් සංචාරය තුළ  දී ප්‍රථම වතාවට Silk Road Economic Belt පිළිබඳ උපායමාර්ගය ද, 2013 ඔක්තෝබරයේ දී Xijing Ping විසින් ඉන්දුනීසියාවේදී .21st  Century Maritime Silk Road. උපායමාර්ගය ද යෝජනා කරන ලදී. පසුකාලීනව මෙම උපායමාර්ග දෙකම එක් කොට 2013 දී BRI උපායමාර්ගය ඉදිරිපත් කරන ලදී. 1994 දී එක්සත් ජනපදය යෝජනා කළ Silk Road උපායමාර්ගික ක්‍රියාමාර්ග යටපත් කරමින්, ඊට වඩා ප්‍රබලව BRI වැඩසටහන 2013 දී ක්‍රියාවට නැඟීම ආරම්භ විය. දැනට චීනය හා BRI වැඩපිළිවෙළ අනුව යමින් අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇති රටවල් ගණන 150කට අධික ය. එක්සත් ජනපදය මෙයට එරෙහිව විවිධ මට්ටමින් කටයුතු කර, පසුව 'චීන ණය උගුල' (Chinese Debt Trap) නමින් නව සංකල්පයක් ද ගොඩනඟා මෙයට බාධා කරන ලදී. කෙසේ වුව ද, BRI වැඩසටහන ව්‍යාප්ත වීම නතර කිරීමට නොහැකි වූ තැන එක්සත් ජනපද ජනාධිපති අපේක්ෂකයන් දෙදෙනාම අතිදැවැන්ත චීන විරෝධයක් තම මැතිවරණ ව්‍යාපාරවල පවත්වාගෙන ගියහ. ඉනුත් නොනැවැතී දැන් ඇමෙරිකානු ජනාධිපතිවරයා විසින් පදනම් බදු ප්‍රමාණය 10% කරමින් විශේෂයෙන්ම චීනයට එරෙහිව (150% - 60%) දක්වා) දැවැන්ත බදු / වෙළෙඳ යුද්ධයක් දියත් කර තිබේ. චීන ප්‍රාග්ධනය, චීන ආයෝජන, චීන නිෂ්පාදන එක්සත් ජනපදයට හා යුරෝපයට ඒම වළක්වා චීනයට එරෙහිව ආර්ථික  "චීන මහා ප්‍රාකාර" එක්සත් ජනපදය හා යුරෝපා සංගමය විසින් ගොඩනඟනු ලබන යුගයකට අපි පැමිණ සිටිමු. චීනයේ සාර්ථකත්වය කොතෙක්දයත් දැන් යකඩ තිරය ධනවාදී කඳවුර විසින්ම තනා ගනිමින් සිටී. හැඳින්වීමේ කොටස තුළ යකඩ තිරය පිළිබඳව පැහැදිලි කරන ලද්දේ මේ මොහොතේ ගෝලීය වශයෙන් දේශපාලන, ආර්ථික, සමාජ තලයන් තුළ සිදුවෙමින් පවතින වෙනස චිත්ත රූපයකට ගෙන ඒමේ අවශ්‍යතාව විසිනි. ලෝකය පැහැදිලිවම ප්‍රබල වෙනස් වීම්වලට ලක්වෙමින් තිබේ. ඒකධ්‍රැවීය ලෝකයක් වෙනුවට පැහැදිලිවම බහුධ්‍රැවීය ලෝකයක් බිහි වී තිබේ. නව ගෝලීය ආර්ථික, දේශපාලන හා මිලිටරිමය කඳවුරු බිහි වෙමින් තිබේ. 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' නමින් කළ Proxy War වෙනුවට රටවල් අතර ඍජු යුද්ධ පටන්ගෙන තිබේ. වෙළෙඳ යුද්ධ ඇවිළී සමාජයට, ආර්ථිකයට ඉමහත් බලපෑම් සිදුවෙමින් තිබේ. එමෙන්ම 1945න් පසු ස්ථාපිත කළ එක්සත් ජාතීන්ගේ පාලන ක්‍රමයද, 1995න් පසු නිල වශයෙන් ස්ථාපිත කළ WTO මත පදනම් නව ලිබරල්

ආර්ථික පරිපාලන ක්‍රමවේදයද බරපතළ ලෙස දුර්වල වී තිබේ. සංචිත මුදල් ඒකක, ඇමෙරිකානු ඩොලරයේ සිට වෙනත් මුදල් ඒකක බවට වේගයෙන් වෙනස් වෙමින් පවතී.
ඒ අතරම කෘත්‍රිම බුද්ධිය, රොබෝ තාක්ෂණය, ස්වයංක්‍රීයකරණය ආදිය මඟින් නව නිෂ්පාදන බලවේග බිහි වී තිබේ. එමඟින් නිෂ්පාදනයේ යෝධ පිම් ඇතිකර ඇති අතර ම පවතින කර්මාන්ත හා රැකියා බරපතළ අභියෝගයන්ට ද අභිමුඛ කර තිබේ. එමෙන්ම රටවල් අතර Digital Gap වැඩි වීම මඟින් ආර්ථික සමාජ පරතරය තවත් වැඩි වීම හා සමාජයීය සහ පාරිසරික වශයෙන් ගතහොත්, ලොව පුරා සමාජ ස්ථාවරභාවය, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යනාදිය පැහැදිලි ගරාවැටීමකට අඛණ්ඩව ලක් වෙමින් තිබේ. සංක්‍රමණික අර්බුද, ජාතිවාදී/ආගම්වාදී ගැටුම්වල ව්‍යාප්තිය, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ ජනප්‍රජාවගේ වැඩි වීම, පාරිසරික විනාශයන් නිසා අවදානමට ලක්වන ජනතාවගේ ප්‍රමාණය වැඩි වීම, දුප්පතුන් ප්‍රමාණය වැඩි වීම ආදී සමාජ ස්ථාවරභාවය ගරාවැටෙන තත්ත්වයන්ද තිබේ. එම නිසා වත්මන් ලෝකයේ ඉතා පැහැදිලිව, සරලව, නිවැරදිවම සිදුවන දේ වන්නේ පැවති ලෝකය කැඩෙමින්, බිඳෙමින් හා (අලුතින්) හැදෙමින්ද තිබෙන බවය. අපි දැන් මේ පිළිබඳව කරුණු ආශ්‍රිතව සොයා බලමු.

## 1. ලෝක දේශපාලන රටාවේ වෙනස්කම්

(i) ත්‍රස්තවාදයට එරෙහි 'යුද්ධවල' සිට රටවල් අතර හා කලාපීය යුද්ධ දක්වා!
1991 සමාජවාදී කඳවුර බිඳදැමීමෙන්/වැටීමෙන් පසු ලොව වැඩිම සෘජු ආක්‍රමණ ප්‍රමාණයක් එක්සත් ජනපදය විසින් 1995 දී යුගොස්ලෝවියාවට එරෙහිව, 2001 දී ඉරාකයට හා ඇෆ්ගනිස්ථානයට එරෙහිව සිදුකරන ලදී. නමුත්, 2001 දී එක්සත් ජනපදය විසින් තම ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයට පහර දීම පදනම් කර ගත් යුද්ධය ඔවුන් හැඳින්වූයේ ලෝකයේ ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක් ලෙසය. ඒ වන විටත් රටවල් අතර (විශේෂයෙන් අප්‍රිකාවේ හැර) යුද්ධ නොපැවැති තරම්ය. නමුත් මේ වනවිට රටවල් අතර හා කලාප අතර යුද්ධ ගොඩනැඟී ඇති අතර, එය වර්ධනය වන ප්‍රවණතාවක් බවට ද පත්වෙමින් තිබේ.
රුසියාව - යුක්රේනය, (යුරෝපා සංගමය හා එක්සත් ජනපදය) අතර යුද්ධය.
ඉරානය - ඊශ්‍රායලය (යුරෝපා සංගමය හා එක්සත් ජනපදය) අතර යුද්ධය.
සිරියාව - තුර්කිය අතර.
යේමනය - ඊශ්‍රායලය (ඇමෙරිකාව) අතර.
එමෙන්ම ආර්මේනියාව - අසර්බයිජානය අතර ද, පකිස්ථානය - ඉන්දියාව අතර ද වෙනදාට වඩා ශීඝ්‍රතාවකින් යුද ගැටුම් ඇති වෙමින් පවතී.

## 2. එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ක්‍රමය දුර්වල කිරීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය 1945න් පසු ලෝකයේ අන්තර් රාජ්‍ය ගැටලු සාමකාමීව හා දේශපාලන තලයේ විසඳා ගැනීමට සකස්කර ගත් ප්‍රධානම වේදිකාව විය. නමුත්, 1991න් පසු ඒකධ්‍රැවීය



ලෝකයක් නිර්මාණය වීමත් සමඟ විශේෂයෙන්ම එක්සත් ජනපදය හා යුරෝපා සංගමයේ බලගතු රටවල් විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සැලසුම් සහගතව දුර්වල කරන ලදී.

- 01. එක්සත් ජාතීන්ගේ ඉතාම ප්‍රධාන මූලධර්ම ප්‍රසිද්ධියේ උල්ලංඝනය කිරීම (යුගෝස්ලාවියාවට එරෙහි NATO ප්‍රහාරය, ඉරාක ආක්‍රමණය).

02. එක්සත් ජාතීන්ගේ ඉතාම ප්‍රධාන ආයතනයක් වන ජාත්‍යන්තර අපරාධ අධිකරණය නොපිළිගැනීම, එහි තීන්දු ක්‍රියාවට නොනැඟීම, එහි විනිසුරන්ට සම්බාධක පැනවීම ආදිය.

03. එක්සත් ජනපදය එක්සත් ජාතීන්ගේ සංවිධාන ගණනාවකින් ඉවත්වීම හා මුදල් නොගෙවීම

- *එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය*

WHO ලෝක සෞඛ්‍ය සංවිධානය, (ට්‍රම්ප් ජනාධිපතිවරයා විසින් 2025 ජනවාරි 20 දින WHO වෙතින් ඉවත් වීමට නියෝග කර තිබේ. WHO රෙගුලාසි අනුව එසේ ඉවත් විය හැක්කේ තීරණයෙන් වසරකට පසුව ය. එනම් 2026 ජනවාරි 20 වැනි දින ය. නමුත්, USA දැනට WHO කටයුතුවලට සහභාගී වීම අල්ප ය.)

- UNESCO *එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය*
- UNRWA - *එක්සත් ජාතීන්ගේ සරණාගතයන්ට සහන සැලසීමේ ඒජන්සිය.*

04. ලොව ප්‍රධාන රටවල් අතර න්‍යෂ්ටික අවි ගැටුම් වැළැක්වීම, නිෂ්පාදනය සීමා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය මුල් වී අත්සන් කරන ලද ගිවිසුම් අහෝසි කිරීම හා අත්හැරීමේ ප්‍රවණතාව.

(a) The Intermediade - Range Nuclear Forces Treaty (INF) 1987 දී අත්සන් කළ මෙම ගිවිසුමෙන් එක්සත් ජනපදය 2019 අගෝස්තු 02 වැනිදා නිල වශයෙන් ඉවත් විය.

(b) Joint Comprehensive Plan of Action - 'JCPOA' - Iran Nuclear Deal - 2018 මැයි 8 වැනිදා එක්සත් ජනපදය මෙම ගිවිසුමෙන් ඉවත් විය.


05. UN පදනම් කරගත් ලෝක පාලන ක්‍රමය වෙනුවට 'Rule Based Order' නමින් බලවත් බටහිර රටවල් (NATO ද ඇතුළත්) සකස් කරගත් නව පාලන රටාවක්, වැඩපිළිවෙළක් ගැන NATO රටවල දේශපාලන නායකයන් අවධාරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

3. නව ලෝක බලවතුන්ගේ/ කලාපවල නැඟීම

එක්සත් ජනපදය ප්‍රමුඛ වූ ලෝකය වෙනුවට මේ වන විට ලොව නව දේශපාලන හා මිලිටරි කලාප සහ සංවිධාන ගොඩනැඟෙමින් තිබේ.

(a) BRICS සංවිධානයඃ

මේ සියල්ල අතරින් ප්‍රමුඛතම වන්නේ BRICS සංවිධානයයි. මෙහි චීනය හා රුසියාව ප්‍රමුඛ වන අතර දැනට රටවල් 10ක් (2025 දී බැඳුණු රටවල් 6ක් ද සමඟ, ඊජිප්තුව, ඉතියෝපියාව, ඉරානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සෞදි අරාබිය, ඉන්දුනීසියාව වන අතර BRICS Partner Countries ලෙස තවත් රටවල් 10ක්ද සිටී. BRICS සංවිධානයේ රටවල GDP



අගය සියලුම OECD රටවලට වැඩි අතර ප්‍රබල දේශපාලන, ආර්ථික, ආයතනික බලයක් මෙම සංවිධානය සතුවේ. එක්සත් ජනපද, යුරෝපා හෙජමොනියට එරෙහි ප්‍රධානම දේශපාලන කඳවුර BRICS සංවිධානය වේ.

(b) SCO සංවිධානය - ෂැංහයි සහයෝගීතා සංවිධානය

මෙය චීනය හා රුසියාව මුල් වී ආසියාව ප්‍රධාන කර ගත් ආරක්ෂක, දේශපාලන සංවිධානයකි.

(c) රුසියානු CIS - Commonwealth of Independent States

පැරණි සෝවියට් සමූහාණ්ඩු සංගමය හා රුසියාව මුල් වී සකස්කර ගත් දේශපාලන, ආර්ථික, වෙළෙඳ හා උපායමාර්ගික සංවිධානයක් වන අතර එමඟින් මධ්‍යම ආසියාව හා යුරේසියානු කලාප තුළ රුසියානු උපායමාර්ගික දේශපාලන වුවමනාවන් ආරක්ෂා කර ගනු ලබයි.

(d) රුසියානු හා චීන රාජ්‍යයන් මඟින් සියලුම මහාද්වීපවල විවිධ රාජ්‍ය එකතූන් පවත්වාගෙන යාම.

උදාහරණ - චීන - අප්‍රිකා සමුළුව, චීන - ලතින් ඇමෙරිකා සමුළුව, චීන - පැසිෆික් දූපත් සමුළුව.

මේ අනුව ලෝකයේ පාලන රටාව තුළ මේ මොහොත තුළ සිදුවෙමින් පවතින ප්‍රධානම කරුණු වන්නේ,

1. යුද්ධවල ව්‍යාප්තිය වැඩි වීම.
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ක්‍රමය දුර්වල කිරීම.
3. ලෝකය බහුධ්‍රැවීය වීම හා නව ලෝක බලවතුන් හා නව කලාපීය එකතූන් බිහි වීමයි.

ඒ අනුව පවතින රටාව කැඩෙමින්, බිඳෙමින් නව රටාවල් හැදෙමින් පවතින බව පැහැදිලි ය.

(e) ලෝක ආර්ථික රටාවේ වෙනස්කම් !

i) ඩොලරයේ ආධිපත්‍යය දුර්වල වීම. විදේශ සංචිත මුදලක් ලෙස. IMF දත්ත අනුව 2025 දෙවන කාර්තුව වන විට ලෝකයේ මුදල් සංචිත පවත්වාගෙන යන ලද ප්‍රධාන මුදල් වර්ග සහ ගෝලීය ප්‍රතිශත පහත පරිදි වේ:

US - Dollar - 56% - දශක 2ක් තුළ අඩුම අගය මෙය වේ. 2000 - 72%, 2024 - 58%, 2025 දෙවැනි කාර්තුවේ 56%.

Euro - 21%

Yen - 5% (පළමු කාර්තුව)

බ්‍රිතාන්‍ය පවුම් - 5%

චීන යුවාන් - 2%

(ii) පෙට්‍රෝ ඩොලර් වෙනුවට පෙට්‍රෝ යුවාන්

ලොව පුරාම වෙළෙඳාම් කරන ප්‍රධාන මුදල් ඒකකය USD වීම නිසා ඩොලරයට විශාල අමතර වාසියක් අත් වී ඇති අතර, එක්සත් ජනපද ආර්ථික ශක්තියේ ප්‍රධානම පදනමක් වන්නේද එයයි. මන්දයත්, එක්සත් ජනපදය මුද්‍රණය කරන ඩොලර් නෝට්ටුවලට වටිනාකම් ගෙන එනු ලබන්නේ අන් රටවල් විසිනි. මේ තත්ත්වය නිසා එක්සත් ජනපදය ලබන අමතර වාසිය නතර කරමින්, ලොව පුරා රටවල් තම මුදල් ඒකකවලින් විදෙස් වෙළෙඳ ගනුදෙනු කිරීමටත්, භාණ්ඩ - භාණ්ඩ හුවමාරුවට යාමටත් පටන්ගෙන තිබේ.

උදා: ප්‍රධාන වශයෙන් රුසියානු තෙල් චීනය මිල දී ගන්නේ යුවාන්වලිනි. ඉන්දියාව මිල දී ගන්නේ රුපියල් වලිනි. චීනය මැදපෙරදිග රටවලින් තෙල් මිල දී ගන්නේද යුවාන්වලිනි.

(iii) එක්සත් ජනපද සම්බාධක නිසා රටවල් ඩොලරය අත්හැරීම හා ස්වෛරී මුදල්/ආර්ථික භාවිතාවන්ට යොමු වීම. ලෝකයේ වැඩියෙන්ම වෙළෙඳ සම්බාධක පනවා ඇති රට වන්නේ එක්සත් ජනපදයයි. එම නිසා චීනය, වෙනිසියුලාව, රුසියාව, ඉරානය

ඇතුළු ප්‍රධාන පෙළේ ආර්ථිකයන් ද, එමෙන්ම එක්සත් ජනපදය 'ඩොලරය' දේශපාලන ආයුධයක් ලෙස භාවිත කිරීම නිසා සමහර රටවල් (උදාඃ ඉන්දියාව, මැලේසියාව වැනි) ඩොලරය වෙනුවට වෙනත් මූල්‍ය ඒකක භාවිතයට සහ භාණ්ඩ හුවමාරු ක්‍රමවලට යොමු වී ඇති අතර, ඒවා ප්‍රබල වේගයකින් වර්ධනය වෙමින් ද පවතී. එම නිසා චීන මහ බැංකුව සහ රුසියානු මහ බැංකුව විසින් විශාල ලෙස රත්‍රන් මිල දී ගැනීම ද කරනු ලබයි. World Gold Council දත්ත අනුව චීනය විසින් 2025 දී රත්‍රන් ටොන් 1,000කට වැඩි ප්‍රමාණයක් මිලට ගෙන ඇත. 2023, 2024 වසරවල දීත් ටොන් 1000 ට වඩා මිලට ගෙන තිබේ.

4. එක්සත් ජනපද බදු යුද්ධය


එක්සත් ජනපද සම්බාධකවලින් ප්‍රධානම බලපෑම සිදුවී ඇත්තේ, එක්සත් ජනපදයටම ය. එහි අමතර ආනයන බදු පැනවීම නිසා පමණක් 2025 දී එක්සත් ජනපද සාමාන්‍ය පවුලකට USD 1,200ක් (මසකට USD 100ක්) දැරීමට සිදු වේ යැයි ගණන් බලා තිබේ. මෙම ශීත කාලය තුළ දී වැඩි මිල නිසා එක්සත් ජනපද ජනතාවට අවශ්‍ය චීස්, කිරි වැනි දේ පවා මිලට ගැනීමට නොහැකි වී තිබේ. (බ්‍රසීලය, එක්සත් ජනපදයේ ප්‍රධාන මස් සැපයුම්කරුවෙකු වන අතර Trump පාලනය 50%ක ආනයනික බද්දක් බ්‍රසීල ආනයනවලට පනවා තිබේ.) එමෙන්ම චීනයට එරෙහිව විශාලම බදු පැනවීමත්, ඒවා නිරතුරුව එක්සත් ජනපද පාලනය විසින් ස්ථායී කරනු ලැබීමත් නිසා එක්සත් ජනපද කර්මාන්ත, නිෂ්පාදන, සේවා, සැපයුම් දාම සියල්ල අවුල් වී, බිඳවැටී තිබේ. එසේම ආයෝජකයන් එක්සත් ජනපදයෙන් පිටත ආයෝජනවලට පෙළැඹීම් ද සිදුවී තිබේ. එමෙන්ම මෙම අධික බදු මඟින් ලොව බොහෝ රටවලට ආර්ථික දුෂ්කරතා ඇති වීම මඟින් මෙන්ම සැපයුම් දාම අවුල්වීම නිසා ආර්ථික කඩාවැටීම, විරැකියාව, සමාජ හා දේශපාලන අර්බුද ද ඇති කර තිබේ.

එමෙන්ම මෙම නව බදු ඇති කිරීම, අධිරාජ්‍යවාදී වෙළෙඳ යුද්ධයකට ඉතා ආක්‍රමණකාරී ප්‍රවේශයක් වන අතර එමඟින් ඇති කරනු ලබන ප්‍රතිවිපාක ආර්ථික ක්ෂේත්‍රයේ පමණක් නොව දේශපාලන, සමාජ ක්ෂේත්‍රවල ප්‍රබලව මතුවිය හැකිය.

05. නව නිෂ්පාදන බලවේගවල පැනනැඟීම

ලෝකය තුළ මේ මොහොතේ සිදු වෙමින් පවතින ඉතාම විශාල බලපෑමක් සහිත කරුණ වන්නේ ලෝකය ප්‍රබල තාක්ෂණික විප්ලවයක් හරහා ගමන් කරමින් තිබීමයි.

1. The Intelligence Revolution -
   1. AI - කෘත්‍රිම බුද්ධිය
   2. Computing - දත්ත විශ්ලේෂණය කිරීමේ වේගය
2. Connectivity -
   1. 5G හා 6G තාක්ෂණය.
   2. Block Chain.
3. Green Energy -
   1. සූර්ය බලශක්තිය, සුළං බලශක්තිය
4. තිරසර තාක්ෂණය-
   1. Green Hydrogen



2. Green Computing

5. ජීව විද්‍යාවේ හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විප්ලවය-

1. ජාන වෙනස් කිරීම.

2. එකිනෙකාට පෞද්ගලික වන සේ සපයන ඖෂධ.

3. ශරීර සෞඛ්‍යය පරීක්ෂා lrk Sensor සවි කිරීම තුළින් රෝගී තත්ත්ව කලින් ම හඳුනා ගැනීම.

මේ සියලුම කාර්යයන් අතර ඉතාම ප්‍රබල හා වේගයෙන් ව්‍යාප්ත වන සහ ජීවිතයේ සෑම අංශයකටම බලපාන නිෂ්පාදන බලවේගය වන්නේ AI කෘත්‍රිම බුද්ධියයි. එය විදුලි බලය, ඉලෙක්ට්‍රොනික් හා අන්තර් ජාලය එදිනෙදා ජීවිතයට එක් වීමත් සමඟ රටවල, සමාජවල, ආර්ථිකයට, සංස්කෘතියට ඇති කරන ලද බලපෑම තරම්ම හෝ ඊටත් වඩා ප්‍රබල බලපෑමක් ඇති කරනු ඇත. එහි සාධනීය පියවර වන්නේ ජන ජීවිතයේ අවශ්‍යතා ඉතා ම තරගකාරීව, ක්‍රමානුකූලව, අවම කාලයකින්, වේගයෙන්, ගුණාත්මකව සහ තිරසරව කර දීමට හැකි වීමයි. අනෙක් අතට මෙම නව නිෂ්පාදන බලවේගවල හිමිකාරීත්වය අධිරාජ්‍යවාදී රටවල්, සමාගම් හා ධනපතීන් අත පමණක් රැඳීම නිසා ලොව පුරා අධිරාජ්‍යවාදී ක්‍රමය තවත් ශක්තිමත් වීම, රටවල් අතර ඩිජිටල් පරතරය වැඩිවීම, සමාජ තුළ ඇති-නැති පරතරය තීව්‍ර කිරීම සිදු විය හැකිව තිබේ. ලොව කෘත්‍රිම බුද්ධි කර්මාන්තයේ වටිනාකම 2025 දී USD බිලියන 370 ත් 757ත් අතර විය. 2030 වර්ෂය වන විට එය USD බිලියන 1800 දක්වා වර්ධනය වේ යැයි පුරෝකථනය කර තිබේ.

ආර්ථික ක්ෂේත්‍රය තුළ ලෝකයේ සිදු වන්නේ කුමක් ද යන්න පිළිබඳව මූලික අදහසක් ඉහත කරුණු හරහා ගම්‍ය වේ. එනම්, ලෝකයේ ආර්ථික ව්‍යුහයේ, කළමනාකරණ ක්‍රමයන්හි විශාල වෙනස්කම් සිදුවන අතරම නව නිෂ්පාදන බලවේගවල මතු වීම හරහා ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකම විශාල වෙනසක් ඉදිරි වසර කිහිපය තුළ දී වීමට ඇති ඉඩකඩ බොහෝය.

එහි දී මෙතෙක් පැවැති ලෝකයේ ආර්ථික වියමන කැඩෙමින්, බිඳෙමින් නව වියමනක් හැදෙමින් තිබෙන බව හඳුනාගත හැකි ය.

5. සමාජයීය වශයෙන් ලෝකය යන්නේ කොහේ ද?

කැඩෙන, බිඳෙන, හැදෙන ලෝකයේ මිනිසුන්ගේ තත්ත්වය!

ලෝකයේ මිලියන 8,160කට අධික ජනගහනයෙන්,

- අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන දිනකට USD 2.15ට අඩු (ආසන්න වශයෙන් රුපියල් 650.00කට අඩු) ආදායමක් ලබන ප්‍රමාණය - මිලියන 808කි (ලෝක ජනගහනයෙන් 9.9%).

- දිළිඳු ජනගහනය - දිනකට USD 6.85ක් (ආසන්න වශයෙන් රුපියල් 2,000.00කට අඩු) ආදායමක් ලබන ප්‍රමාණය - මිලියන 3,835කි (ලෝක ජනගහනයෙන් 47%ක්).

- ලෝක ජනගහනයෙන් මිලියන 316ක් - ඇල්කොහොල් හා සිගරට්වලට අමතරව විෂ මත්ද්‍රව්‍ය භාවිතයේ යෙදෙති. මෙය 2023දී වයස 15-64ත් අතර ජනගහනයෙන් 6%ක් විය. 2013දී විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටි ප්‍රමාණය මිලියන 246කි. එය වසර 10කදී 13%ක වැඩි වීමකි. (2024 ලෝක මත්ද්‍රව්‍ය පිළිබඳ වාර්තාව). කොකේන් නිෂ්පාදනය පමණක් 2022 - 2023 වසරවල දී 34% කින් වැඩි වී තිබේ.

- 2024දී ගෝලීය දේශගුණික බේදවාචක පිළිබඳ වාර්තාවට අනුව 2024දී ලෝකයේ සිදු වූ ස්වාභාවික විපත් 393කින් ජනතාව මිලියන 167ක් විපතට පත් වී ඇත.

- 2024දී මිලියන 45.8ක් ජනතාව අභ්‍යන්තරව අවතැන් වූහ. මෙය 2023 වසරට වඩා දෙගුණයක් වීමකි.
- එමෙන්ම ලෝක ජනගහනයෙන් මිලියන 1,200ක් දේශගුණ විපර්යාස නිසා පීඩාවලට හා දුෂ්කරතාවලට ලක් වී සිටින අතර ඉන් මිලියන 887ක්ම දුප්පත් ජනතාව වෙති.
- අන්තර්ජාතික සංක්‍රමණික සංවිධානයේ (IOM) වාර්තාවලට අනුව 2022දී නූතන වහල් ශ්‍රමය (Modern Day Slavery) ප්‍රමාණය මිලියන 50ක් පමණ වේ.
- 2019 - 2022 දක්වා කාලය තුළ මෙය 25%කින් වැඩි වී තිබේ.

මෙයට ගොදුරු වී ඇති ළමයින් ප්‍රමාණය සමස්තයෙන් 40%කි. 2019 සිට 2022 දක්වා කාලය තුළ එම අගය 31%කින් වැඩි වී තිබේ.

- බලහත්කාරයෙන් වැඩ කරවීම, 2019 - 2022 දක්වා කාලසීමාව තුළ 47%කින් වැඩි වී තිබේ.
- විශේෂයෙන්ම Online දූෂණ සඳහා බලහත්කාරයෙන් යොදා ගන්නා ශ්‍රමික ප්‍රමාණය 2016දී 1%ක් නම් 2022 දී එය 8% දක්වා වැඩි වී තිබේ.
- නූතන වහල් ශ්‍රමයට ගොදුරු වන අයගෙන් 61% ක්ම කාන්තාවන් හා ගැහැනු ළමයින් වන අතර, පොදුවේ සංක්‍රමණිකයෝ මේ සඳහා ගොදුරු වෙති.
- යුද්ධ හා ගැටුම් නිසා උන්හිටි තැන් අහිමි වූ ලෝක ජනගහනය 2024 අවසානය වන විට මිලියන 123.2ක් පමණ වේ යැයි ගණන් බලා තිබේ.



- අභ්‍යන්තරව තම රට තුළම සරණාගත වූ ජනතාව මිලියන 73.5කි. ඉන් මිලියන 14ක්ම සුඩානයේ ජනතාව වෙති.
- මිලියන 42.7ක් ජනතාව තම රට වෙනුවට වෙනත් රටක සරණාගතව ජීවත් වෙති.
- 2024දී ලෝක ජනගහනයෙන් මිලියන 745ක් යුද ගැටුම් බහුල ප්‍රදේශවල ජීවත් වෙති.
- 2024දී පමණක් යුද ගැටුම්වලින් 58,700ක් දෙනා මිය ගොස් ඇත.

■ රැකියා:

ලෝක ජනගහනයෙන් රැකියා කරන සංඛ්‍යාවෙන් 45%ක්ම කරනුයේ අනාරක්ෂිත, අඩ වැටුප් සහිත රැකියා ය. එනම්, වැඩ කරන සෑම දෙදෙනකුගෙන්ම එක් අයෙක් අනාරක්ෂිත රක්ෂාවක නිරත වේ.

■ ප්‍රජාතන්ත්‍රවාදයේ ගරාවැටීම:

- ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ තත්ත්වය 2024දී ඉතිහාසයේ අඩුම අගයකට එනම් 5.17 ට පත්විය. 2006 සිට දිගටම ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයන් (එම දර්ශකවල පක්ෂග්‍රාහී බව තිබිය දීත්) දිගටම අඩු වේ.
- ලෝකයේ ඒකාධිපති පාලනයන්ගේ ප්‍රමාණය 2014දී 52ක් ද 2024දී 60ක් ද වී තිබිණි.
- 2024දී පරීක්ෂා කළ රටවල් 167කින් 130කම අගය අඩු වීමක් හෝ එකතැන පල්වන ස්වභාවයක් හෝ තිබේ.

■ ලෝකයේ රටවල් අතර දුප්පත් - පොහොසත් පරතරය වැඩි වීම.

- ලෝකයේ රටවල් අතර පරතරය 20 වන ශතවර්ෂයේ එනම්, යටත්විජිත ක්‍රමය ක්‍රියාත්මක වූ හා ප්‍රධාන ලෝක යුද්ධ 2ක් සිදු වූ කාලයේ තත්ත්වයට ද වඩා වැඩිවී තිබේ.
- ලොව රටවල් තුළ ඇති-නැති පරතරය අධික ලෙස වැඩිවී තිබේ.
- ලොව ධනවත්ම 10%ක් සතු දේපළ ප්‍රමාණය සමස්ත ගෝලීය දේපළවලින් 76%කි.
- ලොව දුප්පත්ම 50% සතු දේපළ ප්‍රමාණය සමස්ත ගෝලීය දේපළවලින් 2%කි.

ධනවත් ම සියයට 01 සතු ගෝලීය දේපළ ප්‍රතිශතය 47%කි.

මේ ආදී වශයෙන් ධනවත් ලෝකය තුළ මිනිසුන් මුහුණ දෙමින් සිටින ජීවත් වීම පිළිබඳ අතිශය වැදගත් සාධක කිහිපයක් සලකා බැලීමේ දී පෙනී යන්නේ ලෝකය මත මිනිස් ජීවිතය සැලැකිය යුතු පිරිසකට දුෂ්කර හා අභියෝගාත්මක එකක් වී ඇති බව සහ එම තත්ත්වය තව තවත් වර්ධනය වන බවයි. අප ඉහතින් සාකච්ඡා කරන ලද ගෝලීය ආර්ථිකයේ හා දේශපාලනයේ පසුගිය දශක ගණනාවකදී සිදු කර ඇති, සිදු කරමින් ඇති වෙනස්කම්, ගැටුම් හා ආතතීන් විසින් මහපොළොවේ නිර්මාණය කර ඇති, මිනිස් ජීවිතයට උදා කර ඇති සැබෑ තත්ත්වය පිළිබඳ යම් සාධාරණ පින්තූරයක් ඉහත ඇති දත්ත

මඟින් මවා ගත හැකි ය. ඒ අනුව ලෝකය යන්නේ කොහාට ද? එය යමින් තිබෙන්නේ ජන ජීවිතය පැත්තෙන්, සමාජයීය හා පාරිසරික වශයෙන් බැලූ විට අගාධයට බව පැහැදිලි ය. යටත්විජිතකරණය තුළ ලෝකයේ රටවල්වලින් අඩක් යටත්විජිත කර තිබූ යුගයට ද වඩා ලොව රටවල් අතර පරතරය වැඩි වීම මඟින් කියා දෙන්නේ ලෙනින් සහෝදරයා විසින් 1915දී රචනා කරන ලද අධිරාජ්‍යවාදය, ධනපති ක්‍රමයේ ඉහළම අවධිය බවත්, එමඟින් රටවල් අතර සුවිශාල පරතරයක් ඇති කරන බවත්, ආර්ථික, වෙළෙඳ, ජාත්‍යන්තර සැපයුම් දාම, ප්‍රාග්ධන අපනයනය, මහා පරිමාණ බහුජාතික සමාගම් හා කාටල, අතිදැවැන්ත බැංකු ආදිය විසින් මූල්‍ය වෙළෙඳපොළ හැසිරවීම මඟින් ලෝකය අධිරාජ්‍යවාදී කේන්ද්‍රීය හා පරිධිය ලෙස රටවල් අතර සූරාකෑම් යාන්ත්‍රණයක් සකස්කර ඇති බවත් ය. Digitalization" Automation" Robotics ආදී කුමන තාක්ෂණ පැමිණිය ද, ධනපති ක්‍රමයම පිළිගන්නා Dgital Gap තුළින් තව තවත් මෙම පරතරය වැඩි කෙරෙන බවයි. අනෙක් අතට මෙම නිෂ්පාදන බලවේග වන කෘත්‍රිම බුද්ධිය සහිත උපකරණවල අයිතිය තනි තනි ධනපතීන් හෝ විශාල සමාගම් හෝ අත පවතින විට එම නිෂ්පාදන උපකරණ මිලට ගැනීමට ලොව සියලුම රාජ්‍යයන්ට හා විශේෂයෙන්ම පරිධියේ රාජ්‍යයන්ට දුෂ්කර වේ. එම නිසා ධනවත් රටවල පවා ඇති-නැති පරතරය වැඩි වන්නේ මෙම මහා පරිමාණ ධනවතුන්ට ගෙවා එම උපකරණ පොදු ජනතාවගේ සුභසාධනය සඳහා යෙදවීමට ධනවත් රටවල ආණ්ඩුද අසමත් වන බැවිනි. එමෙන්ම ධනවත් නොවන රටවලට මේවා අත්පත් කර ගැනීමට මූල්‍යමය බාධක මෙන්ම දේශපාලන බාධකද, රාජ්‍ය තාන්ත්‍රික සීමාද තිබේ.
එම නිසා තාක්ෂණය කෙතරම් දියුණු වුවද, එමඟින් පමණක් මෙම මිනිසා හා සොබාදහම මුහුණ දී ඇති අර්බුදයට විසඳුම් සොයාගත නොහැකිය.

## කළ යුත්තේ කුමක්ද?

කළ යුතු වන්නේ රාජ්‍යයන් අතර තරගය වෙනුවට සහයෝගීතාව නිර්මාණය කරන ලෝක දේශපාලන ක්‍රමයක් බිහි කිරීමට සටන් කිරීමයි. ලෝකයේ නිෂ්පාදන උපකරණවල පෞද්ගලික හිමිකාරකම් වෙනුවට පොදු හිමිකාරකම් (Public Goods) බවට පත් කිරීමට අරගල කිරීමයි ලෝකයේ ඇති-නැති පරතරය තව තවත් වැඩි කරන අධිරාජ්‍යවාදී වෙළෙඳ ක්‍රම, නීති වෙනස් කිරීමට ලොව රටවල සාමූහික අරගලයක් කිරීමයි. ලෝකයේ සෑම රටකම ස්වෛරීත්වය, සංස්කෘතිය සංවර්ධනය වීමට ඇති අයිතිය සහිත නව ගෝලීය දේශපාලන ව්‍යුහයන් ස්ථාපනය කර ගැනීමට කටයුතු කිරීමයි. කෙටියෙන්ම කිවහොත් අධිරාජ්‍යවාදී ක්‍රමය පැරදවීමට කටයුතු කිරීමයි.
ඇමෙරිකාවේ වැඩ කරන ජනයාටද, චීනයේ වැඩ කරන ජනතාවටද සුඩානයේ මිනිසුන්ටද සැහැල්ලු හුස්මක් සහිත ජීවිතයක් උරුම කර දිය හැක්කේ එවිට පමණි.
මිනිසාගේ නව තාක්ෂණික නිර්මාණ මඟින්, නව නිෂ්පාදන බලවේගවල දියුණුව මඟින් එවන් සමාජයක් ඇති කිරීම වෙත ගෙන යාම ප්‍රායෝගිකව කළ හැකි බව ඕනෑවටත් වඩා පෙන්නුම් කර තිබේ. අවශ්‍යතාව වන්නේ එවන් මිනිස් සමාජයක් නිමවීම සඳහා වර්තමානයේ දී ලෝකයේ සිදු වෙමින් තිබෙන කැඩෙන, බිඳෙන තත්ත්වයම නව යහපත් ලෝකයක් ගොඩනැඟීම සඳහා දේශපාලන වශයෙන් යොදා ගැනීමට උත්සුක වීමය; ක්‍රියාත්මක වීමය.





# ජීවිතයට ප්‍රහර්ෂය සොයා අරගල කරන මිනිසා!

**ධනුෂ්ක හර්ෂණ වික්‍රමරත්න**

'සතුට' යනු චිත්තවේගී හැඟීමකි. තෘප්තිමත්භාවයේ සිට දැඩි ප්‍රීතිය දක්වා හැඟීම් මෙයට අයත්ය. සතුටේ ඉහළම අදියර ප්‍රහර්ෂයයි. සතුට උපදවන සාධකය තෘප්තිමත්භාවයයි. හුදු සත්වයෙකුගේ තෘප්තිමත්භාවය නිර්ණය වන්නේ ජීව විද්‍යාවේ අවශ්‍යතාවය නම් මිම්මෙනි. සත්වයෙකුට කෙලෙස හෝ කුස පිරවීම ප්‍රමාණවත්ය. ඉන් එම සත්වයාගේ ආහාර අවශ්‍යතාවය තෘප්තිමත් වේ. එයට වෙනස්ව මිනිස් සත්වයාගේ තෘප්තිමත්භාවය නිර්ණය වන්නේ සමාජ විද්‍යාත්මක අවශ්‍යතාවය නම් මිම්මෙනි. එහි ජීවවිද්‍යාත්මක අවශ්‍යතාද ගැබ්වේ.

> පෘතුවිය මතුපිට වෙසෙන එකම සමාජ සත්වයා මිනිසාය. එනිසා මිනිස් සතුටද එය උපදවන සාධකද සමාජමය වේ. ඔහු තම සංස්කෘතික ජීවිතය හරහා තෘප්තිමත්භාවය සොයයි. එනම් සත්ව ජීවිතයෙන් දුරස්වීම හරහා තෘප්තිමත්භාවයට පත්වේ. එය විසින් සතුට උපදී, එය ප්‍රහර්ෂය දක්වා වර්ධනය වේ. මිනිසා සෞන්දර්ය විද්‍යාව හරහා එය ප්‍රකාශයට පත් කරයි. ඔහු ගී ගයයි. වාදනය කරයි. නටයි. සෞන්දර්ය විද්‍යාව හරහා අත්දැකීම් හා අත්විඳීම් තුළින් ලද දැනුම හුවමාරු කරයි. එනිසා සමාජ සංවර්ධනයේ අවසන් ඉලක්කය නිරපේක්ෂ සතුට බව පැහැදිලිය.

පෘතුවිය මතුපිට වෙසෙන එකම සමාජ සත්වයා මිනිසාය. එනිසා මිනිස් සතුටද එය උපදවන සාධකද සමාජමය වේ. ඔහු තම සංස්කෘතික ජීවිතය මගින් තෘප්තිමත්භාවය සොයයි. එනම් සත්ව ජීවිතයෙන් දුරස්වීම හරහා තෘප්තිමත්භාවයට පත්වේ. එය විසින් සතුට උපදී. එය ප්‍රහර්ෂය දක්වා වර්ධනය වේ. මිනිසා සෞන්දර්ය විද්‍යාව හරහා එය ප්‍රකාශයට පත් කරයි. ඔහු ගී ගයයි. වාදනය කරයි. නටයි. සෞන්දර්ය විද්‍යාව හරහා අත්දැකීම් හා අත්විඳීම් තුළින් ලද දැනුම හුවමාරු කරයි. එනිසා සමාජ සංවර්ධනයේ අවසන් ඉලක්කය නිරපේක්ෂ සතුට බව පැහැදිලිය. එතෙක් මිනිසා සතුට යන්න සාපේක්ෂව ලබා ගැනීමට වෙහෙසේ. මේ කාරණය පුළුල්ව විග්‍රහ කරගැනීම ලිපියේ අරමුණයි.


තමා වටා වන විශ්වය හෙවත් ප්‍රකෘතිය සමඟ මිනිස් සත්වයාට නිරන්තරව වන ජීවන අරගලයක් පවතී. නිරන්තරව ප්‍රකෘතිය ඔහුට විවිධ අභියෝග ඉදිරිපත් කරන අතර ඔහු ඒවාට මුහුණ දී පරාජය කරයි. මිනිසාද අන් සතුන්ද තමන් වෙනුවෙන්ම පමණක් තමන් විසින්ම ආහාර බුදින අවදියක් විය. එහෙත් මිනිසා සත්ව පාලනය ඇරඹීමෙන් පසුව තණ බිම්වල තණ බුදින ගවයින් මිනිසාගේ ප්‍රයෝජනය උදෙසාම එසේ කරමින් සිටී. මක්නිසාද යත් එම සතුන් තණ බුදින්නේ තමන් පෝෂණය වී එඬෙරාගේ අවශ්‍යතා තෘප්තිමත් කරනු පිණිසම පමණක්ය. දැන් ඔහුට, ඔහු වෙනුවෙන් තණ බුදින සත්ව රංචු සිටී. හෝග වගාව සමඟ මිනිසා වෙනුවෙන්ම පෝෂණය වී එල දරන ශාක පවතී. එම සතුන් දැන් සොබාදහමට නතු නොකර මිනිස් පැවැත්මට යොදා ගනී. ඔහු මැටි බදාම වෙනුවට සිමෙන්ති බදාම නිපදවයි. සොබාදහම වෙනුවෙන් නොවන තමන් වෙනුවෙන් වන වර්ණාලේප නිපදවයි. එලෙස මිනිසා ස්වභාවදහම දෙන දෙයට වඩා නව දේවල් නිර්මාණය කරමින් මිනිසුන් හා සොබාදහම අතර වන අරගලය නිරන්තරව ජයගනී. ඒ අතර එම අභියෝගයන් හමුවේ තාවකාලිකව පරාජය වන අවස්ථාද පවතී. එහෙත් අනෙක් සතුන්ට සොබාදහම තම අණසකට යටත් කරගැනීමට නොහැකි නමුත් මිනිසා උපකරණ හරහා එය සිදුකරයි. ඔහු ප්‍රකෘතිය හා නොනවතින අරගලයක යෙදේ. ඔහු ඒ සඳහා තම කායික මානසික ශක්තීන් යොදවන නිෂ්පාදකයෙකි. මිනිසා නිෂ්පාදන හිමිකාරිත්වයේ පෞද්ගලික හිමිකම මත තම සාමූහිකත්වය නැතිකරගත් තැන් පටන් පංති බිහිවිය. දැන් මිනිසාට ප්‍රකෘතිය හා අරගලයටද ඉහළින් පීඩක පංතියට එරෙහි පීඩිත පංතියේ අරගලය ලෙසද අරගලයක් පවතී. මෙතැන් පටන් ඔහු ජීවන අරගලයෙහි දෙයාකාරව යෙදේ.

මෙම පැවැත්ම සඳහා වන අරගලයන් දෙක විසින් මිනිසාට (නිශ්චිත අභියෝගයන්ට) සාපේක්ෂව තෘප්තිමත් බවක් හා (ශ්‍රම විමුක්තිය පූර්ණ වශයෙන් ලැබීම තුළ) නිරපේක්ෂව තෘප්තිමත් බවක් ලබාදේ. පංති විරහිත සමාජයකදී නැවත ප්‍රකෘතිය හා මිනිසා අතර අරගලය ඉස්මතු වන නමුත් තාක්ෂණයේ දියුණුව විසින් එය දුෂ්කර මාවතක නොයයි. වැඩකාලයේ අධික පංගුවක් තාක්ෂණයට බාර කරමින් මිනිසාට ශ්‍රම කාලය යැයි නිමේශයක් ඉතිරි වේ. එපමණක් නොව සමස්ත ජීවිතයම ශ්‍රම සූරාකෑමෙන් නිදහස් බැවින් ඔහුගේ සමස්ත ජීවිතයම බාධාවකින් තොර සංස්කෘතික එකකි.  එනිසා මිනිසාගේ සතුට තව දුරටත් වර්ධනය වෙමින් එහි තෘප්තිමත්භාවය ඉහළින්ම පවත්වා ගනී. එනිසා මිනිසාගේ 'සමාජමය සතුට' නිරපේක්ෂ සතුට ලෙසද සාපේක්ෂ සතුට ලෙසද දෙයාකාර වේ. මිනිසා නිරන්තර අරගලය වෙත යොමු වූ රළු මනසක් සහිත බවෙන් මිදෙන්නේ සෞන්දර්යය පිළිබඳ සංවේදිතාවයෙනි. මිනිසා නොවන්නට මිහිමත සෞන්දර්යය නම් වින්දනයක් නැත. එය

ග්‍රහණය කරගැනීම හා වින්දනය කළ හැකි ඉන්ද්‍රියයන් පවතින්නේ මිනිසා තුළ පමණි. ගස්මත විසූ වානර මානවයා තවදුරටත් බිම්වැසි මානව වානරයා වන්නට වසර ලක්ෂ ගණනක් ගතවූ බව කිව හැකිය. එමෙන්ම හුදු සත්ව සංවේදනාවන්ගෙන් තම පැවැත්ම ඇරඹි මිනිසා සෞන්දර්යය ග්‍රහණය කරගත හැකි සත්වයෙකු වන්නේ එය අල්වා ගත හැකි සියුම් චින්තනයෙන් යුක්ත වීමත් සමඟය. එය දීර්ඝකාලීන සමාජවිද්‍යාත්මක පරිණාමයකි. සෞන්දර්යය විද්‍යාවට පෙර සෞන්දර්යය වින්දනය ඇති විය. සෞන්දර්යය වින්දනය සොබාදහමේ ලාලිත්‍යයෙන් ඇරැඹ අධ්‍යාත්මය තුළ එය ප්‍රතිනිර්මාණය දක්වා ප්‍රකාශ කරන තත්ත්වයට වර්ධනය වන්නේ දිගු ගමනක් ඔස්සේය.

අඩ කුසගින්න මැඩ බිහිවූ 'සතුට'

ආදි මානවයා සාමූහිකත්වයට පෙළඹුණේ උපකරණ හා ආහාර නිෂ්පාදනයේ වුවමනාව විසින්ය. වානර ලක්ෂණ වැඩි සාපේක්ෂව මානව ලක්ෂණ භෞතිකව හා අධ්‍යාත්මිකව අඩු වානර මානවයා හෙවත් වානර මිනිසා වැඩිමනත් සොබාදහමේ වහලෙකි. එහෙත් ඔහු සොබාදහම පැරැදවීමේ සටන අරඹා ඇත. ආදි මානව පරම්පරාවන් වසර ලක්ෂ ගණනක් තිස්සේ පරිණාමය වෙමින් වානර ලක්ෂණ යටපත් කරමින් (මානව ලක්ෂණ වැඩි බව ගුණයක් බවට පත්වූ මානව වානරයා හෙවත් මිනිස් වානරයා) මිනිසා බිහිවිය. එම කතන්දරයේ ඔවුහු පරම්පරා ගණනාවක් දිවි ගෙවූයේ අඩ කුසගින්නේය. මානව සමාජ සංවර්ධනයේ මෙයට වසර ලක්ෂ ගණනාවකට පෙර ගින්දර පිළිබඳ අත්විඳීම් වර්ධනය වන්නට විය. එය ආසන්න වශයෙන් වසර ලක්ෂ 4ක් දක්වා වුව විය හැකිය. ගින්න පාලනය උගනීමෙන් පසු මිනිසා එහි ගුණාංග හඳුනාගනිමින් මානව පරිහරණයේදී උපාංගයක් බවට පත්කර ගත්තේය. ගින්න විසින් මිනිස් උදරය හා අන්ත්‍රයන්ට පෙර පිටතදීම ආහාර අඩ වශයෙන් ජීරණය කරයි. ගින්දර පාෂාණ මෘදු කරයි. වානේ උණු කරයි. මැටි ශක්තිමත් කරයි. වනය ගිනිතබා සතුන් දඩයම පහසු කරයි. අඳුර පලවා හරී. කෘමි උවදුරුවල සිට විලෝපිතයන් දක්වා උවදුරුවලින් ආරක්ෂා කරයි. දිවා කල ජීවන අරගලයේ වෙහෙස රාත්‍රී කාලයේ නිවා දමන්නේද ගෝත්‍රය තුළ අත්දැකීම් හුවමාරු වන්නේද මෙම විවිධ ආකාරයෙන් ප්‍රයෝජනවත් ගිනිමැලය වටාය. කතන්දර කලාව බිහිවන්නේ එතනින්ය. කතන්දර යනු මිනිසා තම අත්විඳීම් අත්දැකීම් හුවමාරු කරගන්නා ප්‍රබල සහ ව්‍යාප්ත මාධ්‍යයයි. ශබ්ද සංකේත අඩු, අංග චලනය වැඩි අවදියේ මිනිසා කතන්දර කීමේදී කටට වඩා භාවිතා කළේ අත, පය, ඇස සහ මුහුණය. ඒවා වත්මන් නාට්‍ය කලාවේ ආංගික අභිනයට අයත්ය. කතන්දර කීම කලාවක් වන්නේ යථාර්ථයද, අතිශෝක්තියද, අපූර්වත්වයද එහි පවතින නිසාය. මිනිස් චින්තනය පරිකල්පනය දක්වා විකාශනය කතන්දර කලාව හෙවත් සෞන්දර්යාත්මකව අත්දැකීම් හුවමාරුව හරහා සිදුවිය. පරිකල්පනය යනු පවතින දේවල් භාවිතයෙන් යමක් මනෝමය මැවිල්ලකට ගෙන යාමේ සුවිශේෂී මානව හැකියාවයි. අපූර්වත්වය හෙවත් නව අත්දැකීම්වලින් විශ්මයටද, ප්‍රීතියට පත්වීමේ මානව චින්තනයේ ගුණය විසින් පරිකල්පනයට අවස්ථාවන් හා ඉල්ලුම බහුල විය. සමස්ත මානව සමාජයම කතන්දර නිර්මාපකයින් විය. සමස්ත සමාජයට අපූර්වත්වය වින්දනය කරන්නන් විය. ත්‍රාසයද, භීතියද, අත්හැරීමේ වේදනාව හෙවත් ශෝකයද වැනි සියලු මනෝභාවයන් පරිකල්පනය මගින්



> කතන්දර කීමට භාෂාවේ වර්ධනයත්, භාෂාවේ වර්ධනයට කතන්දර කලාවත් අන්‍යෝන්‍යව බලපෑවේය. එනිසා අත්දැකීමද සතුටද යන අත්‍යවශ්‍ය ප්‍රතිලාභ දෙකම කතන්දර කලාව හරහා ලැබීම විසින් මානව සමාජ සංවර්ධනයේ අනිවාර්ය හුයක් සේ සියලු සමාජයන් ඔස්සේ අත්දැකීම් අඩංගු කතන්දර කලාව වර්ධනය විය. එය අඩ කුසගින්නේ මස් නැති මස් කටුවක් ලොවමින් අසා සිටි ශ්‍රාවකයාගේ සිට කුසද, මනසද ආහාර සංස්කෘතියෙන් සන්තර්පනය කොටගනිමින් ශ්‍රව්‍ය දෘෂ්‍ය කතන්දර නරඹන ප්‍රේක්ෂකයා දක්වා වර්ධනය විය.

කතන්දරයක අතිශෝක්තියෙන්ද උලුප්පවා අපූර්වත්වයක් නිමවිය හැකි කතන්දර කලාව මානව අත්දැකීම් හුවමාරුවට අත්‍යවශ්‍ය අත්දැකීම් හුවමාරු හා ඉගැනුම් මාධ්‍යයක් විය. කතන්දර කීමට භාෂාවේ වර්ධනයත්, භාෂාවේ වර්ධනයට කතන්දර කලාවත් අන්‍යෝන්‍යව බලපෑවේය. එනිසා අත්දැකීමද සතුටද යන අත්‍යවශ්‍ය ප්‍රතිලාභ දෙකම කතන්දර කලාව හරහා ලැබීම විසින් මානව සමාජ සංවර්ධනයේ අනිවාර්ය හුයක් සේ සියලු සමාජයන් ඔස්සේ අත්දැකීම් අඩංගු කතන්දර කලාව වර්ධනය විය. එය අඩ කුසගින්නේ මස් නැති මස් කටුවක් ලොවමින් අසා සිටි ශ්‍රාවකයාගේ සිට කුසද, මනසද ආහාර සංස්කෘතියෙන් සන්තර්පනය කොටගනිමින් ශ්‍රව්‍ය දෘෂ්‍ය කතන්දර නරඹන ප්‍රේක්ෂකයා දක්වා වර්ධනය විය. එම කතන්දර කලාව දෙබස්, ගායනය, සංගීතයේ හා චිත්‍රයේ සංකලනයක් වන ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයේ කතන්දර කලාව දක්වා බොහෝ දුර පැමිණ අද ඩිජිටල් තාක්ෂණය දක්වා පැමිණ ඇත. කතන්දර කලාව ධනවාදයේදී කර්මාන්තයක්වීම විසින් එහි සීමාවන් හා ලාභ අරමුණු බාධාවක් වුවද කලාවක් ලෙස එය මානව වංශ කතාවේ නොනවතින කලාවකි. ඒ අනුව සියලු කලා ධාරාවන් කතන්දර කලාවේම විකාශනයන්ය.

වනචාරී මිනිසා මෙන්ම ශිෂ්ටාචාරවත් මිනිසාද තම සතුට ලබන්නේද මෙම සංස්කෘතික ස්වභාවය තුළය. ජීවන අරගලයේ තම අත්දැකීම් කතන්දර කලාව හරහා හුවමාරුවේදී ඔවුහු වින්දනයක් ලබති. කතාවට හවුල් වෙති. ගායනයට අත්වැල් අල්ලති. රංගනයේ රිද්මයන්ට තම මස් පිඬු චලනය කරති. ඔවුහු එහිදී තම ජීවන අරගලයේ කටුක දුෂ්කර ගමන් මඟට වෙහෙස පලවා හරින සතුට උදාකර ගත්හ. දහවල කටුකත්වය දුෂ්කර බව රාත්‍රී ගායනයෙන්, රංගනයෙන් සෝදා හැර රාත්‍රී නින්දෙන් ස්නායු හා පේශී සෛල ප්‍රකෘතිමත් කොට පසුදා ජීවන අරගලයේ මහපංගුවට උරදෙති. ජීවිතයේ දුෂ්කර බව විසින්ම, අවිනිශ්චිත බව විසින්ම ඔවුහු මනස සතුටින් පොළඹවන සදාකාලික කලා ධාරාවන් නිමවන ලදී.

නිරිත දිග ප්‍රංශයේ "ලැස්කොක්ස්" (Lascaux) ගුහාවල 600ක් පමණ වන ගුහා චිත්‍ර සාක්ෂි දරන්නේ කතන්දර කලාවේ ඉතිහාසය ගැනයි. කතන්දරකරුවාගේ මතකය සඳහා කතන්දර චිත්‍රයට නැගීම ඇරැඹෙන්නේ අදින් වසර 17,000කට පමණ පෙර බව මෙම ගුහා චිත්‍ර සාක්ෂි දරයි. ලොව පළමු ශිෂ්ටාචාරය ලෙස සැලකෙන (ක්‍රිපූ 4100 - 1750) මෙසපොතේමියාව හෙවත් යුප්‍රටීස් සහ ටයිග්‍රීස් දෙගම්මැදි රාජ්‍යයේ ක්‍රිපූ 3200 පමණ බිහිවූ කියුනිෆෝම් cuneiform systum නම් ලේඛන පද්ධති හරහා කතන්දර ලේඛන පිළිබඳ මුල්ම සාක්ෂි හමුවේ. සුමේරියන්වරුන් මැටි පුවරු මත තෘණ බටයක් වැන්නකින් ලියන ලද කුඤ්ඤ හැඩති චිත්‍රාක්ෂර උපයෝගි කොට සලකුණු කළ බියර්, ධාන්‍ය පිළිබඳ වාර්තාද ඉතිහාස කතන්දර විය. ඔවුහු ගවයා දැක්වීමට ගව හිසද ධාන්‍ය දැක්වීමට ධාන්‍ය කරලද සටහන් කළේය. පසුව වර්ධනය කළ එම අක්ෂරවලින් වීරකාව්‍යද ලියවිණි. ජනශ්‍රැති, ලිඛිත කතා, වීරකාව්‍ය, හාස්‍ය ආදි ලෙස වර්ධනය වූ කතන්දර කීම, ගායනය, රංගනය, සංගීතය, සියල්ල එකට මුහුකළ චිත්‍රපටිය දක්වා වර්ධනය විය. පච්ච කෙටීමද කතන්දර කලාවට අයත් වන්නේ මුල් යුගයේ ඒ තුළ පෙළපත ආදි විස්තර චිත්‍රණය වීම නිසාය. සමාජ මාධ්‍ය තුළ කෙටි පණිවිඩ හා කමෙන්ට්ස් යන්නද මෙම මිනිසාගේ කතන්දර කලාවේ ඇබ්බැහියේ ප්‍රකාශනයකි. කතන්දර යනු මානව අත්දැකීම්වල ගඩොල්ය. කතන්දර කලාවේ වර්ධනය අනුව ඒවා එක මත එක ගොඩගැසේ.

රෝමය ගිනිගනිද්දී ප්‍රභූන් අත

වැයුණු වීනාව මිනිසා පසුකළ සාමූහික සමාජය පංති සමාජයක් බවට පත්විය. කතන්දර කලාවේ පොදු වර්ධනය ඉහළ ගියද එහි අයිතිය සමාජ සන්තක භාවයෙන් ප්‍රභූ පංතිය වෙතට ඩැහැගන්නා ලදී . වහල් යුගයේ වහල් හිමියාද වැඩවසම් යුගයේ වැඩවසම් හිමියාද, ආසියාතික සමාජයේ ප්‍රබල රජුන්ද ප්‍රමුඛ ප්‍රභූ පංතීන්ගේ අලස ශරීර සන්තර්පනය වෙනුවෙන් විසල් උදර සන්තර්පනයකට අවශ්‍ය පහසුකම් සැපයීම උදෙසා වෙනස් ආකාර කිහිපයක ශ්‍රම සූරාකෑමකට ලක්වන්නට වෙන් වෙන්ව වහලාටද, වැඩවසම් ප්‍රවේණිදාසයාටද, ආසියාතික යටත් වැසියාටද සිදු විය. ඔවුනට ඉතා ක්ෂුද්‍ර විකල්ප කතන්දර කලාවන් තිබෙන්නට ඇත. එහෙත් කතන්දර කලාවේ වින්දනයේ හා අත්දැකීම් ලැබීමේ අවසන් අනිවාර්ය හිමිකරුවන් වූයේ ප්‍රභූන්ය. එනිසා රෝමය ගිනිග නිද්දී වීනා වැයුවේ සටන්කාමි ස්පාර්ටකස්ලා පරපුරේ අය නොව ප්‍රභූ පංතියේ නීරෝලාය. සැබැවින්ම කලාව ප්‍රභූ පංතියේ සතුට දෙන උපකරණය විය. වීර කාව්‍ය ලියුවේ ප්‍රභූන් ඇසුරෙහි වූවන් විසිනි. ඒවා රස වින්දේ ප්‍රභූන්ය. එනිසා කතන්දර කීමේ කලාව ක්‍රි.පූ. 2 පමණ ඊෂොප් ගේ කතා නම් ජනශැතිවල සිට බයිබල් කතා ආදී සියල්ල සාමාන්‍ය ජනතාව උදෙසා නොවීය. එනිසාම අකුරු නොදත් සාමාන්‍ය ජනතාව වෙනුවෙන් අකුරු දන්නා ප්‍රභූන් කතන්දර කියන කලාවක්ද බිහිවිය. ශ්‍රී ලංකාවේ ජාතක පොත කියවීම උදාහරණ වේ. ඉලියඩ්, රාමායනය සහ මහාභාරතය වැනි වීර කාව්‍යයන් ලියවුණේ එම ප්‍රභූ පංතියේ රසවින්දනය උදෙසාය. රාමායනය ලියූ වාල්මිකී රජගෙ දර ඇසුරු කළ කලාකරුවෙකි. ලංකාවේ මුලින්ම ප්‍රශස්ති බිහිවන්නේ "කුණ්ඩසාලේ දෙවියෝ" නම් ලද කීර්ති ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු පිනවීම පිණිසය.

ධනවාදී 'හුවමාරු භාණ්ඩයක්' ලෙස සතුට වෙළඳ භාණ්ඩවලින් සැදි ධනවාදයේදී කතන්දර කලාව කර්මාන්තයක් බවට පත්වේ. ඕනෑම වෙළඳ භාණ්ඩයක් යාචකයා දක්වාම යෑම වෙළඳපොළ ආර්ථිකයේ ස්වභාවය බැවින් 'කතන්දර අලෙවිය' ප්‍රභූ සමාජයෙන් පහළ නිර්ප්‍රභූ පංතී වෙතද ප්‍රවේශ විය. සාමාන්‍ය ජනතාව තුළද ඔවුනගේ ජීවන වෘත්තීන් හා බැඳි කතන්දර කලාවක් වේ. ආසියාතික සමාජයෙන් එළැඹි ධනවාදය තුළද අතීත නටබුන් ලෙස පැවැති ජනශ්‍රැති හා ජන කලාව ජනතාවට සතුට දෙමින් වියැකෙන්නේද දැන් ඒ වෙනුවට ඩිජිටල් කතන්දර කලාව ආදේශ වන්නේද ධනවාදී වෙළඳාමට කතන්දර කලාවද එක්වන බැවිනි. නවකතාව පමණක් නොව සියලු කලාවන් හරහා කියවෙන කතන්දර කලාවේ මෙම වෙළඳ භාණ්ඩ ස්වභාවය, ප්‍රකාශකයා හා නිර්මාණකරුවා අතර (ශ්‍රමිකයින් හා ප්‍රාග්ධනය යොදවන්නන් අතර) ද ගැටුම විවිධාකාරයෙන් ප්‍රකාශ වේ. අතරින් පතර මින් පරිබාහිරව උසස් කතන්දර කියන චිත්‍රපට, ටෙලි නාට්‍ය, ඔපෙරා, නවකතා ආදිය බිහිවුණත් පොදුවේ බිහිවන වැඩිමනත් කතන්දර නම් වෙළඳ භාණ්ඩ නිර්මාණ ගුණයේදී ආකෘතියට ආලවට්ටන් දමා අන්තර්ගතය දියාරු කර දමයි. එය අනෙක් අතට ප්‍රභූ පංති කලාවේ මතවාදී වුවමනාවයි. ධනවාදී කතන්දර කලාවට නිදහස්වීමට ධනවාදී මුදල් බන්ධනය ඉඩදෙන්නේ නැත. නවකතාකරුවන් හා ඩිජිටල් පුස්තකාල අතර ගැටුම එයයි. එසේ වන්නේ කතන්දරයේ නිර්මාණකරුවා කතන්දරයේ හිමිකරු නොවී එහි අර්ධ ශ්‍රමිකයා වීමයි. ඔහු ශ්‍රමයට වටිනාකම් ලබන්නේ ප්‍රකාශකයාට ලොකු පංගුවක් දෙමිනි. නිර්මාණයේ හිමිකම සදාකාලිකව ප්‍රකාශකයා සතු කරන කොන්දේසි පවා විය හැකි යථාර්ථයක් ධනවාදී වෙළඳපොළෙහි පවතී. කතන්දර කලාව මෙම තත්වයෙන් මිදෙන්නේ ශ්‍රමය නිදහස්වීමට අනුවය. සමාජ ශ්‍රමයේ නිර්මාණයන් සමාජ සන්තක වී සාධාරණව බෙදී යන ක්‍රමයකදීය. එනම් සතුට ප්‍රභූ පංති ග්‍රහණයෙන් මිදෙන විටකදීය.

සතුට යළි සමාජ සන්තකවීම

නිෂ්පාදන උපකරණ හා අමුද්‍රව්‍ය සමාජ සන්තක වන සමාජයක සමාජ ශ්‍රමයේ නිෂ්පාදිතය සමාජ සන්තක වේ. එවන් සමාජයක කතන්දර කලාවද නිදහස් සමාජයක නිදහස් මිනිසුන්ගේ හිමිකමක් වේ. පංති සමාජයේ නටබුන් හෝ පවතින තුරු කතන්දර කලාව සමග සතුටද පෞද්ගලික හිමිකමක් වේ. එය වෙළඳ භාණ්ඩයක් වනතුරු එය අලෙවි වීමේ ගුණය සහිතය. එය එම තත්වයෙන් නිදහස්වීමට සාපේක්ෂව  කතන්දර කලාව මගින් අත්දැකීම් හුවමාරුවද, සතුට හුවමාරුවද  වෙළඳ භාණ්ඩ තත්වයෙන් මිදේ. ප්‍රවේශපත් නොමැතිව කතන්දර අසන්නට දකින්නට විඳින්නට හැක්කේ ඉහත තත්වය පරිපූර්ණත්වයට පත්වන දිනක සිටය. මුදල් නොගෙවා තීන්ත, පින්සල් ගෙන සමාජය උදෙසා දැනුමද, සතුටද දෙන්නට චිත්‍ර ශිල්පීය කතන්දරකරුවකුට හැකි වන්නේ එවිටය. එනිසා නිරපේක්ෂ නිදහස නිරපේක්ෂ සතුට වෙත ළඟාවන මාවත

පවතින්නේ ධනේශ්වර වෙළඳ භාණ්ඩ නිෂ්පාදනයෙන් ශ්‍රමයද කතන්දර කලාවද විමුක්තිය ලබන දිනකය. එතෙක් මිනිසා සාපේක්ෂ සතුට තුළ පවතී. එහෙත් සතුට මිනිසාට අවශ්‍යය.

නිමාවට පෙර අදහස සාරාංශයක් ලෙස සතුට පමණක් ඒක පාර්ශ්වීයව පවතිනවා වෙනුවට අභියෝගයද අනෙක් පාර්ශ්වයේ පවතිමින් මිනිසා විටෙක වෙහෙසටද, විටෙක සතුටට පත්වනු ඇත. වෙහෙස යන්න කායික මානසික විඩාවයි. පේශි සෛල හා ස්නායු සෛල විවේකය ඉල්ලීමයි. මානව සමාජය යළි ආපසු ම්ලේච්ඡත්වයට නොයන්නේ නම් එය අනිවාර්යයෙන්ම වෙහෙස අවම කරන සමාජ තත්ත්වයක් නිමවයි. මිනිසා තාක්ෂණය දියුණු කරමින් තම කායික වෙහෙස අවම කරගන්නට දරන උත්සාහයේ අනෙක් පස AI තාක්ෂණය මගින් ඇති කරගන්නා සිතීමේ බර රොබෝ තාක්ෂණයට දීමේ උපක්‍රමය හරහා ඔහු තම මානසික වෙහෙසද අවම කරගනී. මිනිසාට අංශු මාත්‍රයක හෝ වෙහෙසක් දරන්නට සිදුවන්නේ කිසිදු කෘත්‍රිම බුද්ධියක් හෝ වෙනත් තාක්ෂණයක් මානව ශ්‍රමයෙන් මුළුමනින්ම වෙන්ව නොපවතින නිසාය. මනෝමූලිකව රෝබෝ සමාජයක් ගැන සිතුවද සැබැවින්ම එය මිනිසාට යටත්, අවනත යාන්ත්‍රික මෙවලම් සමූහයක් පමණි. එනිසා මිනිසා අනවරතව තාක්ෂණය දියුණු කරයි. එය ක්‍රියාත්මක කරන යන්ත්‍ර නිපදවයි. එය මිනිස් ශ්‍රමයේ ස්වභාවයයි. ශ්‍රමය තමන් විසින්ම තමන් දියුණු වෙමින් ශ්‍රම උපකරණ ඉහළ නන්වයි. ඒ අනුව ඔහු නිපදවන්නේ පොදු සමාජ ශ්‍රමයට යටත් තාක්ෂණය හා තාක්ෂණික මෙවලම්ය. රොබෝ තාක්ෂණය යනු තාක්ෂණ වර්ධනයේ එක් හැරවුමකි. එය යන්ත්‍ර බිහිවීම, නැනෝ තාක්ෂණය, පරිගණක තාක්ෂණය වැනි තාක්ෂණික හැරවුමකි. තාක්ෂණය නමැති දරුවා උපදින්නේ මිනිස් ශ්‍රමයට දාවය. මිනිසා මැවුම්කරුවාය. තාක්ෂණය එම නිමවුමේ ඵලයයි. තාක්ෂණ උපක්‍රමය හරහා ශ්‍රමයේ ඵලදාව වැඩි කරමින් යන ගමනේ සූරාකෑම අහෝසි වෙමින් මිනිසාගේ සංස්කෘතික ජීවිතයට වඩා ඉඩදෙමින් විවේකය වැඩි කළ යුතුය. මිනිසාගේ අභියෝග එය ජයගැනීම උදෙසා වන කාර්යයේදී ඔහුගේ වෙහෙස අඩු කළ යුතු වීමයි. එය විසින් තෘප්තිමත්භාවය වැඩි මිනිසා බිහිවේ. කතන්දර කීම මගින් අත්දැකීම්ද, සතුටද හුවමාරු වන අතර ඒ තුළ බිහිවන කලාවන් තුළින් හා සාමූහිකත්වයන් තුළින් බිහිවන නව සංස්කෘතික මිනිසා සතුට ප්‍රහර්ෂය දක්වා ඔසවනු ඇත. එනිසා මානව ශ්‍රම අරගලයේ අවසන ඔසවන ධජය ශ්‍රම විමුක්තිය හෙවත් සතුටේ ඉහළම අවස්ථාව ප්‍රහර්ෂයයි.








# සමනලයාගේ අරගලය!

වරෙක මිනිසෙක්ට සමනල කෝෂයක් හමුවිය. කෝෂ අවධිය යනු සමනලයකුගේ ජීවන චක්‍රයේ වැදගත් අවස්ථාවකි. සමනලයාගේ බිත්තරවලින් මුලින්ම බිහි වන්නේ දළඹුවෙකි. දළඹුවා ලෙස කාලයක් ගත වීමෙන් පසු ඌ තමා විසින්ම කෝෂයක් තනාගෙන එහි කාලයක් ගත කරයි. ඒ තුළ දළඹුවා සමනලයෙකු දක්වා වැඩෙන අතර නිසි කාලයේ කෝෂය විදගෙන ඉන් පිටතට පැමිණේ.

කෝෂය හමුවූ මිනිසා දිගටම එය නිරීක්ෂණය කරමින් සිටියේය. දිනෙක ඔහු සමනල කෝෂයෙහි කුඩා සිදුරක් නිරීක්ෂණය කළේය. කුතුහලයෙන් සිටි ඔහුට එම කුඩා සිදුර හරහා සමනලයා තම ශරීරය එළියට තල්ලු කිරීමට වෙහෙස වන ආකාරය දක්නට ලැබුණි. කුතුහලයෙන් එය නිරීක්ෂණය කරමින් සිටි ඔහු දුටුවේ විටෙක කෘමියා තම උත්සාහය අතහැර දමා සිටින බවකි. ඔහුට කනස්සල්ලක් දැනෙන්නට විය. කණගාටුවට පත් මිනිසා සමනලයාට උදව් කිරීමට තීරණය කළේය. ඔහු කතුරකින් සමනල කෝෂයේ කොනක් කපා දැමුවේය. මිනිසාගේ උදව්ව නිසා සමනලයා ආයාසයකින් තොරවම කෝෂයෙන් එළියට පැමිණියේය. එහෙත් එළියට පැමිණියේ පූර්ණභාවයට පත් වූ සමනලයෙක් නොවේ. ඌ ඉතා මහත ශරීරයක් සහ හැකිලී ගිය කුඩා අත්තටුවලින් සමන්විත කෘමියෙක් වීය. මිනිසා ඉවසිලිවන්තව බලා සිටියේය. සමනලයාගේ ශරීරය දැඩි වී පියාපත් වර්ධනය වී ඌ ඉක්මනින්ම පියාඹනු ඇතැයි මිනිසා අපේක්ෂා කළේය. කෙතෙක් බලා සිටියද එය සිදුවූයේ නැත.

සමනලයා තම ජීවිතයේ ඉතිරි කාලය නොවැඩුණු පියාපත් සහ ඉදිමුණු ශරීරය සමඟ බඩගා ගියේය. මිනිසා ඉතා යහපත් චේතනාවකින් කටයුතු කළද ඔහු ඉතා වැදගත් කාරණයක් නොදැන සිටියේය. සීමිත ඉඩක් සහිත සමනල කෝෂය සහ ඉන් පිටතට වීමට සමනලයා කරනු ලබන අසීමිත අරගලය සමනලයකු වීමේ ගමන් මගේ ඌ පසුකර යා යුතු අත්‍යවශ්‍ය පියවරයන් විය. ඒවා අභියෝගයන් වුවද බාධාවන් නොවේ. සීමිත ඉඩක් සහිත කෝෂය සහ ඉන් පිටවීමට කරන අරගලය මගින්ම සමනලයාගේ සිරුර සහ පියාපත් දැඩි සහ ශක්තිමත් බවට පත්කරනු ලබයි. ඌ පියඹා යාමට සුදුසු බවට පත් වන්නේ එමගිනි. එම ගමන් මග සොබාදහම් නිර්මාණයේම කොටසක් බව මිනිසා නොදැන සිටියේය.

මෙය අපට අපූරු ගැඹුරු පාඩමක් කියා දෙන කතාවකි. අපගේ ජීවිතයේ අරගලයන්ද අපගේ ශක්තිය වර්ධනය කිරීම සඳහා නිරන්තරවම කාර්යභාරයක් ඉටු කරයි. අභියෝග නොමැති විට අපි ශක්තිමත් පුද්ගලයින් බවට පත්වන්නේ නැත. අභියෝග නොමැති විට අපි වර්ධනය අත්විඳින්නේ නැත. අභියෝග දුෂ්කරතා අපි හඳුනාගත යුත්තේ ඉහළට නැගීමට ඇති පියගැටපෙළක් ලෙසය. ඉදිරියේදී ඔබට අභියෝගයක් හමුවූ සෑම විටකම "සමනලයාගේ අරගලය" මතක තබාගන්න.



# ශක්තිමත් ලණු සහ දුර්වල අලි!

ගොඩබිම වාසය කරන විශාලම ශරීරයක් සහිත ශක්තිමත්ම සත්වයා අලියායි. දිනක් මිනිසෙක් අලි ගාල් කරන ලද තැනක් අසලින් ගමන් කරමින් සිටියේය. එහි සිටි කිසිම අලියෙක් විශාල කූඩුවල දමා කොටු කර හෝ විශාල ශක්තිමත් දම්වැල්වලින් බැඳ නැති බව ඔහු නිරීක්ෂණය කළේය. ඒ වෙනුවට ඉතා කුඩා ලණු කැබැලිවලින් එක් එක් අලියාගේ එක් කකුලක් ගැටගසා එය කුඩා කණුවකට ගැට ගසා තිබෙනු ඔහු දුටුවේය.  විශාල ගස් පෙරළා බිම දමන, අති විශාල බරක් එසවිය හැකි අලියාට එවැනි ලණු කැබැල්ලක් කඩා දැමීම ඉතා පහසු කටයුත්තකි. එහෙත් කිසියම් හේතුවක් නිසා අලි එසේ නොකරති.

කුතුහලයෙන් පිරුණු මිනිසා කොනක වාඩි වී සිටි අලි බලන්නා වෙත ගොස් අලින් මෙසේ කරන්නේ මන්දැයි ඔහුගෙන් ප්‍රශ්න කළේය. අලි බලන්නා මෙසේ පිළිතුරු දුනි.

”මේ අලි පුංචි පැටව් කාලයේ අපි බැඳලා තිබ්බේ මේ කුඩා ලණුවලින්. ඒ කාලයේ උන් ඒවා කඩාගෙන යන්නට උත්සාහ කළා. ඒත් උන්ට ඒවා කඩාගෙන යාමට හැකියාවක් තිබුණේ නෑ. යම් කාලයක් උත්සාහ දැරීමෙන් පසු උන් ඒවා කඩා ගෙන යාමේ අදහස අතහැර දැම්මා. ඒ පුංචි කාලයේමයි. නමුත් දැන් මේ අලි ලොකු උන් වුණත් උන්ව නවත්වන්න මේ කුඩා ලණුවම ප්‍රමාණවත්. උන් තවමත් හිතන්නේ ඒ ලණු කඩාගෙන යාමට උන්ට හැකියාවක් නැහැ කියායි. ඒ සඳහා කුඩා කාලයේ අතහැර දැමූ උත්සාහය උන් නැවතත් ගන්නේ නැහැ. උන්ගේ මේ විශ්වාසය නිසා අපිට කිසි අපහසුවකින් තොරව මේ පුංචි ලණු කැබලිවලින් උන්ව පාලනය කරන්න පුළුවන්.

ඉදින් අප ගැන කතාන්දරයද මේ හා සමානය. මේ සමාජයේ අප බොහෝ දෙනෙක් තවමත් මේ වගේ පුංචි දුර්වල ලණු කැබලිවලින් පාලනය වෙයි. සමහර විට ඉතා කුඩා උත්සාහයකින් වුවත් අපට ඒවා කඩා දැමිය හැකි බව අපි නොදනිමු.



# හොඳ අවස්ථා සහ නරක අවස්ථා!

තරගකාරී සපත්තු සමාගම් දෙකක් තම වෙළඳපොළ පුළුල් කිරීමේ විභවතාවය ගැන පරීක්ෂා කරමින් සිටියේය. සමාගම් දෙකම තම ආයතනවල සිටි හොඳම නියෝජිතයා තෝරාගෙන ඔවුන් අප්‍රිකා මහද්වීපයේ එක් රටකට එකම දවසේ පිටත්කර හරින ලදී. එහි පැමිණ දිනකට පසු පළමු සමාගමේ නියෝජිතයා ටෙලිග්‍රාෆ් පණිවිඩ යවන කාර්යාලයක් සොයාගෙන ගොස් තම සමාගමේ ප්‍රධානියාට පණිවිඩයක් එවන ලදී. එම පණිවිඩය මෙසේ විය.

"සමීක්ෂණය සම්පූර්ණයි.
තත්ත්වය බලාපොරොත්තු රහිතයි.
මෙහි කිසිවෙකු සපත්තු පළඳින්නේ නැත."

දෙවැනි සමාගමේ නියෝජිතයාද අප්‍රිකාවට පැමිණ දවසකට පසු ඉහත ටෙලිග්‍රාෆ් කාර්යාලයටම ගොස් තම සමාගමේ ප්‍රධානියාට පණිවිඩයක් එවන ලදී. එම පණිවිඩය මෙසේ විය.

"සමීක්ෂණය සම්පූර්ණයි.
ඇදහිය නොහැකි අවස්ථාවකි.
මෙහි කිසිවෙකු සපත්තු පළඳින්නේ නැත."



# සම්ප්‍රදාය!

එක් වැඩිහිටි භික්ෂුවක් උන්වහන්සේගේ ගෝල හිමිවරුන්ද සමඟ ගම් නියම් ගම්හි පිඬුසිඟා එම පිණ්ඩපාතයෙන් යැපෙමින් ඉතා ශික්ෂාකාමීව වැඩ වාසය කළහ. ප්‍රධාන භික්ෂූන්වහන්සේ ඉතාමත් උගත්, දැනුවත්, ශික්ෂාකාමී හිමිනමක් වූ බැවින් ගම්වැසියෝ උන්වහන්සේට අතිශයින් ගෞරවයෙන් ඇප උපස්ථාන කළහ. දන් පිරිනැමූහ. උන්වහන්සේගේ ගෝල හිමිවරු තම ගුරු හිමියන්ගේ උගත් භාවය සහ ශික්ෂාකාමීභාවය හොඳින් දැන සිටියහ. එබැවින් සෑම විටකම උන්වහන්සේ අනුගමනය කිරීම උන්වහන්සේගේ අවවාද අනුශාසනා ලැබීම ගෝල භික්ෂූන් විසින් නොපිරිහෙලා සිදු කළහ. පිණ්ඩපාතයේ වඩින ගුරු හිමියන් තමන්ට පිණ්ඩපාතය ලැබෙන පළමු අවස්ථාවේ තමන්ගේ පාත්‍රය හිසට උඩින් හිරු දෙසට ඔසවා ඒ දෙස බලා ඉන්පසුව දානය පිළිගැනීම සෑම දිනකම සිදුවිය. එය වැදගත් සම්ප්‍රදායක් හෝ විනය කටයුත්තක් ලෙස සැලකූ ගෝල හිමිවරුන්ද එම සම්ප්‍රදාය එලෙසම අනුගමනය කරන්නට වූහ. කලක් යන විට  ප්‍රදේශයෙහි ගම්වැසියෝ ද එම සම්ප්‍රදාය ගැන හොඳම අවබෝධයෙන් කටයුතු කළහ.

ගුරු හිමියන් සෑම විටම ඉදිරියෙන්ම වඩින බැවින් තම ගෝලයන් තමන් අනුගමනය කරමින් සිදුකරන මේ සම්ප්‍රදාය බොහෝ කලකට ගුරු හිමියන්ට නිරීක්ෂණය නොවීය. කෙසේ වෙතත් කලක් ගතවන විට උන්වහන්සේට එය නිරීක්ෂණය විය.

දිනක් උන්වහන්සේ ගෝල හිමිවරුන්ගෙන් මේ ගැන විමසුවේය.

“ගෝල හිමිවරුනි නුඹ වහන්සේලා පිණ්ඩපාතය පිළිගන්නා අවස්ථාවේ නුඹ වහන්සේලාගේ පාත්‍ර හිරු දෙසට ඔසවා ඒ දෙස බලා ඉන් අනතුරුව පිණ්ඩපාතය පිළිගන්නා අයුරක් මට නිරීක්ෂණය විය. ඒ මන්ද ?”

එහිදී ගෝල හිමිවරු මෙසේ පිළිතුරු දුන්නේය.

"ස්වාමීනි නුඹ වහන්සේ ද එසේ කරනු අපි දුටුවෙමු. ඔබ වහන්සේ ඉතා උගත්ය, නැණවත්ය, ශික්ෂාකාමීය. එබැවින් ඔබවහන්සේ විසින් පිළිපදින සම්ප්‍රදාය අපිද පිළිපදිමු. ස්වාමීනි, සිදුවිය යුත්තේ එය නොවේද ?"

එවිට මුවගට සිනහවක් නගා ගත් ගුරු හිමියන් මෙසේ පැවසීය.

"ගෝල හිමිවරුනි, මගේ පාත්‍රය ඉතා පැරැණි එකකි. එහි පත්ල දිරා ගොස් හිලක් සෑදී ඇත. දානය පිළිගැනීමට පෙර ඇඟිල්ලෙන් එය වසා නොගතහොත් පාත්‍රය තුළට දමන දානය ඉන් පිටතට වැගිරිය හැකි ය. එනිසා මම මගේ පාත්‍රය හිරු දෙසට අල්ලා නිවැරදිව පත්ලේ හිල් වී ඇති ස්ථානය සොයාගෙන එය මගේ ඇඟිල්ලකින් වසා ගනිමි. නුඹලාගේ පාත්‍රවලත් එවැනි හිල් තිබේද ?

ගෝල හිමිවරු බොහෝ ලැජ්ජාවට පත්වූහ.

අපගේ සමාජයේද මෙවැනි සම්ප්‍රදායන් රාශියක් පවතී. සමහර ඒවා අවශ්‍ය සම්ප්‍රදායන් වන අතර සමහරක් ඒවා අවශ්‍ය ඒවා නොවේ. යහපත් දේ පවත්වාගෙන යාම මෙන්ම පලක් නැති දේ අතහැර දැමීමද යහපත් සමාජයක් පවත්වාගෙන යෑමෙහිලා වැදගත් වේ. සමහර සම්ප්‍රදායන් ගැන එසේ පිළිපදින්නේ ඇයිදැයි විමසූ විට කිව හැකි එකම හේතුව තමන්ගේ වැඩිහිටියන් ගුරුවරුන් අනුගමනය කළ බැවින් තමන්ද ඒවා අනුගමනය කරන බව පමණකි. වැඩිහිටියන් ගුරුවරුන් ආදීන් අනුගමනය කළ පමණින් අවබෝදයෙන් තොරව එම සම්ප්‍රදායන් අප විසින්ද අනුගමනය කළ යුතුද?

සංස්කරණය:
තලතා ගුණසේකර

## පාඩම...

පාඩම් පාදන පාදම්
වැහි ගංගාවක්
තැනුනෙන් මිදුලේ
බාලේ පොත් පිටු
ඔරු ලෙස පැමිණේ...!

පාවෙන ඔරුවක්
ආපසු ගෙනෙමු
ඔරුවක් ලෙහලා
කොළයක් ගනිමු

එක එක ඔරුවට
ගෙවැදී බලමු
සාධුකාර දී
පිටු දිග අරිමූ....!

දහයෙන් දහයේ සතුටක සිරිය
නිවැරදිමුත් උත්තර තෙත බරිය
වැස්සට රේඛා බොඳ වෙන විදිහ
අනුත්තරා මිස්ගේ රතු හරිය

සියාතු සීයාගේ නව නිවහන
පිටුවක ඇඳ තිබුණේ කටු සටහන
මතක් වෙනවා ගම් උදාවේ පාදම
සීයා මලත් පාඩම නම් පාඩම

අසූ අටේ සිලබසයට පැමිණ
කුරුටු පුවක් සිද්ධිය දුක හිතෙන
කෙලින් කරලා ලේ ගෑවුන
ඔරුව දියත් කලා නැවතුන ඔරු ගමන

පියල් ද නැත්නම් නන්දද අවුල
සටහන් පැටවූ ඔරිගම් පහුර
කොතනද දැන් ගම්පෙරළියෙ යතුර
වික්‍රමසිංහට දෙනු බෑ මැඳුර...!

**ටිමිරාන් කීර්ති**

## අවිනිශ්චිතතාවක්...

ප්‍රේම කෝලහලය පැරදි කැරලිකරුවා දැන්
නිසොල්මන්
ජීවිතය හා එකඟ වනු මිස
තවත් අරගල ඔහුට තහනම්

බැටන් පොලු පහරකින් මියගිය
සටන් සගයෙකි මතක සැමරුම් අනුස්මරණය කළ
හැකිද පෙම මැරුණු වග නිශ්චිතව නැතිනම්

**තිළිණ ප්‍රියලාල් කොග්ගලගේ**

# පුළුන් හදවත...

යළි යළිදු
පාවෙන්න නොහැකි බව දැන දැනම
නිරාවරණය කළෙමි
මා පුළුන් හදවත
ඔබ වැස්සක්ව ඇදහැලෙන පෙදෙසට

**නජිලා අධිකාරි**

# නිහඬබව...

පර්වතයක් මෙන් හිස මත තෙරපෙන
මහා නිහඬ බවකි

විශාල ශාලාවක සෙනඟ එක්වරම නිහඬවීමකි
කලකට පසුව අහම්බෙන් හමුවී වචන සොයා ගත
නොහැකිව හිස්බැල්මෙන් බලා හිඳුමකි

ඇඬීමට අවැසි සිතුවිලිවලට දෑස් නොමැත
කෑ ගැසීමට අවැසි සිතුවිලිවලට මුවක් නොමැත
මහා අමනුෂ්‍ය නිහඬ බවකි මෙය

ඔබ තබා ගිය
ගී කියන ඔබේ අනුරුව ද
දැන් නිහඬය
මගේ නොරුස්සන ඇස් මඟ හරිමින්
ඈත බලාගෙනය

කාමරයේ කොණක යෝධයෙක්
වියරුවෙන්

පොත්පත් විසිකරමින්ද
පුටු මේස පොළොවේ ගසමින්ද
කතිර මැස්මෙන් වසා දැමූ මුව විවර කර ගැනීමට
වෙර දරයි

අවරදිග අහසින් මතු වූ කළු කුහරයක්
සියලු දෑ ගිලගනිමින් සිටියි
පෑන් තුඩකින් බලෙන් එළියට පනින අකුරු
කැබලිතිවලට බිඳී කොළයට වැටෙයි
මේ අතර මගේ හිතේ ලාබාල කොලුවෙක්
අඩවන් දොරෙන් එන අඩි හඬක් වෙනුවෙන්
තවමත් බලා හිඳියි

**තරින්ද්‍ර ගලහේන**

# පිළිම පිටුපස...

පිළිම පිටුපස
ආයුධ මුවහත් කෙරෙයි

පිළිම හිස
පසුපසට නොහැරෙන බව
නිසැකයි

ඉතින් නොබියව
ආයුධ මුවහත් කෙරෙයි

ඒ ආයුධ අලුත් නෑ
ශිෂ්ටාචාර ගණන් පරණයි
මලකඩ ගඳ දසත විසිරෙයි
ඔක්කාරයි

අලුත් ලේ ගෑවෙන්න පෙර
දැනටමත් පරණ ලේ
උන්ගෙ අත්වල ගෑවෙයි

ඉතිහාසයේ තුවාලය
ආයෙ ආයෙත් පාරයි

තව තව සිද්ධස්ථාන
අලුතින් ඉදිවෙයි
තව තව පරණ ආයුද
අලුතින් මුවහත් කෙරෙයි

**ළහිරු කරුණාරත්න**

# හිඳුණු දිය ඇල්ලක් පාමුල මැණික් පතලක්

දාහතෙන් පහළ
වොලිබෝල් පිළේ නායක
රුවන්සිරි
කමත දෙස සිට
එමින් සිටියාලු නිවසට
අසූ නමයේ සවසක...

අතිනත මාරු කර කර
නටවමින් වොලිබෝලය..

ගොම්මන් මඳඳුර දැදුරු කර
එළි තීරු විදිමින
නිස්සද්ද ගමේ
කන් අඩි දෙදරවා
රිය පෙළක් කඩා වැදුණේ  එවිටමලු...

අඬන ඇල්ලයි නම් ලද
පොඩි දිය ඇල්ල...
මුළු ගම පෙනෙන කඳු සිරසකින්
ඇඬුම අරඹන...

ගල් පර මත හිස ගසමින් ද
උස් නුස් තුරුවිටප මත
කඳුළු ඉසිමින්ද
බලා සිටියලු
එදෙස...

බලුරැළ ද බුරා හැලෙමින්
අනතුරු ඇඟෙවු මුත්...

"උන් සොයන්නේ කවුද
උන් සොයන්නේ මාද
මා සොයන්නේ මන්ද

යම් ගෝනිබිල්ලෙකු
හිස වනාවිද
නැතිද ???.."

★★★★★★★★★★★★★★★★

ඇල්ල දෙස යන මගෙහි
කටුපඳුරක
හුළං ගිය වොලිබෝලය
පැටැලී තිබී හමුවිය..

ඇල්ල පාමුල
කබොක් ගල් ගහණ
ගැඹුරු  දිය වලෙහි
ඔහු සෙවූ ගම්මු
හිස් අතින් ගියාහුය...

එනමැත්තෙකු
අපි රැගෙන නාවෙමුයි
කඳවුරෙන් කීවේලු....

★★★★★★★★★★★★★★★

තිස්වසකට පසුව
මා එහි එද්දී
අතුරුදන් වූ ඇල්ල පාමුල
දියසීරා මැකුණු
ගල්පර පාරමින්
පතල් හාරන කොල්ලන්
සොයාගනු ඇතිද
යම් මැණිකක්...

**පද්මිණී කුලරත්න**

# පාර දිගේ
(වැවරවුමෙන් එහා)

"රාජා හෝ මා හෝ ගංගා හෝ" කියාගෙනම එකෙක් උදේ පාන්දරම, (පැරණි) වැවරවුමේ 'පෝරිසාද' නම් රියදුරු පදවන බස් එක ඉස්සරහට පැනපි. දන්න සෙල්ලම් ඔක්කොම දාලා පෝරිසාද බස් එක නවත්තා ගත්තා.

"අඩෝ මිස්ටර්, මැරෙන්න හදනවද?" පෝරිසාදට පැරණි පුරුද්දට වගේ 'අඩෝ' කියවුණාට මේක අලුත් ආණ්ඩුවක් කියලා මතක් වුණාම ඉබේටම 'මිස්ටර්' කියවුණා.

"නෑ.....මලේ, මම මේ 2029 දී රජගෙට යන ගමන්."

"ජීවිතේ පරදුවට තියලා තමුන්නැහේ මේ නැඟලා තියෙන්නේ වැරැදි බස් එකකට. මේක මේ නොනවතින අනාගතය. ඔහෙට වැරැදිලා. මේක දුරගමන් සේවා. බැහැලා මන්දගාමිද බඩගාමිද එකක එනවා."

"මට නම් ඉතින් ඉන්දියාවේ බෙංගාල බොක්ක ආසන්නයට ගියාම ඒ දුර හොඳටෝම.....ඇති."

"මහත්තයා කොහෙට ගියාම අපිට මොකද? අපිට පමාවෙන්න බෑ. අපි ගියා." පෝරිසාද බස් රථය රේස් කළා.

"හරි හරි ලොක්කා මම යන්නේ ඔඩිෂා ප්‍රාන්තයට මෝදිගේ නිදහස් උත්සවේටත් වඩා ලොකු...... එකකට. මම ටුවෙන්ටි ටුවෙන්ටි නයින් ප්‍රසිඩන්ට්. "

"ඔය අර බෙංගාල බොක්කේ ඔඩිෂාවල ප්‍රයිවට් ඉස්කෝලෙද?"

"මෝදිගේ එක වගේද මේක. මේ සුවිශේෂී ආරාධනාවක්."

"කොහොමෙන් කොහොම හරි ඉතින් අන්තිමට පාරටම

වැටුනා නේද දොරේ.” කියලා රියදුරු පෝරිසාද නැවත රථය රේස් කළා.

“මම හිතන්නේ ටුවෙන්ටි ටුවෙන්ටි නයින් වෙනකම්ම තව ආරාධනා එයි මෙහෙම.”

“එහෙමද හොඳ ලොක්කා ඒ විදියටම දිගටම හිතන් ඉන්න. සුබගමන්”

පෝරිසාද පරක්කු වුණ කාලයත් අල්ලන්න ඉක්මනට පිටත් වුණා.

“රන් පොකුනෙන් දිය නාගෙන එන්නේ

රන් පොකුනෙන් දිය නාගෙන එන්නේ

ආ ආ ආ ආ ආ ආ ආ ආ”

බස් එකට තව පිස්සෙක් පැනපි.

“දඩාවතේ යන බල්ලන්ට බ්‍රේක් ගහලා ඉවරයක් නෑ.” කියාගෙනම පෝරිසාද අමාරුවෙන් බස් එක නවත්තා ගත්තා.

“කොහොමත් නාගන්න එකනේ නාගන්නව නං නාගන්නවා. අපිට කරදර නොකර” රියදුරු පෝරිසාද ජනලෙන් ඔළුව එළියට දාලා බස් එකට යටවෙන්න ගිය එකාට සද්දයක් දැම්මා.

“හරියටම හරි උත්කෘෂ්ඨ, කුක්කුෂ්ඨ, කණිෂ්ඨ, ජ්‍යේෂ්ඨ, අරිෂ්ඨ කතාවක් ඒක. මොකද? මම රජපිහිල්ලට නාන්න ගියා. ඔටුන්න ඔළුවට වැටෙනකම් බෙල්ල පහත් කරගෙන අල්ලගෙන හිටියා. වැඩේ කියන්නේ යටත් වැසියනි, එකපාරම වතුර බොරවුණා. වතුර නෙවෙයි ගල් ආවේ.”

“ඔයා ඉස්සරහිනුයි පස්සෙනුයි දෙකෙන්ම කතා කරනකොට කොහොමත් මිනිස්සු ගල් ගහනවා. එක වෙලාවක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අසභ්‍යයි කියනවා. ආපහු ඒවා පමාවෙනවා කියනවා. අපි එක පයින් කැමැතියි කියනවා. වේගේ වැඩ කරන්න කියනවා. මොනවද මේ දිව හැරෙන හැරෙන පැත්තේ කතා.”

“ගල් ගැහුවා නෙවෙයි. මඩ කාගෙන ගල්මයි වතුරේ පෙරලි පෙරලි ආවේ.”

“හොඳ වෙලාවට පැලෙන්න ඔළුවක් නැති එක හොඳට ගියා.. එතකොට ආවේ බේගල්ද මොංගල්ද?”

“නෑ නෑ දිට්වා. දිට්වා..... දිට්වා ආව ගමන් මම රට වටම ගිනිතියන් දිව්වා දිව්වා දිව්වා. කොහෙද මිත්‍රවරුනි. එකෙක් රැවටුනේ නෑ. එකෙක්වත්. මොනවා වුණත් ටුවෙන්ටි ටුවෙන්ටි නයින් ප්‍රසිඩන්ට් මම”

“ එතකොට ඉන්දියාවේ ගිය නාමල් එයත් කියනවා ටුවෙන්ටි ටුවෙන්ටි නයින් එයත් එහෙමලු”

“ආ එහෙමද එයා ආසා. හා....කෝ...., එයා එහේ ජනපති. මම මෙහේ ජනපති.”

“යකඩෝ. බල්ලෙක් පාරපැන්නත් වාහනේ බ්‍රේක් කරා ගියා. මේක එහෙමය, වදයක්ම වුණානේ.

තමුසෙගේ කියවිල්ල මිස වැඩ නැත."

"මට බල්ලෙක් කියලද කියන්නේ. මම ජනාධිපති පියානෝගේ අනාථ වූ පුතානෝ. මම මේ අර මාරාන්තික උපවාසෙට පෙට්‍රල් ගහලා එන ගමන්."

"පෙට්‍රල් විතරද ගැහුවේ. ගිනිතිබ්බේ නැද්ද?"

"මම ලෙයින් අත්සන් කරලා දුන්නේ. මම ජනාධිපති වුණාම විභාග නොලියාම ගන්නවා කියලා."

"එතකන් ලොක්කා උපවාසේ නොකා නොබී එතනම තියෙන්න ඕනද"

"එහ්....හෙනං රටපුරාම හන්දියක් හන්දියක් ගානේ අට්ටාල ගහන්න ඕන."

"ඉතිං ඉතී......න්"

"මම අට්ටාලයක් අට්ටාලයක් ගානේ ගිහින් ටුවෙන්ටි ටුවෙන්ටි නයින් වෙනකම් මගේම රක්තවර්ණ රුධිරයෙන් මම ම පොරොන්දු පත්‍ර අත්සන් කරනවා."

"හන්දිගානේ ඇට සැකිළි පිරුණු අට්ටාලයි සම්මතේකට ජයගන්න බය පක්ෂ කාර්යාලයේ ලේ වේලුණු කට්ටක් ගත්තු පක්ෂ නායකතුමෙකුගේ ඇට සැකිල්ලයි විතරක් ඉතිරි වෙයි."

"එහෙම වෙන්නේ කොහොමද මම තමයි ටුවෙන්ටි ටුවෙන්ටි නයින් නියත ජනපති."

"නියත සිහින ජනපති සර්, අර එන්නේ මානසික රෝහලේ වාහනේ නේද?"

මෑන් වටපිට බැලුවා. පැන්නා පාරෙන් කටුබැද්දට. දිව්වා කටු ඇනි ඇනී

"මම නියත ජනපති මම නියත ජනපති මම නියත ජනපති"







# එක්ව ගොඩනගන මග

දිට්වා සුළි කුණාටුව මෙම භූමි ප්‍රදේශය හරහා පැමිණිය අවස්ථාවේ, මෙම ජනතාව එකිනෙකාට සම්බන්ධ කරමින් තිබූ මාර්ගය පොළොව තුළටම කඩා වැටී සැඟව ගොස් තිබිණි. දිනපතා ගමන් කළ මාර්ගය හදිසියේම බාධාවක් බවට පත් වූයේ සොබාදහමේ අනපේක්ෂිත හැකියාව පෙන්වා දෙමිනි.

එහෙත් පරාජය බාර ගැනීමට සූදානම් නොමැති මිනිස්සු මෙම කඩා වැටුණු භූමිය හරහා සකස් කරගත් අතුරු මාර්ගයක් ඔස්සේ සෙමින්, එහෙත් ඉදිරියටම ගමන් කරති. කඩා වැටුණු මාර්ගය විශ්වාසයෙන්, ඉවසීමෙන් සහ එකමුතුවෙන් තාවකාලික පාලමක් බවට පත් වෙයි. යුද්ධ, ස්වභාවික විපත් සහ ආර්ථික අභියෝග වැනි දුෂ්කරතා මැද ලෝකය පැවතියද, මිනිස්සු තම ජීවිත ඉදිරියට ගමන් කරවන මාර්ගයක් සොයා ගනිති. සමාජය හැඩ ගැසෙයි; ආයතන සහය දෙයි; මිනිස්සු සාමූහිකව ඉදිරියට ගමන් කරති.

මාර්ගය අවසන් වන තැන, මිනිස් එකමුතුව නව මාර්ගයක් ගොඩනගයි.

ඡායාරූපය - එච්.එල්. තනුර